# දෙසතිය

පුවත් සඟරාව

2017 පෙබරවාරි



## අපට දැනෙන නිදහස








තිස් වසරකට පසුව ලංකාවේ
ඉදිවෙන විශාලතම ජලාශය වන්නේ
මොරගහකන්ද යි. එහි ජලය පිරවීමේ
ඓතිහාසික කාර්යය නොබෝදා සිදු
වුණේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන
මහතා අතින්.








ලෝක ආර්ථික සමුළුව නොබෝදා පැවැත්වුණේ ස්විට්සර්ලන්තයේ ඩාවෝස් නුවරදී. අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා ඇතුළු නියෝජිත කණ්ඩායමක් මේ සඳහා සහභාගී වූ අතර ශ්‍රී ලංකාවේ ඉදිරි සංවර්ධනය සඳහා ජාත්‍යන්තර සහයෝගය ලබාගැනීමට අවශ්‍ය කරුණු රැසක් පිළිබඳව ද මෙහිදී සාකච්ඡාවට ලක්වුණා.



## කවරයේ කතාව 28











ට්‍රම්ප් යන්නේ කොයි පාරේ







04

දේශ චිත්ති

පියබඳ

පරිසරය

විදේශ චිත්ති

සිනමාව

නාට්‍ය


එකුන් සතළිස් විය සැපිරූ

දෙසතිය

1978 - 2017


09 සහල් මිලට බාලගිරි ද?

11 ඉන්දියානු හීතිකාව සහ
1990 ගිලන්රථ සේවය


13 ලක්මව බැබළූ සිත සවි සිරිකත

21 කළ කළ දේ පල පල දේ

25 ලොකු අයට යටවෙන පොඩි අය

54 හැට පැන්නත් වටින වැඩක්

55 නැතුව බැරි මිනිහෙක්




## ගිවිසුම් විග්‍රහාත්මක වුණා නම් අගෙයි

සමස්තයක් ලෙස ගත් විට 2016 දෙසතිය දෙසැම්බර් කලාපයේ වැදගත් ලිපි ගොඩක් පළ වී තිබුණා. කවරයේ කතාවට විෂය වූ තේමාවත් වැදගත්. එහෙත් එක් එක් වෙළෙඳ ආයතන පිළිබඳ විස්තරාත්මක තොරතුරුවලට වඩා "වෙළෙඳ ගිවිසුම්" පිළිබඳ විස්තරාත්මක විග්‍රහයක් කවරයේ කතාවෙන් ඉදිරිපත් කළා නම් දෙසතිය කලාපයේ ශාස්ත්‍රීය වටිනාකම තවත් වැඩිවනු ඇතැයි යන්නයි මගේ අදහස.

සෙනුර ලක්මාල්
කළුතර.

## කැස්ට්‍රෝ ගැන කවරයක්

ජාත්‍යන්තර දේශපාලන වේදිකාවේ ප්‍රබල චරිතයක් ලෙස කියුබාවේ ෆිදෙල් කැස්ට්‍රෝ හැඳින්විය හැකි යි. කැස්ට්‍රෝ කියුබානු ජනතාවගේ අසහාය වීරයා ය. එසේ ම ලෝකයේ බොහෝ රටවල දේශපාලන කතිකාව තුළ කැස්ට්‍රෝ චරිතය පරමාදර්ශී චරිතයක් වුණා. එබැවින් කියුබාවට පිටස්තරව බොහෝ රටවල ද ඔහු නිරන්තරයෙන් කතාබහට ලක් වූ බව රහසක් නොවෙයි.

පසුගිය දෙසතිය දෙසැම්බර් කලාපය ෆිදෙල් කැස්ට්‍රෝ පිළිබඳ ව විවරණයක් ඉදිරිපත් කර තිබීම ප්‍රශංසනීය යි. එසේ වුවත් මෙවැනි දැවැන්ත දේශපාලන චරිතයක් පිළිබඳ ව මෙවැනි විශේෂාංගයකට වඩා දිගු විස්තර සහිත කවරයේ කතාවක් පළ කිරීමට කටයුතු කරන්නේ නම් බොහෝ දෙනකු එය අගයනු ඇති බව මගේ අදහස යි. තවත් මෙවැනි ම ජාත්‍යන්තර තලයේ කතාබහට ලක් වූ නායකයන් පිළිබඳ ව අවධානය යොමු කර විශේෂාංග පළ කිරීම ද ඉතා වැදගත්.

චන්ද්‍රා බමුණු ආරච්චි
කඳුරුවෙල.

## සමාගම් ගැනත් කතා කරන්න

විවිධ වූ අසීරුතා මධ්‍යයේ ශ්‍රී ලංකාව සංවර්ධනයේ ඉලක්ක වෙත ළඟා වෙමින් සිටී. විශේෂයෙන් ජාතික ආර්ථිකයේ සංවර්ධනයට රට තුළ ක්‍රියාත්මක විවිධ වූ සමාගම් මඟින් ඉටුවන කාර්යභාරය වැදගත් වෙයි. එසේ ම එම සමාගම් විසින් ඉටු කරන කාර්යය රටේ ඉදිරි ගමනට තීරණාත්මක සාධකයක් ලෙස ද හැඳින්විය හැකි යි.

පසුගිය දෙසැම්බර් මස 'දෙසතිය' සඟරාවේ 'ලොව දිනූ සමාගම්' නමින් පළ කොට තිබූ විශේෂාංගය දැනුවත් වීම සඳහා අනගි මාතෘකාවකි. විශේෂයෙන් අධ්‍යාපනය ලබන දරුවන්ගේ ව්‍යාපාරික ක්ෂේත්‍රය පිළිබඳ කරුණු විමර්ශනය කරන අයටත්, සමස්තයක් ලෙස පොදු පාඨකයාටත් මෙවැනි මාතෘකා පිළිබඳ දැනුවත් වීම ඉතා වැදගත් වේ. එක් කලාපයකට පමණක් සීමා නොවී ඉද හිට හෝ 'දෙසතිය' විශේෂාංග වලින් තවත් මෙවැනි සමාගම් පිළිබඳවත් ඒවායේ කාර්යභාරය පිළිබඳවත් දැනුවත් කිරීමට ක්‍රියාකරන්නේ නම් ඉතා අගනා බව මගේ පෞද්ගලික අදහස යි.

වින්සන්ට් පෙරේරා
පොලොන්නරුව.

## ප්‍රචාරයක් දී බෙදාහැරීම පුළුල් කරන්න

දෙසතිය සඟරාව අධ්‍යාපනය හදාරන සිසුන්ට මෙන් ම, නොයෙකුත් විභාග සඳහා දැනුම ලබාගත හැකි හොඳම මාසික ප්‍රකාශනයකි. එහෙත් කනගාටුවට කරුණ නම් එම සඟරාව ලබාගැනීමට ඇති අපහසුතාව යි. ඒ නිසා හොඳ ප්‍රචාරයක් ලබා දී බෙදාහැරීම පුළුල් කරන්නේ නම් දෙසතිය සඟරාවේ පාඨක පිරිස ද වැඩි වී අලෙවිය ද වැඩි කරගැනීමට හැකි වේ යැයි යන්න මගේ පෞද්ගලික අදහස යි.

වරුණ පබෝද
හොරණ.

දෙසතිය සඟරා දායකත්වය

දෙසතිය

දෙසතිය සඟරා දායකත්ව වාර්ෂික / අර්ධ වාර්ෂික ලබා ගැනීමට කැමැත්තෙමි. ඒ සඳහා
රු.768.00/ රු.384.00 / රු. 192.00 මුදල ........................ අංක හා ........................
දින දරන චෙක්පත/ මුදල් ඇණවුම එවමි.

චෙක්පත්/ මුදල් ඇණවුම් " ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් " නමට ලියා, ගෙවන කාර්යාලය පොල්හේන්ගොඩ, උප තැපැල් කාර්යාලය, කොළඹ 05 ලෙස සඳහන් කළ යුතුය. එවිය යුතු ලිපිනය:
දෙසතිය, බෙදාහැරීම් කළමනාකරු, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,
163, පොල්හේන්ගොඩ,
කොළඹ 05.

සඟරා ලැබිය යුතු ලිපිනය :
නම : ........................
ලිපිනය : ........................
........................
........................
........................
ඔබගේ දුරකතන අංකය : ........................

## දෙසතිය

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,**
**163, කිරුළපන ඇවනිව්,**
**පොල්හේන්ගොඩ, කොළඹ 05**
**සංස්කාරක මණ්ඩලය**
**දු. අ. 011 - 2513757**
**බෙදාහැරීමේ අංශය**
**දු. අ.011 - 2515759/ දිගුව - 232**

**වෙළුම 40, කළාපය 02**
**2017 පෙබරවාරි**

උපදේශක සංස්කාරක
ආචාර්ය රංග කලංසූරිය

සංස්කාරක
සුමිත් මායාදුන්නේ

නියෝජ්‍ය සංස්කාරක
ආනන්ද ජයසිංහ

සහකාර සංස්කාරකවරුන්
ඩොනල්ඩ් සේනාධීර
නිලුපුල් ප්‍රියංකර පෙරේරා

සංස්කරණ සහාය
ධර්මදාස ගමගේ

රූ රටා හා ඡායාරූප සංස්කාරක
කවර නිර්මාණය හා සංකල්පය
සංජීව පෙත්තාවඩු

විශේෂාංග ලේඛකයෝ
චමිමි ජයනෙත්ති
ශ්‍යාමා සන්ධ්‍යානායකගේ
පී. ජී. මාලා මල්කාන්ති
සංජීව පෙත්තාවඩු
චාමලී රාජකරුණා

ප්‍රවෘත්ති නිලධාරි
නිල්මිණි ප්‍රනාන්දු

සෝදුපත් නිරවද්‍යතා විමසුම
ඩොනල්ඩ් සේනාධීර
පී. ජී. මාලා මල්කාන්ති

කළමනාකරණ සහාය
චන්ද්‍රිකා ගුණසේකර

ඡායාරූප උපදේශක
සුදත් සිල්වා

ඡායාරූප ශිල්පීන්
සරත් ධර්මසිරි
පී. ඩී. රංජිත්
එල්. රෝහණ
යමුනි රශ්මිකා
ලක්සිරි සුභාෂණ අල්විස්

බෙදාහැරීමේ කළමනාකරු
ලාල් සූරියආරච්චි

මුද්‍රණය
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

බෙදාහැරීම
සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම


# රත්නදීපයේ අපට දැනෙන නිදහස

යටත් විජිතවාදයේ අඳුරු කඩතිර බිඳ දමමින් රත්නදීපයට නිදහස උරුම වී මේ ගත වන්නේ හැට නව වැනි වසර. නිදහසේ උදානය සමඟ මෙරට ඇති වූ ජාතික නවෝදය ආර්ථික, දේශපාලන, සමාජයීය මෙන් ම සංස්කෘතික අංශවල ගත වූ කාලය තුළ පරිවර්තනයකට තුඩු දුන්නේ පෙරළිකාර අයුරින්. දශක හතක් ගත වුවත් උරුම වූ නිදහසේ අප ලබා ගත් ජයග්‍රහණ වගේ ම තවමත් ජය කණුව කරා ළඟා වීමට නොහැකි වූ ඉලක්ක තිබෙනවා. ගත වූ නිදහස් කාලයෙන් වසර 30ක් ම ජනවාර්ගික අර්බුදයක අප පැටලී සිටියා. ඊට හේතු වූ කාරණා පිළිබඳ ගැඹුරින් විමර්ශනයක යෙදී අනාගතයේ එවැනි අර්බුද හට නොගැනීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම යි වැදගත් වන්නේ. ඒ සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වන්නේ සංහිඳියාව සමඟ බිහි වුණු සමානාත්මතා සමාජයක්.

තවමත් අප ජාතික ප්‍රතිපත්තියක් හරිහැටි නිර්මාණය කරගන්නට සමත් වී නැහැ. නිසි ආර්ථික ප්‍රතිපත්තියක්, අධ්‍යාපන ප්‍රතිපත්තියක්, කෘෂිකර්ම ප්‍රතිපත්තියක්, තාර්මික හා විද්‍යාත්මක ප්‍රතිපත්තියක් ආදී වශයෙන් අප සතුව රටක් ලෙස දියුණු වීමේ ඒ ඒ ක්ෂේත්‍රවල ජාතික ප්‍රතිපත්තියක් නිර්මාණය කර ගැනීමට හැකියාව ලැබී නැහැ. වත්මන් යහපාලන ආණ්ඩුව එම කර්තව්‍යය සාක්ෂාත් කර ගැනීමට විවිධාකාර වැඩපිළිවෙළ දියත් කරමින් සිටීම වැදගත් හා අත්‍යවශ්‍ය කරුණක්. ආණ්ඩුවේ ඉලක්කය බලගතු ශ්‍රී ලංකාවක් බිහි කිරීම. මේ සඳහා ආර්ථික වැඩපිළිවෙළක් ද ප්‍රකාශිත යි.

මෙවැනි ප්‍රවණතාවකට මුලපුරා ඇති මෙවැනි යුගයක ලොව ආර්ථික හයිය ඇති රටවල් ඉදිරියේ දණින් නොවැටී සිටින්නට හැකි ආර්ථිකයක් ගොඩනඟා සැබෑ ආර්ථික නිදහසක් භුක්ති විඳීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීමට අවශ්‍ය යි. ඒ සඳහා මුළු මහත් රට වැසියන්ගේ ම දේශපාලන නායකත්වය ද ඇතුළු ව කැපවීම අත්‍යවශ්‍ය කරුණක්.

නිදහස ලබා ගැනීමේදී එවකට නායකයන් ගෙන ගිය අරගලය මෙහෙය වූයේ එක් සිත් ව එකමුතුව යි. එහිදී ජාති, ආගම්, භේදයකින් තොර ව එක ම මවකගේ ශ්‍රී ලාංකික දරුවන් ලෙස යි කටයුතු කළේ. නිදහස ලබා ගැනීමේදී ජාතීන් අතර එකමුතුවක් නොතිබුණා නම් නිදහස ලැබීම තවත් ප්‍රමාද වීමට පවා ඉඩකඩ තිබුණා. එසේත් නොමැති ව ජනවාර්ගික බෙදීමක් ඉස්මතු වී තිබුණා නම් ඉන්දියාවට සිදු කළාක් මෙන් බ්‍රිතාන්‍යයන් විසින් රට දෙකඩ කර නිදහස ලබා දීමට ද ඉඩකඩ තිබුණා. එයින් ගම්‍ය වන්නේ රටක් ලෙස නැඟීසිටීමට නම් බහුජාතික සමාජයකදී එකමුතුකම අත්‍යවශ්‍ය සාධකයක් වන බව යි.

අප මෙවර කවරයේ කතාවෙන් ද විමර්ශනය කළේ 69 වසරක් ගෙවුණු වර්තමානයේ රටේ සාමාන්‍ය ජනතාවට නිදහස පිළිබඳ හැඟෙන දැනෙන දේ කුමක් ද යන්න යි. මෙහිදී බොහෝ දෙනකු පවසා සිටියේ රටක් ලෙස සමෘද්ධිමත් වීමට නම් අතීතයේ මෙන් ජාතීන් අතර එකමුතුව අත්‍යවශ්‍ය සාධකයක් වන බව. ශ්‍රී ලංකාව නිදහස ලබන විට මැලේසියාව, කොරියාව, සිංගප්පූරුව වැනි රටවල් සිටියේ අපට වඩා ගව් ගණනාවක් ඈතින්. එහෙත් වර්තමානයේ අප සිටින්නේ ඒ රටවලට පසුපසින්. ඔවුන් සියලු වාද භේද දුරලා යම් ඉලක්කයක් වෙනුවෙන් කැප වීමේ ප්‍රතිඵලය වර්තමානයේ අත් විඳින්නේ තම රට සමෘද්ධිමත් කර ගැනීමෙන්. ඒ සඳහා දැන්වත් අප පියවරගත යුතු වන්නේ ඊළඟ පරම්පරාව වත් දියුණු රටක ජීවත් කරවීමට යි.

සංස්කාරක

# එකුන් සතළිස් විය සැපිරූ

# දෙසතිය

## 1978 - 2017



දෙසතිය කර්තෘ මණ්ඩලයේ සේවය කරන පැරණිතම සාමාජික හිටපු නියෝජ්‍ය සංස්කාරක

**ධර්මදාස ගමගේ**

"දෙසතිය" ජන්ම ලාභය ලැබුවේ ආචාර්ය සරත් අමුණුගම මැතිතුමාගේ සිතෙහි පිළිසිඳ ගත් සංකල්පයක් විකසිත වීමෙන්. එකල රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරයා වුණේ ඔහු. තරුණ සිවිල් සේවා නිලධාරියකු වූ ඔහුගේ නාම ප්‍රචලිත ව තුබුණේ දක්ෂ පරිපාලන නිලධාරියකු හැටියට පමණක් නො ව කලාකාමියකු ද හැටියට. ඉංග්‍රීසි සහ සිංහල පුවත්පත්වලට එකල විද්වත් කලා විචාරකයකු හැටියට ඔහුගේ දායකත්වය ලැබුණේ නිබඳ ව ම. මේ පසුබිම යි, දෙසතිය පිළිබඳ සංකල්පය පිළිසිඳ ගන්නට හේතු වන්නට ඇත්තේ.

ඒ අවධියේ ඉංග්‍රීසි, සිංහල දෙබසින් ම නිර්මාණකරණයෙහි නිරත කලා විචාරකයකු මෙන් ම වෙළෙඳ ප්‍රචාරණ කලාවේ ප්‍රවීණයකු ද වූ සිරිල් බී. පෙරේරා වෙත යි සංස්කරණ වගකීම භාර කැරුණේ. මගේ මතකය නිවැරැදි නම් නියෝජ්‍ය සංස්කාරක ලෙස සම්බන්ධ වුණේ ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ තවත් ප්‍රවීණයකු වූ ඩී. බී. වර්ණසිරි. මේ දෙපළගේ සහායට නැඟී එන තරුණ මාධ්‍යවේදීන් ගණනාවක් ම එක් වූ අතර වැඩි බරක් කරට ගෙන ප්‍රධාන භූමිකාවක් ඉටු කළේ ගාමිණී විජේතුංග බව යි නිර්ලෝභී ව සඳහන් කළ යුත්තේ. දෙසතිය රූව, ගුණ සුවඳින් යුතු කුසුමක් සේ පාඨක සිත් ආකර්ෂණය කරවීමට ඔහු දැක්වූ සමත්කම අසමසම යි.




1978 පෙබරවාරි 4 වැනිදා දෙසතිය මංගල කලාපය

ලියන බසින් බැහැර ව, වහරන බස් රටාවට යොමු වෙමින් ඔහු හඳුන්වා දුන් සරල, සුගම, නිර්මාණාත්මක රචනා ශෛලිය දෙසතියට එක් කළේ නැවුම් මුහුණුවරක්. කිසියම් විෂයයක් ගැඹුරින් ම විග්‍රහ කරමින් ඉතා සරල ලෙස පැහැදිලි කර ලිවීමට ඒ බස් වහර යොදා ගැනීමේදී ඔහු දැක්වූයේ හරිම හපන්කමක්.

කාලයාගේ ඇවෑමෙන් ගාමිණී සංස්කාරක පදවියට පත් වූ පසු දෙසතිය හැඩ රුවින් පමණක් නො ව අන්තර්ගතයෙන් ද නව තවත් නැංවුණේ ඉහළට. දෙසතිය පුවත් සඟරාවක් ලෙස ආරම්භ කිරීමේ අරමුණ අනුව යමින් පටු දේශපාලන ආකල්පවලින් තොර ව කුමන ප්‍රවෘත්තියකට අදාළ ව වුව ද හැම අංශයක් ම ගැඹුරින් විග්‍රහ කොට පළ කිරීම යි පිළිවෙත වුණේ. "රාජපක්ෂ වලව්වෙන් බිහි වුණත් රජයේ හොරණෑවක් නොවූ" යන පාඨය දෙසතිය අග පිටුවේ ගාමිණී විසින් ම සටහන් කරන ලද්දේ ඒ නිසා.

ආරම්භක කලාපයේ සිට දිගු කලක් ම වැකිය නිමැවුණේ ප්‍රධාන සංස්කාරක වූ සරත් අමුණුගම මැතිතුමා අතින් ම. මංගල කලාපයේ ඔහු ලියූ වැකියෙන් දෙසතිය ආරම්භ කිරීමේ අරමුණ ගැන සඳහන් වුණේ "ජන සන්නිවේදනයේ නව අත්හදාබැලීමක්" යන සිරස්තලය යටතේ යි. "දෙසතිය පුවත්පතක් නොවේ. පුවත්පතක දක්නට ලැබෙන ලඝු ලඝියේ සකස් කරන

ලද ප්‍රවෘත්ති මෙහි නොමැත. එහෙත් පුවත් රැස්කර, විස්තර කර ප්‍රවීණයන් ලවා විග්‍රහ කර ඔබ වෙත ඉදිරිපත් කිරීමට අපි බලාපොරොත්තු වෙමු. අපි ප්‍රවෘත්ති මෙන්ම ප්‍රවෘත්තිවලට පසුබිම් වූ කරුණු ද ඉදිරිපත් කිරීමට ඉටාගෙන සිටිමු."

ගාමිණී විජේතුංග සමයේදී ම දෙසතියට සම්බන්ධ වූ, දැඩි භාෂා ප්‍රේමියකු වූ වින්සන්ට් පෙරියප්පෙරුම ඉටු කළ මෙහෙවර අපරිත් තදින් ම කැපී පෙනෙන්නේ කවුරුන් විසින් ලියන ලද්දක් වුව ද හැම ලිපියක් ම පළ වීමට පෙර අට අනූවක් රෝග, නව අනූවක් ව්‍යාධිවලින් තොර නීරෝගී, කඩවසම් හා හුරුබුහුටි බවට පත් කිරීමට. ඇස් දුර්වල වන තෙක් ස්වේච්ඡාවෙන් ම දරන ලද වෙහෙස. එමෙන් ම ඔහු ආධුනිකයන් දෙසතියට සම්බන්ධ කර ගෙන ඔවුන්ට සියලු ගුරුහරුකම් ලබා දී ඉදිරියට යාමට ධෛර්යය දුන් අයුරු සාමාන්‍යයෙන් ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ විරල කාරණයක්. එසේ ගුරුහරුකම් ලද ආධුනිකයන් මේ වන විට දරන්නේ ඉතා ඉහළ මට්ටමේ පදවි තානාන්තර. ඒ අයුරින් දෙසතිය නිල නො ලත් මාධ්‍ය සරසවියක් බවට යි, ඒ දිනවල පත් ව තුබුණේ. මෑත ඉතිහාසයේ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් පදවියට ද පත් වූ මහාචාර්ය ආරියරත්න ඇතුගල කැලණි සරසවියේ උගන්නා සමයේ "දෙසතිය සරසවියේ" ද පහස ලැබූ බව ඔහුට ගෞරවය ද පිණිස සඳහන් කළ යුත්තක්.

රජයේ දෙපාර්තමේන්තුවකින් පළ වන, නොමිලයේ බෙදා නොහරින, මිලක් නියම කර අලෙවි කරන මේ ආකාරයේ ප්‍රකාශනයක් මේ සා දිගු කලක් පවත්වා ගෙන ඒම එක් අතකින් වාර්තාවක්. මෙය ලාබ ලැබීමේ චේතනාවෙන් ආරම්භ කරන ලද වාණිජ ව්‍යාපාරයක් නොවූණ ද, නොමිලයේ බෙදා හරින ප්‍රකාශන සඳහා අති විශාල මුදල් සම්භාරයන් වැය වෙද්දී දෙසතිය අලෙවියෙන් කිසියම් මුදලක් රජයට එකතු වීම වැදගත් කාරණයක්.

දෙසතිය කෙරෙහි මුල් හා මැදි අවධියේ විශාල පාඨක ආකර්ෂණයක් තුබුණු බව නිරහංකාර ව පිළිගත යුත්තක්. මේ වන විට දෙසතිය ඇතැම් කලාප සොයා ගෙන දෙසතිය වෙත පැමිණෙන තරුණ තරුණියන් සහ ඇතැම් විට මැදි වියේ පුද්ගලයන් පවා ප්‍රකාශ කරන්නේ තමන් දෙසතිය කියවීමට පටන් ගත්තේ ළමා අවධියේ සිට බව. එසේ වීමට හේතුව වී ඇත්තේ ඔවුන්ගේ දෙමාපියන් සඟරාව මිල දී ගත් පාඨකයන් වීම. බොහෝ පාඨකයන් ළඟ සඟරා විශාල එකතුවක් තිබෙන බව ද දැනගන්නට ලැබෙන්නක්.

කෙසේ වුව ද දෙසතියට ද ඇත්තේ මල් පියලි මත සැනැහෙමින් පාද තබා යන ගමනක් නො වන බව ආ ගමන් මඟ ආවර්ජනය කරන විට පෙනී යන්නක්. අගය කිරීම් මෙන් ම හෙළා දැකීම් ද, උසස් සැලැකිලි මෙන් ම කුඩම්මාගේ සැලැකිලි ද ඇති වී නැති වී ගිය බව සත්‍යයක්.

මේ වන විට කැලණිය විශ්වවිද්‍යාලයේ වැඩ බලන උපකුලපති ලෙස කටයුතු කරන මහාචාර්ය සුනන්ද මද්දුමබණ්ඩාර රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ව සිටියදී දෙසතිය පිළිබඳ ව ඔහුට තුබුණේ පුදුමාකාර උනන්දුවක්. බාලගිරි දෝෂයෙන් මිදී නිසි දිනට දෙසතිය එළිදැක්වීම සඳහා ඔහු ධෛර්යය ගත්තේ ඇතැම් විට තද පියවර පවා ගනිමින්. එය එකල ඇතැම් විට වේදනාකාරී වුව ද ඔහු නිවැරැදි බව යි පිළිගත යුත්තේ.

වඩාත් නැවුම් හා ආකර්ෂණීය රූ රටාවකින් යුක්ත ව දෙසතිය ඉදිරිපත් කිරීමට පියවර ගන්නා ලද්දේ මහාචාර්ය ඇතුගල විසින්. ඒ වචන දහසකින් ප්‍රකාශ කළ හැකි දෑ එක පිංතූරයකින් කිව හැකි රූප භාෂාව පිළිබඳ ඔහු තුළ තිබූ පරිකල්පන ශක්තිය නිසා.

කුමන බාධා කම්කටොලු ඔස්සේ වුව ද මේ සඟරාව ඉදිරියට ගෙනයාමට ජනමාධ්‍යයේ හදගැස්ම හොඳින් හඳුනන නව ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය රංග කලංසූරිය ද කටයුතු කිරීම පැසසිය යුත්තක්.

දෙසතිය සමාජයේ පිළිගැනීමට හා විශ්වසනීයත්වයට ලක් ව තිබීමට එක් ප්‍රධාන ම හේතුවක් වූයේ "රාජපක්ෂ වලව්වෙන් බිහිවූණත් රජයේ හොරණෑවක්" වීමෙන් වැළැකීම නිසා. අනිත් අතට කාලීන ප්‍රශ්න පිළිබඳ සියලු කරුණු හැම පැත්තකින් ම නිරීක්ෂණය කරමින් විග්‍රහාත්මක ව ඉදිරිපත් කෙරුණු නිසා. හුදු වාර්තා හෝ ඒකපාක්ෂික කරුණු දැක්වීම් හෝ විශේෂාංග රචනා හෝ දෙසතිය පාඨකයන් පිනාවිය හැකි දේ නො වෙයි. ඔවුන් අපේක්ෂා කරන්නේ වඩාත් විද්වත් විග්‍රහයන්. දෙසතියේ ආරම්භක අරමුණ ඉටු වන්නේත්, පාඨක ආකර්ෂණය පවත්වා ගත හැකි වන්නේත් එයට අනුගත වන තරමට.



'දෙසතිය' නිර්මාතෘ
ආචාර්ය සරත් අමුණුගම



'දෙසතිය' සංස්කාරක මණ්ඩලයේ කටයුතු සිදු වෙමින්

# සසිරිබර මෙසිරිලක ජල කඳක අසිරි බල

## මොරගහකන්ද ජලාශය

ලොව විස්මයට පත් කරවන වාරි ශිෂ්ටාචාරයකට උරුමකම් කියන ශ්‍රී ලංකාවේ වසර 30කට පසු ඉදිවන විශාලතම ජලාශය වන මොරගහකන්ද කළු ගඟ ජල ද්‍රෝණිවෙන් නැවත තිරිහන් වන්නේ අපේ අභිමානවත් වාරි පද්ධතිය යි. ඉතිහාසය පුරා ම වියළි කාලගුණයේ සහ ඇතැම් විට නියඟයේ ගොදුරක් බවට පත් වූ, රජරට ගොවියා ඇතුළු සමස්ත ජනතාවට, මොරගහකන්ද ජලාශය සදාකාලික නිවහනක් වනු නො අනුමාන යි. වියළි කාලගුණයේදී දෙකන්න වගා කිරීමට නොහැකි වූ අනුරාධපුර, පොළොන්නරුව, ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල වගාවට පමණක් නොව පානීය ජලය හිඟවන වකවානු ද එමට යි. කෘෂිකර්මාන්තය, පානීය ජලය, විදුලිය උත්පාදනය කිරීම ද මෑත ඉතිහාසයේ ක්‍රියාත්මක වන විශාලතම සංවර්ධන යෝජනා ක්‍රමයක් වන මොරගහකන්ද කළු ගඟ බහුකාර්ය ව්‍යාපෘතියේ විශේෂත්වයක්.

මහවැලි ගඟේ ප්‍රධාන අතු ගංගාව වන අඹන් ගඟ හරස් කර කඳු 4ක් යා කරමින් ප්‍රධාන වේලි 3ක් සහිත ව මේ ජලාශය ඉදි වෙනවා. රජරටට ජලය සැපයීම අතින් අඹන් ගඟ සරු උල්පතක් වූයේ රජ කාලයේ සිට යි. අඹන් ගඟේ ජල ප්‍රවාහය, සංවර්ධනයට යොදා ගැනීමේ මෑත ඉතිහාසය ආරම්භ වන්නේ මහවැලි සංවර්ධන ව්‍යාපාරය සමඟින්. ඇළහැර පෞරාණික හැරවුම් අමුණට කිලෝමීටර් 2ක් ඉස්මත්තෙන් අඹන් ගඟ හරහා වේල්ලක් බැඳීමෙන් මොරගහකන්ද ජලාශය නිර්මාණය වෙනවා. එම ප්‍රධාන වේල්ලට අමතර ව නැගෙනහිරින් අතුරු වේලි 2ක් (සදැලි වේලි) ඉදි කෙරෙනවා. මොරගහකන්ද කළු ගඟ ව්‍යාපෘතියේ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු උපදේශක එච්. ඒ. එල්. එස්. යාපා: "මෙහි ප්‍රධාන වේල්ලේ උස අඩි 65ක්. එහි දිග මීටර් 463ක්. මුහුනත පළල මීටර් 8ක්. මේ ව්‍යාපෘතිය යටතේ ඉදි කරන ඉහළ ඇළහැර ඇළ මඟින්,



මොරගහකන්ද ජලාශයේ ගබඩා කරන ජල ප්‍රමාණයෙන් 50%ක් රජරටට යැවෙනවා. ඇළහැර ඇළේ මුළු දිග ප්‍රමාණය මීටර් 103ක්. උසින් පිළිවෙළින් මීටර් 42ක් සහ 21ක් මෙන් ම පළලින් පිළිවෙළින් 361ක් සහ 374ක් වන අතුරු වේලි දෙක ඇතුළු වේලි 3කින් සැදුම්ලත් මොරගහකන්ද ජලාශය, මොරගහකන්දේ සිට නාඋල දෙසට වර්ග කි. මී. 29.5ක් දක්වා ප්‍රදේශයක පැතිරෙනවා. මෙහි සක්‍රිය ජල ධාරිතාව අක්කර අඩි ලක්ෂ හාර ලක්ෂ හැට තුන් දහසක්.

මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ මෙතෙක් ඉදි වූ සියලු ම ජලාශවල මූලික ම අරමුණ වූයේ ජල විදුලිය නිෂ්පාදනය යි. එහෙත් කෘෂිකර්ම සංවර්ධනය කේන්ද්‍රය කරගත් මොරගහකන්ද ජලාශය රජරට, ත්‍රිකුණාමලය, මාතලේ යන ප්‍රදේශවල ජනතාවගේ පානීය ජල ප්‍රශ්නය විසඳීමේ සාර්ථක පියවරක් ද වෙනවා. එසේ ම වර්තමාන කාලගුණික සහ දේශගුණික තත්ත්වයන් මත සිදුවන නියං පරිසරයකින් ජලය නොමැති විට සිදු විය හැකි හානිය යළි ඇති නොවීමට මේ ව්‍යාපෘතියෙන් සෘජු දායකත්වයක් ලැබෙනු ඇතැයි යන්න ප්‍රදේශවාසීන්ගේ විශ්වාසය යි.

වැසිකාලයේදී අඹන් ගඟ ද්‍රෝණියෙන් මහ මුහුදට එක්වන්නේ මහා ජලකඳක්. එම ජලය ගබඩා කොට, රජරට ජනතාවට ලබාදීම මොරගහකන්ද කළු ගඟ නිවුන්

**ව්‍යාපෘතිය යටතේ වගා කළ හැකි කුඹුරු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 82,000ක්. එමඟින් රටේ පරිභෝජනයට අවශ්‍ය සහල් නිෂ්පාදනය 81%කින් ඉහළ යනු ඇතැයි ගණන් බලා තිබෙනවා. ඒ අනුව අපේක්ෂා කරන වාර්ෂික සහල් ප්‍රමාණය ටොන් දස ලක්ෂ 9000ක්. මොරගහකන්ද ව්‍යාපෘතිය මඟින් මෙරට ජාතික විදුලිබල පද්ධතියට මෙගා වොට් 25ක විදුලි බලයක් එක්වීම ද විශේෂත්වයක්.**

ජලාශ ඉදි කිරීමේ මූලික ම අරමුණ යි. දීර්ඝ කාලයක් තිස්සේ රජරට ජනතාව මුහුණ දෙන ජල හිඟයට එක ම විසඳුම එය යි.

මහවැලි අධිකාරිය පෙන්වා දෙන්නේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කලාවැව, නාච්චාදූව, නුවර වැව, හුරුළු වැව මහකනදරාව, පොළොන්නරුවේ පරාක්‍රම සමුද්‍රය, මින්නේරිය, ගිරිතලේ හා කවුඩුල්ල, ත්‍රිකුණාමලයේ කන්තලේ සහ වෙන්ඩරාසකුලම යන ග්‍රාමීය වැව්වලට ද මේ ව්‍යාපෘතිය මගින් අමතර ජල පහසුකම් ලැබෙන බව. මාතලේ, අනුරාධපුර, පොළොන්නරුව හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල දැනට දිනකට භාවිත කරන ඝන මීටර් 78,816ක ජල ප්‍රමාණය මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතිය මඟින් ඝන මීටර් 2,53,310ක් දක්වා වර්ධනය කර ගැනීමට හැකියාව ලැබෙනවා.

රසායනික ද්‍රව්‍ය මිශ්‍රිත රජරට මිරිදිය ජලය වෙනුවට මොරගහකන්ද ජලාශයෙන් සැපයෙන, පිරිසිදු පානීය ජලය, අප රටේ දැවැන්ත අර්බුදයක් බවට පත්ව ඇති වකුගඩු රෝගය තුරන් කිරීමට සක්‍රිය දායකත්වයක් සැපයීම මෙහි තවත් ප්‍රධාන අරමුණක්. මේ ව්‍යාපෘතිය යටතේ වගා කළ හැකි කුඹුරු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 82,000ක්. එමඟින් රටේ පරිභෝජනයට අවශ්‍ය සහල් නිෂ්පාදනය 81%කින් ඉහළ යනු ඇතැයි ගණන් බලා තිබෙනවා. ඒ අනුව අපේක්ෂා කරන වාර්ෂික සහල් ප්‍රමාණය ටොන් දස ලක්ෂ 9000ක්. මොරගහකන්ද ව්‍යාපෘතිය මඟින් මෙරට ජාතික විදුලිබල පද්ධතියට මෙගා වොට් 25ක විදුලි බලයක් එක්වීම ද විශේෂත්වයක්. මෙගා වොට් 25ක විදුලි නිෂ්පාදනයෙන් වාර්ෂික ව අමෙරිකානු ඩොලර් මිලියන 2.49ක් වටිනා ඉන්ධන ප්‍රමාණයක් ඉතිරි කර ගැනීම ද මේ මඟින් අපේක්ෂිත යි.

මහවැලි මහ සැලැස්ම යටතේ, රජරට ජල හිඟය දුරු කිරීමට ඒකායන විසඳුම මොරගහකන්ද ජලාශය ඉදි කිරීම බව තර්කයකින් තොර ව පිළිගැනුණේ මීට දශක කිහිපයක සිට. එහෙත්, එය ක්‍රියාත්මක





නොවුණු අතර මේ ව්‍යාපෘතියට මුල්ගල තැබෙන්නේ 2007 ජනවාරි 25 වැනි දින. අවුරුදු 5ක් පුරා සක්‍රිය නොවුණු එහි කටයුතු මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපති වූ පසු නැවත සක්‍රිය වුණා. එහි ප්‍රතිඵලය ලෙස 2017 ජනවාරි 11 වැනි දින ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා අතින් මොරගහකන්ද ජලාශයට ජලය පිරවීම ආරම්භ කිරීම ඓතිහාසික සංසිද්ධියක් බවට පත් වෙනවා. එය දේශීය කෘෂිකාර්මික සහ ආර්ථික ක්ෂේත්‍රයේ සංවර්ධනය පිළිබඳ නැවුම් බලාපොරොත්තුවක්.

ජලාශයට යටවන ගම්මාන 23ක පවුල් 3500ක් මැදිරිගිරිය සහ ඇළහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල නැවත පදිංචි කරවීමට සහ වර්තමාන වටිනාකමට අනුව වන්දි ගෙවීමට ද රජය පියවර ගෙන තිබෙනවා. එහිදී ජලාශයට යටවන ඉඩ - කඩම්, ගේ - දොර සහ ගහ - කොළවලට ද වන්දි ගෙවීම විශේෂත්වයක්. ජනතාව නැවත පදිංචි කරවන ප්‍රදේශ නම් කර ඇත්තේ මහවැලි 'එෆ්' කලාපය ලෙස යි.

මේ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ජලාශයට යටවන ගම්මාන 23ක පවුල් 3500ක් මැදිරිගිරිය සහ ඇළහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල නැවත පදිංචි කරවීමට සහ වර්තමාන වටිනාකමට අනුව වන්දි ගෙවීමට ද රජය පියවර ගෙන තිබෙනවා. එහිදී ජලාශයට යටවන ඉඩ - කඩම්, ගේ - දොර සහ ගහ - කොළවලට ද වන්දි ගෙවීම විශේෂත්වයක්. ජනතාව නැවත පදිංචි කරවන ප්‍රදේශ නම් කර ඇත්තේ මහවැලි 'එෆ්' කලාපය ලෙස යි. එම මහවැලි කලාපය අන් මහවැලි කලාප මෙන් සියලු පහසුකම් සහිත ව නව නගරයක් ලෙස සංවර්ධනය කිරීමට නියමිත යි. ඒ අනුව මාර්ග, විදුලිය, සෞඛ්‍ය, තැපැල්, අධ්‍යාපනය ආදී සියලු පහසුකම් සහිත මහවැලි ගම්මානයක පදිංචි වීමට මොරගහකන්ද කළුගඟ ජනතාවට අවස්ථාව හිමිවන බව මහවැලි අධිකාරිය පවසනවා. ජලාශයට යටවන මාර්ග වෙනුවට ව්‍යාපෘතිය යටතේ නව මාර්ග ඉදි කිරීම ද කඩිනමින් සිදු වන්නක්.

## පරිසර සංරක්ෂණය

මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘතිය පරිසර හිතකාමී ව්‍යාපෘතියක් ලෙස යි සැලකෙන්නේ. මේ මගින්. ඇළහැර, මාතලේ සහ පොළොන්නරුව ප්‍රදේශවල පාරිසරික සංරක්ෂණයට සිදු කරමින් පවතින කාර්යභාරය අතිවිශාල යි. එය සිදුවන්නේ ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන පරිසර සංරක්ෂණ වැඩසටහන් මගින්. අඹන් ගඟ සහ කළු ගඟ ව්‍යාපෘති ප්‍රදේශයේ සහ අනෙකුත් ජල මාර්ගවල සිට මීටර් 15 සිට මීටර් 30 වපසරියක 'වන' වගා කිරීමට නියමිත යි. එහි ප්‍රධාන අරමුණ ජලාශයට එක්වන රොන්මඩ සීමා කිරීම, පරිසර සංරක්ෂණ වැඩසටහන්වලින් ලබාදී ඇත්තේ අතිශය වැදගත් ස්ථානයක්. ගම් වටා විදුලි වැට ඉදි කිරීම, මින්නේරිය, කවුඩුල්ල, ගිරිතලේ වනෝද්‍යාන යා කරමින් අලිමංකඩක් ද වස්ගමුව, වික්ටෝරියා හා රන්දෙණිගල වනෝද්‍යාන යා කරමින් තවත් අලිමංකඩක් ඇති කිරීම ද ඊට නිදසුන්. එම වනෝද්‍යාන තුළ ඇති කුඩා වැව් ප්‍රතිසංස්කරණය කරන්නේ එහි වෙසෙන අලි ඇතුන්ගේ ජල අවශ්‍යතා සපුරාලීමට යි. ජලාශයට යටවන වනගහන වෙනුවට නව ගහන ඉදි කිරීම ද පරිසර සංරක්ෂණ වැඩපිළිවෙළෙහි ප්‍රධාන අංගයක්. ඒ අනුව මොරගහකන්ද සහ කළුගඟ ජලාශයේ ඉවුරුවල උපරිම ජල මට්ටමේ සිට මීටර් 100ක දුර ප්‍රමාණයකට වන වගා කිරීමට පියවර ගැනීම ද විශේෂත්වයක්. මේ ජලාශය ඉදි කිරීම සඳහා කුවේට් සංවර්ධන අරමුදල, චීන සංවර්ධන බැංකු අරමුදල, සෞදි අරමුදල, ඔපෙක් ජාත්‍යන්තර අරමුදල සහ දේශීය අරමුදල යටතේ මුදල් ප්‍රතිපාදන ලැබී තිබෙනවා.

රටේ ජාතික ආර්ථිකයේ වේගවත් පිම්මක් ලෙස සැලකිය හැකි මොරගහකන්ද කළු ගඟ යෝධ සංවර්ධන ව්‍යාපෘතිය, ජනතාවට දුන් පොරොන්දු ඉටු නොකරන ඡන්ද පොරොන්දුවක් නොව මානව යහපත උදෙසා ක්‍රියාත්මක වන විශාල ආයෝජනයක් ලෙස ඉතිහාසයට එක් එක්වනු ඇති.

සුභා රත්නායක



# සහල් මිලට බාලගිරි ද?

කාලගුණ විද්‍යාඥයන් පෙන්වා දෙන ආකාරයට පසුගිය වසරේ මැයි මාසයෙන් පසුව අපේක්ෂිත වර්ෂාපතනය ඒ ආකාරයට ම නොලැබීමත් සමග වසර 50 කට පසු ව මෙරටින් වාර්තා වූ දැඩි වියළි කාලගුණ තත්ත්වයකට ශ්‍රී ලංකාව මුහුණ දෙමින් සිටිනවා. ඉදිරියේදී දරුණු නියඟයක් මෙන් ම ආහාර හිඟයක් ද ඇති විය හැකි යයි අදාළ අංශවල විද්වතුන් කල් ඇතිව ම අනතුරු අඟවා තිබියදීත් ඒ පිළිබඳ ව බලධාරීන්ගේ අවධානය යොමු වූයේ අවම මට්ටමින්. එහි ප්‍රතිඵලය වූයේ "කොරේ පිටට මරේ කීවාක් මෙන්" නියඟය ද සමඟ වෙළෙඳපොළේ සහල් මිල ගණන් ද පාරිභෝගිකයාට අත පෙවිය හැකි සීමාවට වඩා සීඝ්‍රයෙන් ඉහළට යාම යි.

මරදගහමුල සහල් වෙළෙඳුන්ගේ සංගමයේ සභාපති සී.කේ. රංජිත් පෙන්වා දෙන ආකාරයට 2017.01.23 වැනි දින වන විට සාමාන්‍යයෙන් පරිභෝගිකයන් එදිනෙදා භාවිතයට ගන්නා රතු නාඩු රුපියල් 85කින් ද, සුදු නාඩු රුපියල් 95කින් ද, සම්බා රුපියල් 110කින් ද වශයෙන් මිල ගණන් තීරණය වෙනවා. පෙරදිග කලාපයේ රටක් වශයෙන් පාරිභෝගිකයන් එදිනෙදා භාවිතයට ගන්නා ආහාර ද්‍රව්‍ය අතර සහල් යනු තවමත් අපේ රටේ අංක එකෙහි ම තිබෙන පාරිභෝගික භාණ්ඩයක්. ඒක පුද්ගල සහල් පරිභෝජනය වාර්ෂික ව කිලෝ. ග්‍රෑම් 110ක් ලෙස වාර්තා වීමෙන් ම එය මැනැවින් තහවුරු වෙනවා. මේ නිසා සහල් මිල ඉහළ යාම පාරිභෝගිකයන්ට තදින් ම දැනෙන කාරණයක්. වාණිජ හා කර්මාන්ත අමාත්‍යාංශය රජය සතු වී තොගවලින් මෙට්‍රික් ටොන් 20,000ක් පමණ ලබා ගෙන ඒවා සහල් බවට පත් කර සහනාස හරහා කිලෝවක් රු. 78 බැගින් අලෙවි කිරීමට කටයුතු කර තිබෙනවා. වී අලෙවි මණ්ඩලය ද දැනට තමන් සතුව පවතින ආරක්ෂිත තොගය වූ වී මෙට්‍රික් ටොන් 2,09,000න් මෙට්‍රික් ටොන් 50,000ක් අත රඳවා ගෙන ඉතිරිය දිවයින පුරා තෝරා ගත් මෝල් හිමියන් 172ක් අතර සහල් නිෂ්පාදනය සඳහා පමණක් අලෙවි කිරීමට මේ වන විට කටයුතු යොදා ඇති බවයි. වී අලෙවි මණ්ඩලයේ සභාපති එම්.බී. දිසානායක පෙන්වා දෙන්නේ. මීට අමතර ව රජය විසින් ආනයනය බදුවලින් නිදහස් කර සහල් මෙ. ටො. 10,000ක් පමණ ආනයනය කිරීම සඳහා පෞද්ගලික අංශයට අවසරය ද ලබා දී තිබෙනවා. වෙළෙඳපොළේ මිල පාලනය කිරීම සඳහා මේ ආකාරයට සහල් ආනයනයට අවසර ලබා දුන්නත් නොබෝදා විශේෂ නියං කාර්යසාධන බලකාය සමඟ පැවැති විශේෂ සාකච්ඡාවේදී ජනාධිපතිවරයා නිලධාරීන්ට උපදෙස් ලබා දුන්නේ ආනයනය කරන සහල් කිලෝව රුපියල් 76කට වඩා ඉහළ මිලකට අලෙවි කිරීමට කිසිසේත් ම ඉඩ ලබා නොදෙන ලෙස යි.

එසේ වුවත් මේ කිසිදු ක්‍රියාමාර්ගයක් නිසා හෝ වෙළෙඳපොළේ සහල් මිල ගණන් පැවැති මට්ටමට වඩා අඩු වූ බවක් නම් පෙනෙන්නට නැහැ. සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ ජාතික සංවිධායක නාමල් කරුණාරත්න පෙන්වා දෙන ආකාරයට මේ වන විට වෙළෙඳපොළේ පවතින්නේ සහල් හිඟයක් නොවේ යි. එය හිඟයක් වශයෙන් සිදු කරන මවාපෑමක් බව පෙන්වා දෙන ඒ මහතා : "මේ ආකාරයට හදිසියේ ම සහල් හිඟයක් ඇති වීම හා මිල ඉහළයාම මහා පරිමාණ වී මෝල් හිමියන් කිහිපදෙනෙක් එක් ව සිදු කරන මාෆියාවක ප්‍රතිඵලයක්. ඒ නිසා කෘත්‍රිම ව හිඟයක් ඇතිකර මිල ඉහළ යාමක් සිදු කර තිබෙනවා. එසේ නැතිව මේ වන විට වෙළෙඳපොළේ කිසිදු සහල් හිඟයක් නැහැ." ඔහු අවධාරණය කරනවා.

2015/2016 මහ කන්නයේ වී අස්වැන්න මෙට්‍රික් ටොන් මිලියන 2.90ක්. යල අස්වැන්න මෙට්‍රික් ටොන් මිලියන 1.57ක්. 2016 සමස්ත අස්වැන්න මෙට්‍රික් ටොන් මිලියන 4.47ක්. එය සහල් බවට පත් කළ විට සහල් ප්‍රමාණය මෙට්‍රික් ටොන් මිලියන 2.27ක්. වාර්ෂික සහල් අවශ්‍යතාව මෙට්‍රික් ටොන් මිලියන 2.4ක්. ඒ අනුව රට තුළ සහල් මෙට්‍රික් ටොන් 443,000ක අතිරික්තයක් පවතින බව යි කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පවසන්නේ. මේ නිසා වෙළෙඳපොළේ කිසිසේත් ම සහල්

හිඟයක් නැතැයි ගොවිජන සම්මේලනයේ ජාතික සංවිධායකවරයා නගන තර්කය සාධාරණ යි.

එසේ තිබියදී මේ ආකාරයට වෙළෙඳපොළේ සහල් හිඟයක් මතු වී මිල ගණන් සීඝ්‍රයෙන් ඉහළ ගොස් තිබෙන්නේ කෙසේ ද ? ගොවිජන සේවා සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් සුනිල් වීරසිංහ පෙන්වා දෙන ආකාරයට වෙළෙඳපොළේ මේ ආකාරයට සහල් මිල ගණන් ඉහළ ගොස් තිබෙන්නේ මහා පරිමාණ මෝල් හිමියන් කිහිපදෙනකු විසින් වී තොග සඟවා ගෙන සිටීම නිසා යි. වැඩිදුරටත් අදහස් දක්වන ඒ මහතා: "වී අලෙවි මණ්ඩලය එක් කන්නයකදී මිල දී ගන්නේ සමස්ත අස්වැන්නෙන් 10%ක ප්‍රමාණයක් පමණ යි. ඉතිරිය මිල දී ගන්නේ පෞද්ගලික අංශයෙන්. ඉන් බහුතරය මිල දී ගන්නේ මහා පරිමාණ වී මෝල් හිමියන් කිහිපදෙනෙක් විසින්. වෙළෙඳපොළේ සහල් මිල පාලනය සඳහා ඔවුන් සෘජු ව මැදිහත් වෙනවා. ඔවුන් සිය වී තොග හිතාමතා ම සඟවා ගෙන සිටින නිසයි මේ ආකාරයට හිඟයක් ඇති වී තිබෙන්නේ.

2015/2016 මහ කන්නයේ මෙරට වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 2.90ක් වූ අතර රජය වී අලෙවි මණ්ඩලය හරහා වී මිල දී ගත්තේ සම්බා කිලෝව රුපියල් 45කට හා නාඩු කිලෝව රුපියල් 38කට. මේ නිසා ගොවීන් බහුතරය සිය අස්වනු වී අලෙවි මණ්ඩලයට ම අලෙවි කිරීමට යි ඉදිරිපත් වුණේ. ප්‍රතිඵලය වූයේ එක් ගොවියකුගෙන් ලබා ගන්නා වී ප්‍රමාණය කිලෝ 2000 දක්වා සීමා කිරීම යි. රජය සතු ගබඩා පහසුකම් අවම වීම නිසා එම වී තොග අවසානයේ ගබඩා කිරීමට සිදු වූයේ මත්තල ගුවන් තොටුපොළ ගබඩා සංකීර්ණයේ ගබඩාවල යි.

වී නිෂ්පාදනය සැලකිය යුතු මට්ටමකින් ඉහළ ගොස් තිබෙන බවට උපකල්පනය කරමින් වී නිෂ්පාදනය පාලනය කිරීමට කටයුතු කිරීම ද සහල් හිඟයට හේතු වූ බවයි ගොවිජන සම්මේලනයේ චෝදනාව. පොහොර සහනාධාර වෙනුවට මුදල් ලබා දීම, රජයේ මිල දී ගන්නා වී ප්‍රමාණය සීමා කිරීම, වගා කරන ඉඩම් ප්‍රමාණය උපායශීලි ව අඩු කිරීම, රජයේ ගබඩාවල තිබූ 14% දක්වා තෙත බර ඉවත් කළ වසර 02 පමණ කල් තබා ගත හැකි වී තොග සත්ත්ව ආහාර සඳහා අලෙවි කිරීම ඉන් කිහිපයක්. මත්තල, ඔයාමඩුව හා වවුනියා ගබඩාවල වී මෙට්‍රික් ටොන් 90000 පමණ සත්ත්ව ආහාර නිෂ්පාදකයන් සඳහා රුපියල් 24.50 කට 2016 මාර්තු මාසයේ අලෙවි කර තිබෙන බව යි චෝදනාව. රජය සතු පරිභෝජනය සඳහා තිබූ වී තොග මෙලෙස සත්ත්ව ආහාර සඳහා අලෙවි කළේ නම් එය සහල් මිලට සෘජු ව ම බලපාන බව අමුතුවෙන් කිව යුතු නැහැ.

වී අලෙවි මණ්ඩලයේ සභාපතිවරයා පවසන්නේ ඉදිරි කන්නයේ අස්වනු මිල දී ගැනීමට අවශ්‍ය ගබඩා පහසුකම් සපයා ගැනීමටත් ඒ වන විට වෙළෙඳපොළේ වී මිල ඉතා ම අවම මට්ටමකට පැවතීම නිසාත් කැබිනට් මණ්ඩලයේ අනුමැතියට යටත් ව පෙර කන්නවල මිල දී ගත් වී තොග පමණක් සත්ත්ව ආහාර සඳහා නිකුත් කළ බව යි. එහෙත් මෙවර වී නිකුත් කළේ සහල් මෝල් හිමියන්ට පමණක් බව යි ඔහු අවධාරණය කරන්නේ.

මේ වන විට වී අලෙවි මණ්ඩලයේ ගබඩාවල තිබෙන්නේ 2016 මිල දී ගත් 14% තෙත බර ඉවත් කළ වී තොග නිසා එම වී කුඩා හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන්ට ලබා දී පාලන මිලක් යටතේ අලෙවි කරනවා නම් එය මේ ප්‍රශ්නයට විසඳුමක් බව එක්සත් සහල් නිපදවන්නන්ගේ සංගමයේ සභාපති මුදිත පෙරේරා පවසනවා. සාමාන්‍යයෙන් වී කිලෝ 100කින් නාඩු සහල් කිලෝ 65ක් ද, සම්බා කිලෝ 64ක් ද, කැකුළු කිලෝ 62ක් ද සකසා ගත හැකි යි. එමඟින් සහල් කිලෝවක මිල තීරණය වන්නේ. වී කිලෝවක මිල රුපියල් 1.6කින් වැඩි කර එයට රුපියල් 8ක් එකතු කිරීමෙන්. මේ නිසා සහල් සඳහා රජය මැදිහත් වී, පාලන මිලක් ඇති කිරීම මේ අවස්ථාවේ ගැටලුවට කිසියම් විසඳුමක්. එක්සත් සහල් නිපදවන්නන්ගේ සංගමය පවසනවා.

තත්ත්වය මෙසේ තිබියදී පසුගිය වසරේ මැයි මාසයෙන් පසු ව අපේක්ෂිත ආකාරයට වර්ෂාව නොලැබීම නිසා 2016/17 මහ කන්නයේ සැලසුම් කළ පරිදි අක්කර 750000කින් වගා කළ හැකි වූයේ අක්කර ලක්ෂ 05කට ආසන්න ප්‍රමාණයක් පමණක් බවයි ගොවිජන සේවා සංවර්ධන කොමසාරිස් සුනිල් වීරසිංහ පවසන්නේ. ඉන් 30%ක් මේ වන විට සම්පූර්ණයෙන් ම විනාශ වෙලා. තවත් 30%ක් පමණ අවදානම් තත්ත්වයේ පවතින්නේ. ඉදිරියට ගෙන යා හැකි මට්ටමේ පවතින්නේ වගාවෙන් 40%ක් පමණ යි. වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් සමන් වීරසිංහට අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ජලාශවලින් බහුතරයක ජල මට්ටම පවතින්නේ 23%ක සීමාවේ. මේ නිසා ඉඟිනිමිටිය, තබ්බෝව, කන්තලේ, පදවිය, හුරුළුවැව, ආශ්‍රිත වගා බිම් පවතින්නේ අවදානම් මට්ටමක (අක්කර 35000). ප්‍රමාණවත් වර්ෂාපතනයක් ඉදිරියේදී නොලැබුණහොත් මෙවර යල කන්නයේ වී වගාව අවිනිශ්චිත මට්ටමට පත් විය හැකි බව යි කෘෂිකර්ම දෙපාර්තමේන්තු ආරංචි මාර්ග පෙන්වා දෙන්නේ. මන්ද යල කන්නය සම්පූර්ණයෙන් වගා කටයුතු සිදු කරන්නේ වාරි ජලයෙන් වන අතර එයට අවශ්‍ය ජලය ලබා දෙන්නේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතු ජලාශ හා වැව් අමුණු මඟින් වන නිසා බොහෝ ජලාශවල ජල මට්ටම 23% දක්වා පහත බැස්මෙන් ම එහි අවදානම වටහා ගැනීම අපහසු නැහැ. එහෙත් පෙර රජ දවස මේ මහා වැව් අමුණුවලින් සමන්විත වාරි පද්ධතියක් ගොඩනගා තිබෙන්නේ වර්ෂාව වැඩි කාලයේදී ජලයෙන් පුරවා ගෙන අඩු කාලයේදී ප්‍රයෝජනයට ගැනීමට යි. එහෙත්, මේ බොහොමයක් වැව් 50 දශකයෙන් පසු ව ප්‍රතිසංස්කරණය කර නැහැ. මේ නිසා කලා වැව ධාරිතාව අක්කර අඩි 130,000ක් වුවත් අක්කර අඩි 70,000 දි වාන් දමනවා. පදවිය කන්තලේ ආදි බොහෝ වැව්වල තත්ත්වය ද මීට සමාන යි. මේ නිසා නිසි පරිදි ප්‍රයෝජනයට ගැනීමට මේ වැව් වහා ම ප්‍රතිසංස්කරණය කිරීම අත්‍යවශ්‍ය කාරණයක්. එසේ ම වී ගොවිතැනට අවශ්‍ය පරිදි ජල කළමනාකරණ ක්‍රමවේදයකට යොමු වීම ද අවශ්‍ය වෙනවා. කෙසේ වෙතත් මේ නියඟය ද ඉදිරියේදී එලෙසින් ම පැවතුණහොත් එය ද තව දුරටත් සහල් මිල කෙරෙහි බලපෑම් ඇති කිරීමට හේතුවක් වෙනවා. එහෙත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව අම්පාර ප්‍රදේශයේ අස්වනු නෙළීම ඉදිරියේදී ආරම්භ වී එම අස්වනු වෙළෙඳපොළට පැමිණෙන විට ජූලි මාසය වන තෙක් සහල් හිඟයක් ඇති වීමට ඉඩක් නැහැ.

එසේ ම රජයේ ගබඩාවල තිබූ වී තොග අපේක්ෂිත පරිදි සහල් ලෙස වෙළෙඳපොළට නොපැමිණීම නිසා රජයේ වී මිල දී ගෙන ඒවා සහල් ලෙස වෙළෙඳපොළට නිකුත් කිරීම පැහැර හරින ස්ථිර මෝල් හිමියන්ට විරුද්ධ ව පියවර ගැනීමට විශේෂ ව්‍යාපෘති අමාත්‍ය ආචාර්ය සරත් අමුණුගම අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් ද පත් කර තිබෙනවා. කෙසේ වෙතත් මේ ආකාරයට සහල් මිල ඉහළයාම පාරිභෝගික ජනතාවට දැරිය හැකි කාරණයක් නොවෙයි. මේ නිසා බලධාරීන් සිදු කළ යුත්තේ එකිනෙකා දෙසට ඇඟිලි දිගු කරමින් විදේශ රටවලින් සහල් ආනයනය කිරීමට පෞද්ගලික අංශයට ඉඩ දීම නොවෙයි. වෙළෙඳපොළ මිල පාලනය කිරීම සඳහා සැලැසුම්ගත වැඩපිළිවෙළකට ඇත්වත් අවතීර්ණ වීම යි.

ශ්‍යාමා සන්ධ්‍යානායකගේ

# ඉන්දියානු භීතිකාව සහ



# 1990 ගිලන් රථ සේවය

මෙරට 1989 - 1990 කාලවලදී ලංකාව ම වෙලාගත් භීෂණයක් තිබුණේ ය. එදා පැවැති භීෂණයේ ප්‍රධාන අංගයක් වූයේ ඉන්දීය නිෂ්පාදන ලංකාවේ අලෙවි කරන ව්‍යාපාරිකයන් මරා දැමීම හෝ එම වෙළෙඳ ව්‍යාපාර විනාශ කර දැමීම ය. ඉන්දියාවෙන් ගෙන්වන පරිප්පු, බොම්බායි ලූනු වැනි අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ද කුළු බඩු ද ඇඳුම් පැළඳුම් ද විකුණ සුළු වෙළෙන්දන් බුරුතු පිටින් මැරුම් කෑ අතර තවත් සමහරකුට කළ වරදට දේශප්‍රේමීන්ගෙන් සමාව ඉල්ලා බැනර් ප්‍රදර්ශනය කිරීමට ද සිදු වූහ. තවත් පිරිසකට සිදු වූයේ වෙළෙඳ ව්‍යාපාර වසා දැමීමට ය. එදා එම ඉන්දියානු භීතිකාව රට තුළ විසුරුවා හැරියේ ජනතා විමුක්ති පෙරමුණේ සන්නද්ධ බලකාය වූ දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය විසින් ය. එය මර්දනය කිරීමෙන් පසු ව වසර ගණනාවක් ගෙවී ගිය තැනදී නැවතත් ඉන්දියානු භීතිකාවක් මවා පෑමට පසුගිය මාස කිහිපය තුළදී අපේ දේශපාලකයන් සහ වෛද්‍ය වෘත්තියේ නියැළුණු වෘත්තීය සමිති නියෝජිතයන් පිරිසක් නොගත් උත්සාහයක් නැත. එයට මුල්වූයේ ඉන්දියාව මඟින් අපට පරිත්‍යාග කිරීමට සූදානම් වූ සියලු පහසුකම්වලින් සමන්විත ගිලන් රථ සමූහයකි.

ඉන්දියාවේ අගමැති නරේන්ද්‍ර මෝදි මහතා සහ ලංකා ආණ්ඩුව අතර ඇතිකර ගත් සුහද ගිවිසුමක් අනුව මේ ගිලන් රථ සමූහය ලංකාවට පරිත්‍යාග කිරීමට සූදානම් වූවා පමණකි. එම ප්‍රවෘත්තිය දැනගත් මොහොතේ සිට ම විපක්ෂයේ කණ්ඩායමක් රටට ම කියන්නට පටන් ගත්තේ මේ ගිලන් රථ පරිත්‍යාගය ට්‍රෝජන් අශ්වයා හා සමාන ව කෙරෙන පරිත්‍යාගයක් බව යි. ඉන්දියානු ගිලන් රථ සේවාවත් සමඟ ම මෙරටට ඉන්දියානු වෛද්‍යවරුන් පමණක් නොව ඉන්දීය සේවකයන් ද පැමිණෙන බවත් මේ නිසා ලංකාවේ පුරවැසියන්ට රැකියා හිඟයකට මුහුණ දීමට සිදුවන බවත් ඔවුහු දස අතේ දිවුරමින් කියා සිටියහ. මේ අනාවැකි කියන්නට මුල් වූ පිරිස අතර බුද්ධිමත්යැයි සමස්ත ජන සමාජය ම විශ්වාස කළ වෛද්‍ය සංගම්වල වෛද්‍යවරු ද වූහ. ඉන්දියාවෙන් ලංකාවට පරිත්‍යාග කරන ගිලන් රථ අස්සේ ඉන්දීය රහස් ඔත්තු සේවයට අයත් රෝ සංවිධානයේ සාමාජිකයන් ද ලංකාවට පැමිණෙන බව කියමින් මේ පිරිස සමාජයට භයානක බිල්ලකු මවා පෙන්වීමට නොගත් උත්සාහයක් නැත. ලංකාවේ ස්වාධීනත්වයට මේ මඟින් භයානක තර්ජනයක් එල්ලවන බව කියමින් සමස්ත ජනතාව ම නොමඟ යැවීමට ද මේ පිරිස මූලික වූහ. ගිලන් රථ විරෝධී කණ්ඩායමට අපේ භික්ෂු සමාජයට අයත් වූ සුළු පිරිසක් ද එක්කර ගැනීම මඟින් ආගමික විරෝධයක් ද එයට මුසු කිරීමට මේ විරුද්ධ පාක්ෂික දේශපාලනඥයෝ සහ වෛද්‍ය සංගම් දැඩි ලෙස උනන්දු වූහ. පාර්ලිමේන්තුව තුළදීත් ඉන් පිටස්තරවත් මේ පිරිස හැසිරුණේ සමස්ත වෛද්‍ය සේවය ම ඉන්දියාවේ අණසක යටතට පත්කිරීමට සූදානම් වන බව කියමිනි. විපක්ෂයේ එම ප්‍රචාරයන්ට මාධ්‍ය මඟින් ලබා දුන් ප්‍රචාරය ද ඉතාමත් ප්‍රබල විය.

ඔවුන්ට මීනැවී තිබුණේ කෙසේ හෝ මේ පරිත්‍යාගය අවලංගු කිරීමට ය. විශේෂයෙන් ම තම දේශපාලන අරමුණු ක්‍රියාත්මක කර ගැනීම සඳහා ගම්බද ජනතාවට ලැබීමට යන සෞඛ්‍යමය වරප්‍රසාදය අහෝසි කිරීම ඔවුන්ගේ එක ම අභිප්‍රාය විය. අංග සම්පූර්ණ ගිලන් රථ සියයක් ලංකාවට පරිත්‍යාගයක් වශයෙන් ලැබීම ලංකාවේ සෞඛ්‍ය සේවයට විශාල ශක්තියකි. එමඟින් උපරිම පහසුකම් ලබන්නේ දුගී දුප්පත් රෝගීන් ය. ලංකාවේ පුද්ගලික ගිලන් රථ සේවා බොහොමයක් ඇතත් එයින් ප්‍රයෝජනය ලබා ගන්නේ ස්වල්ප දෙනකු පමණකි. එම පහසුකම් ලබා ගැනීමට ආර්ථික ශක්තියක් තිබිය යුතුම ය. ආර්ථික අහේනිකම්වලට මුහුණ දෙන ගම්බද දුගී අසරණ රෝගීන්ට එමඟින් සහනයක් ලබා ගැනීමට හැකියාවක් ඇත්තේ ම නැත. හදිසි අවසථාවකදී රෝගියකු රෝහල්ගත කිරීමට අවශ්‍ය පහසුකම් නොලැබීම නිසා මරණයට පත්වන රෝගීන්ගේ සංඛ්‍යාව ද අපමණ ය. නිසි අවස්ථාවේදී රෝගියකු රෝහල්ගත කිරීමත්, ඔහුට හදිසි ප්‍රතිකාර ලබා දීමත් යනු සෞඛ්‍ය සේවයේ මූලික සිද්ධාන්තයක් සේ ම එය සදාචාරාත්මක ගුණධර්මයකි. ඈත ගම්බද ජීවත්වන අසරණ රෝගියාටත් නගරයේ ජීවත්වන මධ්‍යම පංතියේ පුරවැසියාටත් පොදුවේ ගත් කල සියලු ම දෙනාටත් මේ සිද්ධාන්තය එක හා සමාන ය. එහෙත් හදිසි රෝගී අවස්ථාවකදී ගිලන් රථයකින් රෝගියකු රෝහල්ගත කිරීම ඈත පිටිසර ජීවත්වන දුගී ජනතාවට සිහිනයක් පමණක් ම විය. එම සිහිනය යථාර්ථයක් බවට පත්කිරීමට ආණ්ඩුව දැරූ උත්සහායට දැඩි සේ විරුද්ධ වූ මේ පිරිස සිදුකර ඇත්තේ ජනතාවගේ සෞඛ්‍යයට අභියෝග කිරීමකි.

එහෙත් මේ ගිලන් රථ සේවාවට විරුද්ධ වූ පුද්ගලයන්ට නම් කිසිදු ප්‍රශ්නයක් නැත. නිසි වේලාවට ප්‍රතිකාර නොමැතිව මිය යන්නේ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් නොවීම එයට ප්‍රධාන හේතුව යි. මේ ගිලන් රථ පරිත්‍යාගයට විරුද්ධ වූ අයගේ පවුලේ කෙනකු රෝගාතුර වූ විට පුද්ගලික ගිලන් රථ සේවාවකින් හෝ වෙනත් අකාරයකින් හෝ එම අවශ්‍යතාව ඉටුකර ගැනීමට ඇති ආර්ථික ශක්තියත් දේශපාලන බලයත්




ඔවුන් සතුව තිබේ. බොහෝවිට මොවුන් සුපිරි පංතියේ පුද්ගලික රෝහලකට හෝ විදේශීය රෝහලකට ඇතුළු වන අතර එහි ගාස්තු පවා ගෙවනු ලබන්නේ ජනාධිපති අරමුදල මඟින් ය. එපමණක් ද නොව පසුගිය දිනයකදී වැඩ වර්ජනයක යෙදුණු රජයේ වෛද්‍ය සංගම් නිලධාරීන් තමන්ගේ රාත්‍රී ආහාරවේල පවා ගෙන්වා ගනු ලැබුවේ රජයේ ගිලන්රථයකින් බව ප්‍රසිද්ධ කරුණකි. ඒ නිසා සාමාන්‍ය ජනතාව රෝගාතුර වූ විට එම රෝගීන්ට කුමක් සිදු වුවත් විපක්ෂයේ දේශපාලනඥයන්ට හෝ වෘත්තීය සංගම් නිලධාරීන්ට ප්‍රශ්නයක් නැත. ඉන්දියාවෙන් පරිත්‍යාග කළ ගිලන් රථ ලංකාවට ලබා ගැනීම මේ දේශපාලනඥයන්ට ඔවුන්ගේ බලය පිළිබඳ වූ ප්‍රශ්නයක් පමණකි. ජනතාවට සහනයක් ලැබෙන සෑම කරුණකදී ම බිල්ලකු මවාපාමින් එවාට විරුද්ධ ව වැඩ කිරීම තම එක ම පරමාර්ථය බවට පත්කර ගත් මේ පිරිස ගිලන් රථ ප්‍රශ්නයේදී ද හැසිරුණේ ඔවුන්ට සුපුරුදු ආකාරයෙන් ම ය.

සෞඛ්‍ය පහසුකම් නිසි පරිදි නොලැබීමෙන් ගම්බද ජනතාව පත්වී තිබෙන අසීරු තත්ත්වය පිළිබඳ ව හොඳින් අවබෝධ කරගත් රජය ඉන්දියාවෙන් පරිත්‍යාග ලෙසින් ලැබුණු ගිලන්රථ වැඩි ප්‍රමාණයක් මුදා හරින ලද්දේ ද ග්‍රාමීය ප්‍රදේශවලට ය. ඒ, ඉන්දියාවට යවා මනා පුහුණුවක් ලබා දෙන ලද කාර්ය මණ්ඩලයක් ද සමඟින් ය. මේ සේවය නොමිලයේ ම ලබා ගැනීම සඳහා ජනතාව දැනුම්වත් කිරීම ද ආණ්ඩුව විසින් සාර්ථක ව ඉටු කරගෙන යනු ලැබේ. සෑම ජංගම දුරකථනයක ම මේ දිනවල දකින්නට ලැබෙන පහත සඳහන් පණිවුඩය ඉතා වැදගත් වේ.

"මෙය රජය මඟින් නොමිලයේ පැය 24 පුරා ම ලබා දෙන සේවයකි. හදිසි අවස්ථාවකදී 1990 අමතා ගිලන් රථයක් වහාම ගෙන්වා ගැනීමට මේ අංකය සේව් කර ගන්න."

හදිසි රෝගී තත්ත්වයකදී ආර්ථික අසීරුකම්වලට ගොදුරු ව මානසික ව පීඩා විඳින රෝගීන්ට එම පණිවුඩය සැනසිලිදායක ආරංචියකි. පසුගිය 20 වැනි දා සිදුවූ එවැනි සිදුවීමක් කෙරෙහි සියලු දෙනාගේ ම අවධානය යොමු කිරීම ඉතාමත් වැදගත් ය.

මාතර, තෙලිජ්ජවිල ගල්ලන්දකැටියේ පදිංචි කේ. වී. අනුෂා සඳමාලි නමැති මව වෛද්‍ය උපදෙස් පරිදි තම දරු ප්‍රසූතිය සඳහා සූදානම්වී සිටියේ දෙසැම්බර් 30 වැනිදාත් ජනවාරි 12 වැනිදාත් අතරතුර කාලයකදී ය. එහෙත් ඇයට දෙසැම්බර් 20 වැනි දින රාත්‍රියේදී හදිසියේ ම ඇතිවූ ප්‍රසව වේදනාව හේතුවෙන් රෝහල් ගත කිරීමට සිදු වුවත් හදිසියේ ම ගත යුතු ක්‍රියාමාර්ගයක් නොමැතිවීම නිසා ඇයගේ සැමියා වූ වී. ඊ. පී. සුරේෂ් මහතා ඔහුගේ දුරකථන අංකයට ලැබී තිබූ පණිවුඩයක් අනුව වහාම 1990 අංකයට අමතා සිද්ධිය දන්වා තිබේ. ඒ වන විට අකුරැස්ස පොලිස් ස්ථානයේ නවතා තිබූ ගිලන් රථ සේවාවට අයත් එක් ගිලන් රථයක් මිනිත්තු දොළහකටත් අඩු කාලයකදී රෝගියා සිටි ස්ථානයට පැමිණ ඇත්තේ ඉන්දියාවේදී විශේෂ පුහුණුවක් ලත් හදිසි ප්‍රතිකාර තාක්ෂණවේදිනියක් වූ රම්‍යා මධුභාෂිණී රණවක මහත්මිය ද සමඟින් ය. දරු ප්‍රසූතියට ආසන්න ව සිටි මව තම සැමියා ද සමඟ ගිලන් රථයෙන් රෝහල කරා ගෙනයන අවස්ථාවේදී මාතර ගොඩගම ප්‍රදේශයේදී ඇය දරුවකු ප්‍රසූත කළා ය. එම අවස්ථාවේදී මවට සියලු ම ප්‍රතිකාර සමඟ ආරක්ෂාව ද ලබා දුන් තාක්ෂණවේදිනිය මවත් අලුත උපන් දරුවත් නිරුපද්‍රිත ව ම රෝහල වෙත රැගෙන යාමට සමත් වූවා ය.

මේ සිදුවීම තුළ ගැබ්වී ඇති සිද්ධි මාලාව දෙස බලන විට ජීවිත දෙකක් බේරා ගැනීමට ඉන්දීය ගිලන් රථ සේවාවටත් එහි ලාංකික නිලධාරීන් කණ්ඩායමටත් හැකිවීම එදා මේ පරිත්‍යාගයට විරුද්ධ වූ සියලු ම දෙනාට ලබා දුන් අතුල් පහරකි. දැන් මේ විරුද්ධ කණ්ඩායම්වලින් ඇසිය යුතු ප්‍රශ්න කිහිපයක් තිබේ. එනම්, ඉන්දීය ගිලන් රථ සේවය මඟින් සිදුවන මෙහෙවර පිළිබඳ ව දැන්වත් ඔබ සියලු දෙනාට වැටහීමක් තිබේ ද? එම ගිලන් රථ සේවයේ සේවය කරන්නේ ශ්‍රී ලාංකිකයන් බව පිළිගන්නවා ද? එම ගිලන් රථ සේවයේ මුවාවෙන් ඉන්දීය රහස් ඔත්තු සේවයේ සාමාජිකයන් ලංකාවට පැමිණියා ද? මේ පරිත්‍යාගයට විරුද්ධ වී ඔබ රෝගී ජනතාවගේ ජීවත්වීමේ අයිතිය උදුරා ගැනීම සඳහා කුමන්ත්‍රණයක් කළ බව දැන්වත් පිළිගන්නවා ද? යන්න ය.

දේශපාලන බලය වෙනුවෙන් ජනතාව මුලා කිරීම යනු මහා පාප කර්මයක් වනවා සේ ම එය සමාව නොදිය හැකි වරදකි. ඉන්දීය ගිලන් රථ සේවාවට විරුද්ධ වී එම සේවාව පිළිබඳ ව භයානක බිල්ලකු මවා පෙන්වීමට උත්සහ දරූ සියලු ම පිරිස් ඒ බව දැනගත යුතු ය. අසරණ රෝගීන්ගේ ජීවිත සමඟ සෙල්ලම් කිරීම බුද්ධියක් හෝ ආත්මගරුත්වයක් ඇති කිසිවකුට කළ නොහැකි දෙයකි.

ගාමිණී පරණයාපා

පියබඳ

# ලක්මව බැබළූ
# සිත සවි සිරිකත

## නිලූෂිකා ජයවීර



අපේ රටට වැඩි ම විදේශ විනිමයක් උපයා දෙන්නේ විදේශ සේවයේ නියුතු ගෘහ සේවිකාවන්. එසේ උදම් අනමින් ඔවුන්ගේ දහදිය කඳුළු මුසු වූ රන්මසුවලින් මෙරට සුරසැප විඳින ජීවිත කෙතරම් නම් ඇත් ද? එහෙත් ඒ රන්මසු තුළ ගැබ්වෙන ඔවුන්ගේ සැබෑ දුක්මුසු ජීවිත සුවපත් කිරීමට තරම් තවමත් අප සමත් වී නැහැ. රිසානා වැනි දරුවන් අපට අහිමි වන්නේ එහි ප්‍රතිඵලයක් ලෙස. එබඳු පසුබිමක් තුළ මේ කතා කරන්නේ ඊට වඩා හාත්පසින් ම වෙනස් වූ ගමන් මගක් තෝරා ගත් මෙරට දිරිය කාන්තාවක් පිළිබඳ ව යි.

අපේ කතා නායිකාව නිලූෂිකා ජයවීර. ගම, මීගමුව වැලිහේන, කොච්චිකඩේ. එහෙත් ඇය ගැන මුළු රට ම දැන ගන්නේ සිංගප්පූරුවේ ස්ට්‍රේට්ස් ටයිම්ස් (Straits Times) පුවත්පතේ "ව්‍යාපාරිකාවක වී සිංගප්පූරුව හැර ගිය ශ්‍රී ලංකා ගෘහ සේවිකාව" යනුවෙන් පළ කළ පුවතත් සමඟින්. පෙරදී ඇය ගෘහ සේවිකාවක්. දැන් ඇය ව්‍යාපාරිකාවක්. ඇය අන්තර්ජාලය හරහා On line මගින් හොඳ වෙළෙඳ නාම ඇති ශ්‍රී ලාංකේය තේ විදේශ ගැනුම්කරුවන්ට අලෙවි කරනවා. දැන් ඇයට සිටින එම ජාත්‍යන්තර ගැනුම්කරුවන් ගණන 500කට ආසන්න යි. සමහර විට මෙවැනි අය තවත් ඇති. එහෙත් වඩාත් වැදගත් වන්නේ ඇය ගැන පැවසීමට අපට වඩා සිංගප්පූරුව වැඩි අවධානයක් යොමු කිරීම යි. ඊට හේතුව ලොව විද්වතුන් සහ ජීවිතය ජයගත් සාර්ථක පුද්ගලයන් මෙන් ම කීර්තිමත් ව්‍යාපාරිකයන් සහභාගි වන, ඔවුන් අදහස් දක්වන ප්‍රධාන ජාත්‍යන්තර වේදිකාවක ඇයට ද අදහස් දැක්වීමට ආරාධනා කිරීම යි. ඒ, වාර්ෂික ව සිංගප්පූරුවේ පැවැත්වෙන TEDx සමුළුව වෙනුවෙන්. 2016 ඔක්තෝබර් 29 වැනි දා පැවැති එම සමුළුවේදී අපේ කතා නායිකාවට ද අදහස් දැක්වීමට අවස්ථාවක් ලැබෙන්නේ කාගේත් අවධානය දිනා ගනිමින්. බිල්ගේට්ස් වැනි තාක්ෂණික යෝධයන් මෙන් ම එක්සත් රාජධානියේ හිටපු උප ජනාධිපති Al Gore සහ හිටපු ජනාධිපති බිල් ක්ලින්ටන්, ප්‍රධාන පර්යේෂිකාවක වන Jane Goodall වැනි අය අදහස් දක්වන වේදිකාවක ඔවුන් හා සමානව ඇයට ද අවස්ථාවක් ලැබීම පිළිබඳ ශ්‍රී ලාංකිකයන් වශයෙන් අපට ඇත්තේ සැබෑ ආඩම්බරයක්. එහිදී "අධ්‍යාපනය සහ සවිබල ගැන්වීම" යන මාතෘකාව යටතේ අධ්‍යාපනයේ වටිනාකම සහ කාන්තාව සවිබලගැන්වීම පිළිබඳ ඇගේ ජීවිත කතාව සමඟින් ඉදිරිපත් කළ අදහස්වලට ලැබුණේ හොඳ ප්‍රතිචාරයක්. වඩාත් වැදගත් වන්නේ ඉංග්‍රීසි වදනක් හෝ හරිහැටි තේරුම් ගැනීමට නොහැකි ව විදේශගත වන ඇය, අවසානයේ ජාත්‍යන්තර වේදිකාවක උගතුන් වියතුන් මැද ඔවුන් හා සමාන ව කරට කර සිටිමින් ස්වකීය අභිමානයෙන් යුතුව ඒ සෑම අභියෝගයකට ම මුහුණ දීමට තරම් සමත් කාන්තාවක වීම යි.

අද ව්‍යාපාරික කාන්තාවක ලෙස ගත කරන ජීවිතය සැබැවින් ම ඇයට සතුටක් බවත් ඒ පිටුපස ඇය ගෙවූ ජීවිතය ඉතා ම කටුක සහ දුෂ්කර සිදුවීම් හා වේදනාවලින් නො අඩු බවත් මෙලෙස ඇය පවසන්නේ නිරහංකාර අයුරින්. දෙසතිය අමතන නිලූෂිකා: "මම ඉපදුණේ බොහෝම දුප්පත් පවුලක වැඩිමලා ලෙස. මට මල්ලිලා තුන්දෙනෙක් සහ නංගි කෙනෙක් සිටියා. මට වයස අවුරුදු 14 දී මගේ අම්මා නැති වුණා. එතකොට මගෙ පුංචි ම මල්ලිට වයස අවුරුද්දයි මාස ගාණක්. පසු ව එයාලා ඔක්කොම බලාගන්න වුණේ මට. ඒ නිසා මගේ අධ්‍යාපන කටයුතු කර ගන්න

ලැබුණේ නැහැ. අ. පො. ස. (සා. පෙළ) වත් කරගන්න බැරි වුණා. අම්මා නැතිවෙලා අවුරුදු දෙකකට පසු ව තාත්තාත් තුන්වැනි මල්ලීත් කොච්චිකඩේ වැවේ මාලු අල්ලන්න ගිහින් නැවත ගෙදර ආවේ නෑ." ඒ හැඩුම්බර හඬ මොහොතකට නැවතුණේ ඇගේ නෙත් අගට නැගුණු කඳුළු බිඳු නිසා. එලෙස මවත් පියාත් නොමැති පවුලක කිසිදු භාරකරණියක් නොමැති ව ඇයට සිදු වන්නේ තව තවත් අසරණ වීමට. අනතුරු ව ඔවුන් හතරදෙනා හැදී වැඩෙන්නේ මඩම් නිවාස භාරයක. ඔවුන් එකිනෙකා මුණ ගැසෙන්නේ ද අවුරුද්දකට වතාවක්. මේ නිසා ඔවුන්ගේ ජීවිත පිරී තිබුණේ දුකෙන් බව පවසන නිලූෂිකා: "මම ඉගෙනීමට ගොඩක් ආශා කළා. ඒත් අම්මා නැති වුණාට පසු අවුරුදු දෙකක් ම පාසල් යාමට නොහැකි වූ නිසා මා හිටපු කොන්වන්ට් එකෙන් මට ලැබුණේ රැකවරණය විතරයි. අනෙක් ළමයි බලන්න ඒ අයගේ ගෙවල්වලින් කව්රු හරි එනවා. ඒත් මාව බලන්න කවුරුත් ම ආවේ නැහැ. ඒ වෙලාවට මට හරි දුකයි."

අවුරුදු 18න් පසු ව ඇගේ ඥාති නිවසක සිට වසර 3ක් පමණ ඇඟලුම් කම්හලක රැකියාවක නිරත වෙමින් වයස අවුරුදු 21 දී ගෘහ සේවිකාවක ලෙස ඇය විදේශගත වෙන්නේ කෙසේ හෝ තම ජීවිතය ගොඩනගා ගැනීමේ අරමුණින්. නිසි අධ්‍යාපනයක් නොලැබ සිටි ඇයට අධ්‍යාපන සහතිකයක්වත් නොමැති නිසාත් ඉංග්‍රීසි භාෂාව නොදැන සිටීම නිසාත් පවුලේ අය ඇතුළු ව බොහෝ දෙනකු ඇය දුටුවේ දුර්වල කෙනකු ලෙස යි. මේ නිසා විදේශගත වීමට අවශ්‍ය මුදල පවා සොයා ගැනීම අසීරු වී තිබෙනවා. එහෙත් වැදගත් වන්නේ එවැනි පසුබිමක සිට ඇය ජීවිතයට මුහුණ දීමට දරන උත්සාහය යි. වරෙක ඇය සිංගප්පූරුවේ චීන ජාතික නිවෙසක ද තවත් වරෙක ඉන්දියානු නිවෙසක ද සේවය කරමින් අවසානයේ ප්‍රංශ ජාතික නිවසක සේවය කරනවා.

එය ජීවිතයේ වෙනස් ගමනක මූලාරම්භය යැයි කිසි දිනක ඇය නොසිතන්නට ඇති. ගෘහ සේවයේ යෙදෙන අතරතුර සිංගප්පූරුවේ අයිඩා (Aidha) නමැති රාජ්‍ය නොවන සංවිධානයේ මූල්‍ය කළමනාකරණය පිළිබඳ ගෘහ සේවිකාවන් දැනුවත් කෙරෙන පාඨමාලාවකට සියලු වියදම් දරමින් ඇය යොමු කරවන්නේ ඇගේ ස්වාමි දුව වන ප්‍රංශ ජාතික ඔලිවියා




නිලූෂිකා විසින් රචිත
ඉවුම් පිහුම් ග්‍රන්ථය


**වසර 15ක ගෘහ සේවයේ අත්දැකීම් සමඟ ව්‍යාපාරික ලොවට පිවිසෙන නිලූෂිකා මේ වන විට ග්‍රන්ථ කතුවරියක්. සමාජ සේවිකාවක්. සාර්ථක කාන්තාවක්. ඒ, ඇය ස්වෝත්සාහයෙන් ම තම ජීවිතය දිනා ගැනීමට වෙර දැරූ නිසා.**

විසින්. එහෙත් ඊට පෙර සිට ම ඇයට මූල්‍ය කළමනාකරණය කර ගැනීමේ අපූරු හැකියාවක් තිබුණා. ඔලිවියා විසින් සතියක වියදමට දෙන මුදල් අර පිරිමැස්මෙන් වියදම් කර ඇයට ඉතිරි කර දීමට තරම් නිලූෂිකා පළමු ව හොඳ මූල්‍ය කළමනාකාරිණියක් වන්නේ ඇය සේවය කළ නිවසින් ම යි. ගෘහයේ රාජකාරි කටයුතු ද අතපසු නොකරමින් අධ්‍යාපන කටයුතුවල මහත් උත්සාහයෙන් නියැළෙන ඇය අනතුරු ව Aidha පාඨමාලාව සම්පූර්ණ කරන්නේ ව්‍යාපාරික ලෝකයට අත්පොත් තබමින්. ඔලිවියාගෙන් ඊට ලැබුණේ නොමඳ සහායක්.

ඒ අතරතුර ඇය මුල සිට ම සිංගප්පූරුවේ "ස්ට්‍රේට් ටයිම්ස්" පුවත්පතේ අකුරු, වචන ගළපමින් කෙසේ හෝ කියවීමටත්, පල්ලියේ ඉංග්‍රීසි බසින් යුත් දේශනවලට සවන් දීමටත් පුරුදු වී සිටියා. ඊට අමතර ව "Asia work" ආයතනයේ පාඨමාලාවක් ද හදාරමින් සිය දැනුම වඩාත් වර්ධනය කර ගැනීමට යොමු වූ බව යි ඇය සඳහන් කරන්නේ. මේ අතර TEDx ඇමතීම සඳහා තෝරා ගැනෙන්නේ ද ඇගේ දක්ෂතාව මැන බැලීමෙන් අනතුරුව යි. එය සිය ජීවිතයේ වැදගත් සන්ධිස්ථානයක් හා ව්‍යාපාරික කටයුතු සඳහා දිරිදීමක් වූ බව යි ඇගේ සඳහන. මේ වන විට ඇය ඔන්ලයින් (Online) ඔස්සේ විවිධ රටවල ගැනුම්කරුවන්ට ශ්‍රී ලාංකේය නාමය සහිත තේ අලෙවි කරන්නේ තම උගෙනුමෙහි ප්‍රතිඵල නෙළා ගනිමින්. එහිදී හොඳ ඉල්ලුමක් තිබෙන්නේ Black Tea වලට බවත් ස්වාභාවික (Natural) ශාකසාර (Herbal) ඕර්ගනික් (Organic) තේවලට වැඩි ඉල්ලුමක් පවතින බවත් ඇය පවසනවා. ඇගේ ජාත්‍යන්තර ගැනුම්කරුවන් අතරට ප්‍රංශය, මැද පෙරදිග රටවල් සහ ආසියානු රටවල් ඇතුළත්. ලංකාවේ තේ නිෂ්පාදකයන් සමඟ සාකච්ඡා කොට හොඳ වෙළෙඳ නාමයක් සහිත ගුණාත්මක තේ ඇණවුම් යැවීමට යි නිලූෂිකාගේ අපේක්ෂාව. එය වඩාත් දියුණු කර ගැනීම යි ප්‍රධාන අරමුණ.

වසර 15ක ගෘහ සේවයේ අත්දැකීම් සමඟ ව්‍යාපාරික ලොවට පිවිසෙන නිලූෂිකා මේ වන විට ග්‍රන්ථ කතුවරියක්. සමාජ සේවිකාවක්. සාර්ථක කාන්තාවක්. ඒ, ඇය ස්වෝත්සාහයෙන් ම තම ජීවිතය දිනා ගැනීමට වෙර දැරූ නිසා. බොහෝ ගෘහ සේවිකාවන්ට තිබෙන ප්‍රධානතම ගැටලුව වන නිසි මූල්‍ය කළමනාකරණයක් නොමැතිකමින් පවුල් සංස්ථාව පවා බිඳ වැටෙන බවත් එයට ඇති හොඳ ම විසඳුම නිසි අධ්‍යාපනයක් ලැබීම බවත් නිලූෂිකා අවධාරණය කරන්නේ අත්දැකීමෙන්. "මගේ මතය නම් සාමාන්‍ය ලෙස සිටින පුද්ගලයාට වඩා උගත්කමක් සහිත පුද්ගලයාට සමාජයේ ගෞරවයක් තිබෙනවා. විශේෂයෙන් ම කාන්තාවන්ට. ඒ නිසා ගෘහණියට ඉගැන්වීම යනු මුළු පවුලට ම උගැන්වීම හා සමාන යි. එය පවුලට සවියක් මෙන් ම අවසානයේ මුළු රටට ම සවියක්." ඇයට අහිමි වූ පාසල් අධ්‍යාපනය නිසි කල ලබාගැනීමට හැකි වූවා නම් මීටත් වඩා දෛවය වෙනස් වන බවත් ඇය මෙතරම් දුක් නොවිඳින බවත් පවසන්නේ දැඩි අදිටනින් හා විශ්වාසයෙන්. ඒ දිරියට දෙසතිය අපේ ගෞරවය හා සුබපැතුම් !

චම්මි ජයනෙත්ති


අධ්‍යාපන අමාත්‍යාංශය

බලපත්‍රය

පොතේ නම:-............................................ බලපත්‍ර අංකය:-..........................................

කර්තෘ:-.........................................................................................

1952 පෙබරවාරි මස 29 වැනි දින නිකුත් කරන ලද ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ වූ [illegible] ස්වභාෂා, ද්විභාෂා සහ ඉංග්‍රීසි පාඨශාලාවන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 19/ඒ ඡේදය යටතේ අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් තුමන් විසින් පාසල් පුස්තකාල පොතක් වශයෙන් අනුමත කරන ලදී.

විජිත වෙලගෙදර
ලේකම්
අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය

..............මස .... වන දින
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, පැලවත්ත, බත්තරමුල්ල.

බලපත්‍රය අවලංගුවන දිනය:-..........................................

# ගුරුගෙදරට උවමනා පොතපත

## කියවීමට සුදුසු පොත් නිර්දේශ කිරීම

පාසල් දරුවන්ගේ පොත් කියවීම සම්බන්ධයෙන් විවිධ පුද්ගලයන් හා ආයතන බොහෝ සමීක්ෂණ, පර්යේෂණ සිදු කළත් ඒ ඔස්සේ හඳුනාගෙන තිබෙන්නේ දරුවන්ගේ කියවීමේ රුචිය හා එහි ප්‍රමාණාත්මක වෙනස්වීම්. එහෙත් දරුවන් කියවන පොතපත කියවීමට සුදුසු තත්ත්වයේ පවතිනවා ද? යන්න එතරම් අවධානයට යොමු වූ බවක් දක්නට නැහැ. මේ නිසා ම අධ්‍යාපනික වශයෙන් මෙන් ම සමාජයීය වශයෙන් ද ගැටලු පැන නැගී තිබෙන්නේ රටේ අනාගතය පිළිබඳ අවිනිශ්චිත බියක් ද පහළ කරමින්.

පාසල් දරුවන්ට කියවීමට සුදුසු පොත්පත් නිර්දේශ කිරීමේදී රජයේ කාර්යභාරය ක්‍රියාත්මක වෙමින් පැවතියත් ඒ පිළිබඳ සමාජය දැනුවත් නොවීම යි එයට හේතුව. නොබෝදා මේ පිළිබඳ නැවත කතාබහක් ඇති වන්නේ මේ ක්‍රියාවලිය ජනතාව අතරට ගෙන යමින් ඒ සඳහා ජාතික මට්ටමෙන් ක්‍රමවේදයක් සකස් කිරීමේ අවශ්‍යතාව ද හඳුනා ගනිමින්.

මේ සඳහා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරන ආයතනය වන්නේ අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය. 1952 වසරේ පෙබරවාරි 29 ගැසට් පත්‍රය මඟින් මේ ආයතනය පිහිටුවන්නේ ස්වභාෂා, ද්විභාෂා හා ඉංග්‍රීසි පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 19 A ඡේදයට අනුව. මෙහි අරමුණ පාසල්වල භාවිතයට සුදුසු පොත් අනුමත කිරීම හා ඉන් පසු ප්‍රසිද්ධ කිරීමට විධිවිධාන සැලැස්වීම මෙන් ම ප්‍රසිද්ධ විභාගවලට සුදුසු පොත් නියම කිරීම බව යි එවකට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන අධ්‍යක්ෂ ව සිටි එච්. ඩබ්ලිව්. ගවිස් 1950 අංක 27 චක්‍රලේඛය මඟින් පෙන්වා දී තිබෙන්නේ.

මේ සම්බන්ධයෙන් අදහස් දක්වන අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලයේ ලේකම් විජිත වෙලගෙදර : "කුඩා අවධියේ සිට ළමා මනසට සුදුසු හා නිවැරැදි පොත් කියවීමට හුරු කරවීමෙන් දරුවා වැඩිහිටි වූ විට තමාට ගැළපෙන පොත් තෝරා බේරාගෙන කියවීමට නිසි මඟපෙන්වීමක් හා පරිචයක් ලබනවා. මේ නිසා පාසල් පුස්තකාල සඳහා පොත් තෝරා ගැනීමේදී අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය මඟින් ලබා දෙන නිර්දේශය ඇතුළත් බලපත්‍රය සහිත පොත් කෙරෙහි අවධානය යොමු කිරීම ඉතා වැදගත්."

එහෙත් මේ වන විටත් අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය සියලු විදුහල්පතිවරුන්ට චක්‍රලේඛ මඟින් ඒ බව දැනුම් දී තිබුණ ද නිසි ලෙස එය ක්‍රියාත්මක නොවීමත් ගැටලුවක්.


අවධානය යොමු විය යුතු අනෙක් කරුණ වන්නේ එලෙස පාසල් පුස්තකාල සඳහා අනුමත කරන පොත්වල ගුණාත්මක බව කුමන මට්ටමේ පවතින්නේ ද යන්න. මෙහිදී අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය වෙත අනුමැතිය ඉල්ලා යොමු කරන පොත්වල භාෂාව, අක්ෂර වින්‍යාසය, සාහිත්‍යමය නිපුණතාව, එහි සදාචාරමය හා සමාජානුගතභාවය සහ ළමා කෘතියක් නම් එහි චිත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින් එම නිර්ණායක ඔස්සේ සමීක්ෂණ මණ්ඩලයක් මඟින් එය ඇගැයීමට ලක් කරනවා. එහෙත් එය ප්‍රමාණවත් නොවන බැවින් එම නිර්ණායක තවදුරටත් පුළුල් කරමින් කෘතියේ අන්තර්ගත විශ්ලේෂණයක් හා එහි කතා තේමාවේ ගැඹුර මැන බලමින් ඉදිරියේදී සමීක්ෂණ කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරන බව යි අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් පුස්තකාල සංවර්ධන ඒකකයේ අධ්‍යක්ෂ ආර්. එච්. එන්. නාන්දසිරි පෙන්වා දෙන්නේ. මේ වන විට විශේෂයෙන් ළමා කතා පොත්වල තාක්ෂණික කාරණා කෙරෙහි ප්‍රමුඛත්වය දක්වනවා මිස එහි අන්තර්ගතය කෙරෙහි වඩා සැලකිලිමත් නොවීම යි එයට හේතුව. එසේ ම ළමාකතා, යොවුන් සාහිත්‍ය පොත්, විෂයානුබද්ධ හා කවි වැනි පොත් වර්ග ද පොදු නිර්ණායක ඔස්සේ ඇගැයීමට ලක් කිරීම අසීරු නිසා ඉදිරියේදී වෙන වෙන ම ඒවා සඳහා නිර්ණායක සැකසීමට යි ඔවුන්ගේ අපේක්ෂාව.

එසේ සාධාරණ ඇගැයීමට ලක් වන ලේඛකයා එයට නාමයෝජිත වීමෙන් නිර්දේශිත ගුණාත්මක පොතක් දරුවා අතට පත් කළ හැකිවාක් මෙන් ම මුදල හා හැකියාව තිබූ පමණින් ගුණාත්මක බවින් අඩු කියවීමට නුසුදුසු ළමා පොත් පළ කිරීම ද එමඟින් වැළකෙනවා.

කෙසේ වෙතත් මේ කාරණා කෙරෙහි අවධානය යොමු කරමින් ළමා සාහිත්‍ය කෘති ඇගයීම සඳහා නිර්ණායක ඇතුළත් ජාතික පර්යේෂණ ව්‍යාපෘතියක් සකස් කර තිබෙන්නේ කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික පුස්තකාල හා විශ්‍රාපන විද්‍යා ආයතනය විසින්. ඒ, 2012 වසරේදී. එහි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පී. ජී. ප්‍රේමදාස පවසන්නේ තම ආයතනයේ මැදිහත්වීමෙන් සකස් කළ මේ වාර්තාව එවකට අධ්‍යාපන අමාත්‍යාංශය වෙත භාර දී තිබුණ ද එය අනුමත නොවීමෙන් ජාතික කර්තව්‍යයක් ඉටු කිරීමට තමන් ගත් උත්සාහය නිෂ්ඵල වැටුණු බව.

ඒ පිළිබඳ වැඩිදුරටත් අදහස් දක්වන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පී. ජී. ප්‍රේමදාසඃ "අප මේ පර්යේෂණ ව්‍යාපෘතිය සකස් කළේ අදියර

**අවධාරණය කළ යුතු කාරණය වන්නේ පාසල් දරුවන්ගේ ගුණාත්මක කියවීම ඉහළ නැංවීමට නම් රජයේ පූර්ණ අවධානය හා මැදිහත්වීම අවශ්‍ය බව මෙන් ම එයට ප්‍රතිපත්තිමය තීරණ මත කඩිනමින් විධිමත් වැඩපිළිවෙළක් සකස් කළ යුතු බව.**




කිහිපයක ප්‍රායෝගික වැඩමුළු හා ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගේ සහභාගිත්වය ද ලබා ගනිමින්. මේ සඳහා අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, සංස්කෘතික දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා සෞන්දර්ය විශ්වවිද්‍යාලය, Room to Read වැනි ආයතනවල පූර්ණ දායකත්වය ලැබුණා. එසේ ම විෂය පිළිබඳ මහාචාර්යවරු, ලේඛකයන්, චිත්‍ර ශිල්පීන්, විදුහල්පතිවරුන්, ගුරුවරුන්, පාසල් පුස්තකාලයාධිපතිවරුන් මෙන් ම පාසල් දූ දරුවන් ද ක්‍රියාකාරී ව සහභාගි වුණා. එහිදී ළමා කතා සාහිත්‍ය පොතක් රචනා කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙළ සහ එහි සමස්ත ඇගයීම සඳහා ප්‍රධාන නිර්ණායක පහක් හඳුනා ගැනුණා. එම නිර්ණායක වන්නේ සාහිත්‍යමය අංග, පිංතූර හා චිත්‍ර භාවිතය, භාෂා භාවිතය, පොතෙහි සමස්ත අන්තර්ගතය හා පොතෙහි භෞතික නිමාව යි."

මේ කාරණා විමසන විට පෙනී යන්නේ රටේ ක්‍රියාකාරී සැලසුම් සකස් වුව ද එය ක්‍රියාත්මක වීමේ පසුගාමීත්වයක්. කෙසේ වෙතත් මේ පර්යේෂණ ව්‍යාපෘතිය ද සැලකිල්ලට ගනිමින් ඉදිරියේදී පාසල් පුස්තකාල සංවර්ධන ඒකකය මේ කටයුතු විධිමත් කිරීමට අපේක්ෂා කිරීම පැසසිය යුතු කරුණක්.

මෙවැනි පසුබිමක් ගොඩනැගී තිබුණ ද එනම්, පොදු සම්මුතියක් ජාතික මට්ටමින් මේ සඳහා ප්‍රකාශයට පත් වී නොතිබුණ ද ළමා සාහිත්‍ය කෘති පරිශීලනය විධිමත් ලෙස ඇතැම් පාසල්වල සිදු වන බව පෙන්වා දෙන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පී. ජී. ප්‍රේමසිරි: "පාසලේ උගන්වන විෂය කාරණා ආදියට මුල් වන්නේ දරුවාගේ මොළයේ වම්පස. සමබර දරුවකු බිහි කිරීමට නම් සාහිත්‍යය, සෞන්දර්යය, කලාව ආදිය මඟින් මොළයේ දකුණු පස වර්ධනය වීමත් අත්‍යවශ්‍ය යි. එවිට පරිපූර්ණ යහපත් පුරවැසියකු බිහි වෙනවා."

ඕස්ට්‍රේලියාව, නවසීලන්තය වැනි රටවල පාසල් විෂය මාලාව තුළ ගුණාත්මක බවින් යුතු ළමා හා යොවුන් සාහිත්‍යය ඉගැන්වීම ම ඔවුන් අන්‍යයන්ට ගරු කරන ප්‍රජාවක් බවට පත් වීමට හේතු වී ඇති බවත් ඔහු පෙන්වා දෙනවා. මේ නිසා සාහිත්‍ය පරිශීලනයට හුරු කරවීමෙන් එතෙක් විෂය කාරණා ඉගැන්වීමෙන් සිදු වන මතකය, අවබෝධය හා භාවිත කිරීම යන පහළ මට්ටමේ සිතීමේ කුසලතාව විශ්ලේෂණය, ඇගැයීම හා එමඟින් අලුතින් දෙයක් තැනීම යන ඉහළ මට්ටමේ සිතීමේ කුසලතාව දක්වා වර්ධනය වන බවත් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පී. ජී. ප්‍රේමසිරි සඳහන් කළ කරුණක්.

මේ අනුව පෙනී යන්නේ ගුණාත්මක බවින් පිරිපුන් පොත් දරුවන්ගේ පරිශීලනයට යොමු කිරීමේ අවශ්‍යතාව. වර්තමානයේ අඩු මුදලට වෙළෙඳපොළේ දරුවන්ට නුසුදුසු පොත් අලෙවි වුව ද දෙමාපියන් මෙන් ම දරුවන් ද ඒවා මිල දී ගැනීමට පෙලඹෙන්නේ අඩු දැනුවත්භාවය නිසා.

විශේෂයෙන් වර්තමානයේ පළවන ළමා කතා පොත්වල ප්‍රමිතියක් නැතිකම නිසා පොත් මිල දී ගැනීමේදී දෙවරක් සිතා බලන බව පවසන ඉහළ බෝමිරිය කනිෂ්ඨ විද්‍යාලයේ විදුහල්පති උදය රුවන් මල්ලිකාරච්චි: "රජය මඟින් දරුවන්ට කියවීමට සුදුසු පොත් නිර්දේශ කිරීමේ මෙවැනි විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වන බව අප නිසි ලෙස දැනුවත් වී නැහැ. මසකට වරක් කලාපයේ විදුහල්පතිවරුන් රැස්වන නිසා එවැනි දිනෙක අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් මේ පිළිබඳ ඔවුන් දැනුවත් කළහොත් එය වටිනා, වැදගත් පියවරක් වේවි."

එබැවින් අවශ්‍ය වන්නේ පරිශීලනයට සුදුසු පොත් පළ කිරීම, විකිණීම, මිල දී ගැනීම පිළිබඳ විදුහල්පතිවරුන්, ගුරුවරුන්, දෙමාපියන් මෙන් ම දරුවන් ද දැනුවත් කිරීමේ වැඩපිළිවෙළක්.

එසේ ම ගුණාත්මක බවින් අඩු කියවීමට නුසුදුසු පොත් වෙළෙඳපොළට එක්වීම කැපවීමෙන්, වැඩි ප්‍රාග්ධනයක් යොදමින් ගුණාත්මක බවින් යුත් පොත් රචනා කරන ලේඛකයන් ද පත් කරන්නේ අධෛර්යයට. මේ නිසා පාසල් දරුවන්ට කියවීමට සාහිත්‍ය පොත් නිර්දේශ කිරීමේදී ජාතික මට්ටමේ පොදු නිර්ණායක පද්ධතියකින් එය සමීක්ෂණයට භාජනය කිරීම අත්‍යවශ්‍ය කරුණක්.

ඒ බව සඳහන් කරන ලේඛක නුවන් කුමාර කටුගම්පල: "ළමා කතා මෙන් ම ළමා ගීත රචනයෙහි ද යෙදෙන ලේඛකයෙක් ලෙස මා මේ කාරණය දකින්නේ සුබවාදී ලෙස. විෂය ප්‍රාමාණිකයන්ගෙන් සැදුම්ලත් කණ්ඩායමකින් ජාතික මට්ටමේ පොදු නිර්ණායක මඟින් ළමා සාහිත්‍ය පොත් ප්‍රමාණවත් ඇගැයීමකට ලක් කිරීම වැදගත්. එසේ නොවුණහොත් වැරදි පණිවිඩයක් ළමා මනසට ඇතුළු වීමෙන් අනාගතයේ ඔහුට පමණක් නොව සමස්ත සමාජයට ම සිදු වන්නේ හානියක්. එසේ ම ළමා සාහිත්‍ය පොතක් නිර්මාණය කිරීම සාමූහික කාර්යයක් වුවත් ඒ පාර්ශ්වකරුවන් සියලු දෙනා ම වෘත්තීය මට්ටමේ සුදුස්සන් වීම සාර්ථක ළමා සාහිත්‍ය කෘතියකට මඟ පාදන බව යි මගේ විශ්වාසය. මේ නිසා අවිධිමත් ලෙස සිදු වන පොතපත සමාජගත වීම වැළැක්වීමට ජාතික මට්ටමෙන් ක්‍රමවේදයක් අවශ්‍ය යි."

මේ කාරණා ඉටු කිරීමේදී විශේෂයෙන් ග්‍රන්ථ සමීක්ෂණ කටයුතුවලදී සමීක්ෂකයන් මෙන් ම ලේඛකයන් යන දෙපිරිස ම සතුටට පත් කිරීමේ අභියෝගය ද පවතින බව අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලයේ ලේකම් විජිත වෙලගෙදර පවසනවා. ඒ, සමීක්ෂකයන් ඉටු කරන කාර්යභාරය වෙනුවෙන් ප්‍රමාණවත් මුදලක් ගෙවීම මෙන් ම එය ඇරිය යුත්තේ ලේඛකයන් වන නිසා ඔවුන්ට වැඩි වැය බරක් පැටවීම කළ නොහැකි කාර්යයක් වීම.

මේ නිසා මෙහිදී අවධාරණය කළ යුතු කාරණය වන්නේ පාසල් දරුවන්ගේ ගුණාත්මක කියවීම ඉහළ නැංවීමට නම් රජයේ පූර්ණ අවධානය හා මැදිහත්වීම අවශ්‍ය බව මෙන් ම එයට ප්‍රතිපත්තිමය තීරණ මත කඩිනමින් විධිමත් වැඩපිළිවෙළක් සකස් කළ යුතු බව.

පී. ජී. මාලා මල්කාන්ති



## ජීවිතයක පිය සටහන්

# ඇරඹුමේ නියමුවා

### දෙසතියේ ප්‍රථම සංස්කාරක
### සිරිල් බී. පෙරේරා

**දෙසතිය සඟරාවේ ප්‍රථම සංස්කාරක වූ සිරිල් බී පෙරේරා මහතා මිය ගියේ 1989 ජනවාරි 20 වැනි දා යි. දෙසතියට තිස් නව වසරක් සපිරෙන මේ අවස්ථාවේ ඔහු පිළිබඳ කෙටි සටහනක් මෙසේ ලියැවෙනවා.**

මෙරට ප්‍රථම පුවත් සඟරාව ලෙස දෙසතිය 1978 පෙබරවාරි මාසයේ ප්‍රකාශයට පත් කරන විට එහි ප්‍රථම සංස්කාරක වීමේ භාග්‍යය ඔහුට හිමිවුණා. මීට පෙර නොතිබුණ පුවත් සඟරා සංකල්පය මුල්කර ගනිමින් ප්‍රවෘත්ති විශේෂාංගවලින් සඟරාව සැරසීමට ඔහුට හිමිවුණේ භාරදූර වගකීමක්. ඒ වගකීම කරට ගත්තේ සිනමා විචාරකයකු, කෙටිකතාකරුවකු, නවකතාකරුවකු, ලේඛකයකු, සිනමා පිටපත් හා ගීත රචකයකු ලෙස නමක් දිනා සිටි සිරිල් බී පෙරේරායි. ආචාර්ය සරත් අමුණුගම මහතාගේ අධීක්ෂණයෙන් යුතු ව දෙසතිය රටට ආයාද කරන්නට උරදුන්නේ ඔහු යි. 1978 සිට ..... දක්වා ඔහු දෙසතිය සංස්කාරක ලෙස නැවුම් පුවත් විශේෂාංග මෙරට ට ලබාදුන්නා. අප අද උත්සාහ කරන්නේ කෙටි සටහනක් තබමින් ඔහු පිළිබඳ අනුස්මරණය කිරීමට යි.

සිරිල් බී පෙරේරා නමැති ලේඛකයා තම මතය රටට ආයාද කරන්නට කිසි විටෙකත් පැකිළුණේ නැහැ. සෘජු මෙන් ම නිශුණුව භාෂාව හැසිර වූ ඔහු ඉංග්‍රීසි භාෂාව ද මනාව හසුරුවමින් එහි උපරිම ඵල නෙළුවා. සිංහල ජාතිය පුවත්පතේ උප කර්තෘවරයෙක් ලෙස මුලදී කටයුතු කළ ඔහු ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ ද සේවය කළේ ඉංග්‍රීසි, සිංහල ද්විභාෂා හැසිරවීමේ නිපුණතාව හේතුවෙන්. ලෝකයේ සිදුවන බොහෝ දේ පිළිබඳ පුළුල් බුද්ධියකින් යුතුව විචාරශීලී ව බැලීමට ඔහු සතු වූයේ නිසග හැකියාවක්.

දෙසතිය සඟරාව ආරම්භ කරන විට ඒ සඳහා සංස්කාරකවරයකු තෝරාගැනීමේ ගැටලුවට එදා ආචාර්ය සරත් අමුණුගම මුහුණදුන්නා. ජී. ඩබ්ලිව්. සුරේන්ද්‍ර, ඔගස්ටස් විනායාගරත්න ආදී ප්‍රවීණ කලාකරුවන් හා ලේඛකයන් ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සේවය කරද්දී ඔවුන්ගේ යෝජනාව වුණේ දෙසතිය සංස්කාරක තනතුරට නියම පුද්ගලයා සිරිල් බී පෙරේරා බව යි. අතීත අත්දැකීම් සිහිපත් කරන ආචාර්ය සරත් අමුණුගම පවසන්නේ 'අපේ කට්ටිය' නමින් සැදුම්ලත් කලාකරුවන් පිරිසේ යෝජනාව වුණේ ඔහු ව යි. එදා 'අපේ කට්ටිය' නමින් 1962දී බිහි වූ නාට්‍ය කලා සංවිධානය පිහිටුවීමට මුල් වූ කලාකරුවන් පස් දෙනාගෙන් එක් අයෙක් වන්නේ ඔහු යි. අනෙක් හතරදෙනා වුණේ සුගතපාල ද සිල්වා, ඇලෙක්ස් රණසිංහ, ජී. ඩබ්. සුරේන්ද්‍ර හා විපුල ධර්මවර්ධන.

මෙරට සිනමා විචාර කලාවේ ඔහු විදග්ධ විචාරකයෙක්. සිනමා කෘතිය පිළිබඳ ගැඹුරින් විචාරයට ලක් කරමින් සාරගර්භ දෘෂ්ටියකින් බැලීම ඔහුගේ සහජ දක්ෂතාවක්. සිංහල සිනමා විෂයෙහි ඔහු විසින් වරින් වර පළකරන ලද අදීන මත හා සංකල්පනා විවාදයට පවා තුඩු දුන්නා. සිනමා ලේඛක සුනිල් මිහිඳුකුල පවසන පරිදි "එක් නිදසුනක් නම් වරක් ඔහු මතයක් පළ කළේ දේශීය සිනමාවක් කියා දෙයක් නොමැති බව යි. මෙය විවාදයට ලක්වන්නක් වුවත් සිය මතය පළකිරීමට තරම් ඔහු එඩිතර වුණා."

කාලයෙන් උපරිම ප්‍රයෝජනය ගත් ආකාරය ඔහුගේ බිරිඳ කැලිස්ටා ඉග්නේෂියා පෙරේරා මහත්මිය හා දරුවන් දෙසතියට විස්තර කරමින් "ඕන වෙලාවක පොතක් කියවනවා. කොයිම වෙලාවකවත් නිකං හිටියේ නැහැ. සරල ව කිව්වොත් වැසිකිළියට යන විට පවා පොතක් ගෙනගොස් කියවීම ඔහුගේ පුරුද්දක් වුණා. මේක කෙනකුට විහිළුවක් වගේ පෙනුණට ඔහු ඒ කාලයෙනුත් පොතක පිටු ගණනාවක් කියෙව්වා."

සිරිල් බී. දක්ෂ පරිවර්තකයකු මෙන් ම, දක්ෂ විදේශ වාර්තා විචාරකයකු ද වුණා. කාර්යබහුල වෘත්තීය ජීවිතයක් ගත කළ




කැලිස්ටා ඉග්නේෂියා පෙරේරා මහත්මිය

ඔහු පිළිබඳ ඉවසීමේ සිතින් යුතු ව විවාහ ජීවිතයක් ගතකරන්නට කැලිස්ටා මහත්මිය දක්ෂ වීමෙන් ඔහුගේ ශාස්ත්‍රීය කටයුතුවලට ලැබුණු ධෛර්යයත් ආලෝකයත් වචනයෙන් විස්තර කිරීමට බැරි තරම්. දෑන්වීම් කලා ක්ෂේත්‍රයේ නිපුණයකු වූ ඔහු සතුව ක්ෂණ ගණනාවක ම සිය දක්ෂකම් විදහා පෑම විශේෂත්වයක්. ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ හා ජේ. ආර්. ජයවර්ධනගේ වාර්තා චිත්‍රපට සඳහාත් 'වසන්ති' වෘත්තාන්ත චිත්‍රපටය සඳහාත් තිර පිටපත රචනා කළා. එපමණක් නො ව 'ගමනේ කෙළවර මරණය හමුවේ', 'ගලනා සුන්බුන් පාවෙන අනන්ත සාගරේ' වැනි චිත්‍රපට ගීත ද ඔහු අතින් රචනා වුණා. මෙසේ ම 'මර මර කොටා දමසද්සදං', මාමිනි මාමිනි මාදෙයියා වැනි ජනප්‍රිය ගීත ද රචනා කළේ සිරිල් බී පෙරේරා බව කැලිස්ටා පෙරේරා මහත්මිය දෙසතියට පවසා සිටියා. එහෙත් එම ගීත දෙකෙහි රචකයා ලෙස මුල් කාලයේ ඔහුගේ නම ප්‍රචාරය වුවත් පසු ව වෙනත් අයගේ නමින් ප්‍රචාරය වීම කනගාටුවට කාරණාවක් බවයි ඇය පෙන්වා දෙන්නේ.

'නිබුල්පු', 'මරණ තුනක් ඇති මිනිහෙක්', 'මොහොතින් මොහොත' යන කෘති ඔහු අතින් රචනා වූ කෙටිකතා හා නවකතා යි. මීට අමතර ව ඔහුගේ ජීවිත කතාව අළලා පළ නොවුණු කෘතියක් ද රචනා වී තිබෙනවා. එය ඉදිරියේදී පාඨකයන් අතට පත්කිරීමටයි ඔහුගේ බිරිඳ ඇතුළු දූ දරු පිරිසේ උත්සාහය.

යූමින් මායාදුන්නේ



# සොබා දහම උරණ වෙලා නියඟ වළා රටම වසා

# නියඟය

**සොබාදහම** උදහස් වෙලා. නියඟය මුළු රට ම වෙලා ගෙන. ගොවිතැනට, විදුලිය නිපදවීමට, පානයට, ගේ දොර කටයුතුවලට අවශ්‍ය ජලය පිළිබඳ ව ඇත්තේ මහත් අර්බුදයක්. මනුෂ්‍යයාට පමණක් නොව සත්ත්ව සීපාවාට සහ ගහ කොළට ද මේ නියඟය ගෙන දී ඇත්තේ මහත් පීඩාවක්.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පෙන්වා දෙන්නේ නියඟයෙන් පීඩා විඳින පවුල් සංඛ්‍යාව 260055ක් වන අතර එමඟින් පීඩාවට පත් පුද්ගල සංඛ්‍යාව 1072392ක් බව.

ත්‍රිකුණාමලය, හම්බන්තොට, මොණරාගල, අනුරාධපුරය, යාපනය, මඩකලපුව, බදුල්ල, පුත්තලම, මන්නාරම, මුලතිව් යන දිස්ත්‍රික්කවලට මේ නිසා සිදු වී ඇත්තේ උග්‍ර පානීය ජල හිඟයකට මුහුණ පෑමට බව යි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පවසන්නේ.

නියඟය කෘෂිකර්මාන්තයට සහ ජල විදුලිය නිෂ්පාදනයට ද කරන්නේ හරි ම අරියාදුවක්. වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් සමන් වීරසිංහ මහතා පවසන්නේ සිය දෙපාර්තමේන්තුවට අයත් ජලාශ 127ක සාමාන්‍ය ජල ධාරිතාව 23% දක්වා පහත බැස ඇති බව.

ඉතිරි ව ඇති මේ ජල සොච්චම කළමනාකරණය කිරීම වාරිමාර්ග දෙපාර්තමේන්තුව මුහුණ දී ඇති අභියෝගයක්. අධ්‍යක්ෂතුමා පවසන්නේ ඉන් 13%ක් කෘෂිකර්මාන්තය සඳහාත් 10%ක් පානීය ජලය සඳහාත් ලබා දීමට කටයුතු කරන බව.

එය පොඩි සහනයක් පමණක් වන අතර ප්‍රශ්නයට විසැඳුමක් නම් නො වෙයි. විසැඳුමක් ලබා දිය හැක්කේ වැස්ස වලාහක දෙවියන්ට පමණක් බව යි කිව යුත්තේ.

වාරිමාර්ග අධ්‍යක්ෂවරයා ම පිළිගන්නේ දැනට වගා කරනු ලැබ ඇති කුඹුරු අක්කර 35000ක පමණ වගාව රැක ගැනීම අභියෝගයක් වී ඇති බව. නියඟයකට ප්‍රධාන හේතු ලෙස සැලකෙන්නේ ප්‍රමාණවත් වැසි නොලැබීම, පොළොව හෙළි පෙහෙළි වීම නිසා පාංශු ඛාදනය, ලැබෙන වර්ෂාව පොළොවට උරා ගැනීමට නොහැකි වීම යන කරුණු.

**මේ ඉඩෝරය තවත් දරුණු වන්නට තිබියදී එයට මඳ අස්වැසිල්ලක් වූයේ 2016 මැයි මාසයේ 13, 14 සහ 15 දිනවල දිවයිනට තද වැසි ඇද හැලීම නිසයි. කලින් ඇති වූ අඩුව එයින් සපිරුණු අතර තවමත් යැපෙන්නේ එසේ ලැබුණු ජලයෙන්.**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අනාවැකි අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා අනූෂා වර්ණසූරිය පවසන්නේ 2015 දෙසැම්බර් මාසයෙන් ආරම්භ වූ ඊසාන දිග මෝසමේ ඔක්තෝබර්, නොවැම්බර් යන මාසවලදී ප්‍රමාණය ඉක්මවා වැසි ලැබුණත් ඊසාන දිග මෝසමේ ඉතුරු මාස තුළ එනම්, 2016 ජනවාරි, පෙබරවාරි මාසවලදී ප්‍රමාණවත් වැසි නො ලැබුණු බව.

මාර්තු, අප්‍රේල් යන අන්තර් මෝසම් මාසවල සාමාන්‍යයෙන් ලැබෙන්නේ මුළු වර්ෂා ධාරිතාවෙන් 16%ක් පමණ වන නමුත් 2016 දී ඒ වර්ෂාව ද නො ලැබී ගිය බව යි වර්ණසූරිය මහත්මිය අවධාරණය කරන්නේ.

මෝසම් වැසි නිසි පරිදි සක්‍රිය නොවී ඇති වූ විකෘතිතාව යි, සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවට ලැබෙන වැසි ජලය නො ලැබී යාමට හේතුව. ඒ පිළිබඳ ව වර්ණසූරිය මහත්මිය කරුණු පැහැදිලි කළේ මෙලෙස: "මැයි සිට සැප්තැම්බර් දක්වා ආරම්භ වන්නේ නිරිත දිග මෝසම් කාලය. රටේ මුළු වැසි ධාරිතාවෙන් 30%ක් පමණ මාස 5ක වැසි කාලය තුළ ලැබෙනවා. එසේ ම ඔක්තෝබර් - නොවැම්බර් දෙ වැනි අන්තර් මෝසමේදී, නිරිත දිග මෝසමෙන් ලැබෙන 30% ට සමාන ධාරිතාවක් ලැබෙනවා. මෙය විශේෂ තත්ත්වයක්. හේතුව නිරිත දිග මෝසමේදී මාස 05ක කාලයක් තුළ ලැබෙන්නා වූ වර්ෂාපතනය දෙ වැනි අන්තර් මෝසම් කාලය තුළ මාස දෙකක් ඇතුළත ලැබීම."

එහෙත්, ඇය පෙන්වා දෙන පරිදි 2016 වසරේදී ඒ විශේෂතාව ඇති නොවී සාමාන්‍ය මට්ටමෙන් හෝ වර්ෂාව නොලැබී මේ වන විට රටට දරුණු ඉඩෝරයකට මුහුණ දීමට සිදු වී තිබෙනවා. මේ ඉඩෝරය තවත් දරුණු වන්නට තිබියදී එයට මඳ අස්වැසිල්ලක් වූයේ 2016 මැයි මාසයේ 13, 14 සහ 15 දිනවල දිවයිනට තද වැසි ඇද හැලීම නිසයි. කලින් ඇති වූ අඩුව එයින් සපිරුණු අතර තවමත් යැපෙන්නේ එසේ ලැබුණු ජලයෙන්.

දැනට පවතින නියගය වහා අවසන් වනු ඇති බව සිතීමට ඇත්තේ අල්ප ඉඩකඩක්. හේතුව, මේ වසර මුල් මාසවල තද වැසි අපේක්ෂා කළ නොහැකි වීම යි. සාමාන්‍යයෙන් ජනවාරි, පෙබරවාරි මාසවල ශ්‍රී ලංකාවට තද වැසි නො ලැබෙන අතර ප්‍රමාණවත් වැසි අපේක්ෂා කළ හැක්කේ මාර්තු, අප්‍රේල් අන්තර් මෝසම් කාලයේදී බවයි ඇය වැඩි දුරටත් සඳහන් කළේ.

නියගයේ අහිතකර බලපෑම තදින් දැනෙන ප්‍රධාන දිස්ත්‍රික්කයක් වන්නේ මහනුවර. කොත්මලේ, පොල්ගොල්ල, වික්ටෝරියා, රන්දෙනිගල, රන්ටැඹේ, බෝවතැන්න ආදී ප්‍රධාන ජලාශ ගණනාවක් ම ඇත්තේ ද ඒ දිස්ත්‍රික්කය තුළ. මහනුවර දිස්ත්‍රික් ලේකම්, එච්. එම්. පී. හිටිසේකර පෙන්වා දෙන්නේ මේ ජලාශවල ධාරිතාව 40% පමණ දක්වා පහත බැස ඇති බව. මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටි මහා ගොවි ජනපද ව්‍යාපාරය වන හසලක වගා බිම්වලින් මෙවර වගා කර ඇත්තේ 60% - 70% ක් පමණ වන නමුත් මේ වන විට ඒවාට ද ප්‍රමාණවත් ජලය ලබා දීම ගැටලුවක්. නියගය නිසා දිස්ත්‍රික්කය මුහුණ දී ඇති ගැටලුවලට කඩිනම් හා දිගුකාලීන විසැඳුම් ලබා දීමට මේ වන විටත් පියවර ගෙන තිබෙනවා. පානීය ජලය හිඟ වී ඇති ප්‍රදේශවලට බවුසර් මඟින් ජලය ලබා දීම ද සිදු කැරෙන බවත් දැනට අක්‍රිය වී ඇති නළ ළිං ප්‍රතිසංස්කරණයට කටයුතු කිරීම ද ගෙන ඇති තවත් පියවරක් බව යි ඔහු පවසා සිටියේ.

මේ ක්ෂණික ක්‍රියාමාර්ගවලට අතිරේක ව ඉදිරියේ ඇති විය හැකි නියගයන්හි විපාක අවම කිරීම සඳහා දිගුකාලීන විසැඳුම් සඳහා ද මහනුවර දිස්ත්‍රික්කය අවධානය යොමු කරලා. ජලපෝෂක ප්‍රදේශ 101ක් හඳුනා ගෙන තිබෙන අතර ඒවා සහ පරිසරය සංරක්ෂණය කිරීම පිණිස විශේෂ වැඩසටහනක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ආරම්භ කර ඇති බව යි දිසා ලේකම්වරයා සඳහන් කළේ. මහනුවර දිස්ත්‍රික්කයේ එවැනි ව්‍යාපෘති 14ක් ක්‍රියාත්මක කරන්නේ හඳුනාගැනීම අධිකාරියෙන්. පවතින ජලාශවල රොන් මඩ ඉවත් කර නියගයට ඔරොත්තු දෙන ලෙස ජල ධාරිතාව සැකසීමේ වැඩපිළිවෙළක් ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව ලවා ඉටු කර ගැනීමට ද යෝජිත වන්නේ දිගුකාලීන විසැඳුම්වල එක් කාර්යයක් වශයෙන්.

අනුරාධපුර දිස්ත්‍රික්කය ම සැලකෙන්නේ එක ම කෘෂිකාර්මික ප්‍රදේශයක් හැටියට. නියං තත්ත්වය නිසා අති විශාල පීඩනයකට පත් ව තිබෙන්නේ එහි ගොවි ජනතාව. අනුරාධපුර දිසා ලේකම් ආර්. එම්. වන්නිනායක පවසන්නේ වෙනත් වර්ෂවල වගා කටයුතු ආරම්භ කරන විට ජලාශ පිරී තිබුණත් මේ කන්නයේ ජල මට්ටම 40%ට බැස ඇති බව. ඒ නිසා වෙනදා වී වගා කරන ප්‍රමාණයෙන් මේ කන්නයේ වගා කර ඇත්තේ 33%ක් පමණයි. එමෙන් ම වෙනත් බෝග ද වගා කර ඇත්තේ 57%ක ප්‍රමාණයක් බව යි වන්නිනායක මහතා පවසා සිටියේ.

නියඟ මේ වගා බිම්වලට බලපාන්නේ කොයි ආකාරයට ද යන පැනයට පිළිතුරු දෙන වන්නිනායක මහතා: "මේ වගාව බේරා ගැනීම අවදානමක යි පවතින්නේ. ගොවිතැන ජීවනෝපාය කර ගත් පිරිස ලක්ෂ 3ක් පමණ. ඔවුන්ගේ ජීවිකාව නැති වී තිබෙනවා. ගොවිපවුල් සම්බන්ධ කර ගෙන වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කරන ලෙස ජනාධිපතිතුමාගෙන් උපදෙස් ලැබී තිබෙනවා. වගා ළිං 13000ක් පමණ දිස්ත්‍රික්කයේ තිබෙන අතර ඒවා ද ප්‍රතිසංස්කරණය කිරීමට යි පියවර ගැනෙමින් තිබෙන්නේ."

පානීය ජලය හිඟ ප්‍රදේශවලට බවුසර් මඟින් ජලය සැපයීමට අනුරාධපුර දිස්ත්‍රික්කයේ ද පියවර ගෙන තිබෙනවා. ඒ සඳහා යුද හමුදාවේ ද සහාය ලැබෙන්නේ ජල බවුසර් ද සපයා දෙමින්. දැනට ජල බවුසර් 17ක් ද ජල ටැංකි 450ක් ද දිසා ලේකම් කාර්යාලයට ලැබී ඇති බව යි දිසා ලේකම්වරයා ප්‍රකාශ කළේ. එසේ වුව ද අනුරාධපුර වැව්වල ජලය තව තවත් පහළ වැටුණහොත් පානීය ජල සැපයුම ද පත් වෙනු ඇත්තේ අසීරුතාවට.

"දැනට නුවර වැවේ ජල ධාරිතාව ඇත්තේ අක්කර අඩි 9000ක පමණ මට්ටමක. එය අක්කර අඩි 6000 තෙක් පහළ වැටුණහොත් නාගරයට ජලය සැපයීම ප්‍රශ්නයක් විය හැකි යි. නුවර වැවට ජලය අක්කර අඩි 3000ක්වත් ලබා දෙන ලෙස මහවැලි ජල පාලන කමිටුවෙන් ඉල්ලා තිබෙනවා"

දිසා ලේකම් වන්නිනායක මහතා වැඩිදුරටත් සඳහන් කළේ ආපදාවට පත් පවුල්වලට නියං සහනාධාර ලබා දීමේ වැඩ පිළිවෙළක් ද ක්‍රියාත්මක බව.

නියඟයෙන් බැට කන තවත් දිස්ත්‍රික්කයක් වන්නේ කුරුණෑගල. ග්‍රාම සේවා වසම් 149ක පවුල් 17498ක් නියඟයෙන් පීඩාවට පත් ව ඇති බව යි ගණන් බලා ඇත්තේ. දිස්ත්‍රික් ලේකම් ගාමිණී ඉලංගරත්න ප්‍රකාශ කරන්නේ මේ වන විට වගා බිම් හෙක්ටයාර් 16000ක් හානියට පත් ව ඇති බව.

වගාවනට ජලය මෙන් ම පානීය ජල සැපයුම ද නියඟය නිසා ලක් ව තිබෙන්නේ අභියෝගයක් බවට. "පානීය ජලය සැපයෙන්නේ කුරුණෑගල වැවෙන්. එහි ජල ධාරිතාව ඝන මීටර් ලක්ෂ 6ක් - 7ක් පමණ. දිනකට පරිභෝජනය ඝන මීටර් 60000ක්" බව පවසන දිසා ලේකම්වරයා ප්‍රකාශ කළේ ජල ප්‍රශ්නයට මුහුණ දීම සඳහා මේ වන විට ජල බවුසර් 73ක්, ජල ටැංකි 1877ක් සූදානම් බව. තත්ත්වය තවත් උග්‍ර වුවහොත් තවත් ජල බවුසර් 32කුත්, ජල ටැංකි 1200කුත් සපයා ගැනීමට අවධානය යොමු වෙලා.

නියඟයට මුහුණ දීමට හා ජනතාවට විසැඳුම් ලබා දීමට සියලු ම ප්‍රාදේශීය ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ද ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ද සම්බන්ධීකරණයෙන් යුතු ව කටයුතු කරන බව යි ඉලංගරත්න මහතා පෙන්වා දුන්නේ.

නියඟය තදින් බල පා ඇති පෙදෙස්වල මේ ආකාරයට විසැඳුම් ක්‍රියාත්මක වන අතර සමස්ත වගකීම උසුලන්නේ රජය. ඒ වගකීම ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ඉටු කරන්නේ පළාත් පාලන ආයතන ද ඇතුළු ව සියලු රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කරමින්. දෙසතියකට වරක් සියලු ම දිස්ත්‍රික් ලේකම්වරුන් ඒකරාශි කරමින් ආපදා කළමනාකරණ අමාත්‍යතුමා පවතින තත්ත්වය සාකච්ඡා කරන්නේ ගත යුතු පියවර තීන්දු කිරීමට.

**නියඟය තදින් බල පා ඇති පෙදෙස්වල මේ ආකාරයට විසැඳුම් ක්‍රියාත්මක වන අතර සමස්ත වගකීම උසුලන්නේ රජය. ඒ වගකීම ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ඉටු කරන්නේ පළාත් පාලන ආයතන ද ඇතුළු ව සියලු රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කරමින්.**

මේ වන විට ජනතාව හා ජනමාධ්‍ය සම්බන්ධීකරණය සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ තොරතුරු කේන්ද්‍රයක් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු පරිශ්‍රයේ ස්ථාපිත කරලා. නියඟය පිළිබඳ තොරතුරු හා දත්ත මාධ්‍යයට ඒ ඔස්සේ සැපයෙන අතර අනෙකුත් අමාත්‍යාංශ සමඟ එක් ව ජනතාව දැනුම්වත් කිරීමේ මාධ්‍ය සාකච්ඡා ද සංවිධානය කෙරෙනවා.

ඒ ඒ පළාත්වල වගාවට හා ගෘහ අවශ්‍යතා සඳහා ජලය සපයා ගැනීමේ ගැටලු හා විසැඳුම් එලෙස වන අතර දිවයින ම සමස්තයක් ලෙස ගත් කළ නැඟෙන වැදගත් ප්‍රශ්නයක් වන්නේ විදුලිය සැපයීම සඳහා මෙය කුමන අයුරින් බල පාන්නේ ද යන්න.

මේ පිළිබඳ ව විදුලිබල මණ්ඩලයෙන් පැහැදිලි පිළිතුරක් ලබා ගැනීම අතිශයින් අසීරු වූ කරුණක්. දැඩි ආයාසයක් දරා එහි සාමාන්‍යාධිකාරී ඒ. කේ. සමරසිංහ මහතාගෙන් ලබා ගත හැකි වුණේ සවිස්තරාත්මක ප්‍රකාශයක් නොව පොදු පිළිතුරක්. ඔහු ප්‍රකාශ කළේ විදුලිය කප්පාදුවක් සිදු කිරීමට තීරණයක් නැති බව. මැයි මාසය දක්වා විදුලිය නිපදවීමේ ප්‍රශ්නයක් නැති බව යි ඔහු අවධාරණය කළේ. ජල විදුලියට අමතර ව අවශ්‍ය අවස්ථාවලදී තාප විදුලි බලාගාර ද යොදා ගැනෙන බව යි ඔහු කියා සිටියේ.

විදුලිය පරිහරණය පිළිබඳ ව ජනතාවට අවබෝධයක් ලබා දෙන වැඩසටහනක්, "ඉල්ලුම් පාර්ශ්විය බලශක්ති කළමනාකරණය" නමින් ක්‍රියාත්මක කිරීමට විදුලිබල අමාත්‍යාංශය පියවර ගනිමින් සිටින බව ද ඔහු පෙන්වා දුන් කරුණක්.



චාමලී රාජකරුණා



# කළ කළ දේ පල පල දේ

## ගෝලීය උණුසුම ඉහළටම

**අකල්වැසි,** දරුණු නියඟ, චණ්ඩ මාරුත, සතු භේද විකෘතීන් දිගින් දිගට ම ලෝකය මුහුණ දෙමින් සිටිනා ව්‍යසන. සොබා දහම මෙලෙස වෙනස් වන්නට ගෝලීය උණුසුම ඉහළ යාම ද එක් හේතුවක් ලෙස යි විද්‍යාඥයන්ගේ අදහස. එයට වගකිව යුත්තේ මිනිස් ක්‍රියාකාරකම් බව යි ඔවුන් අවධාරණය කරන්නේ. ඒ නිසා යි, එක්සත් ජාතීන්ගේ සංවිධානය ද ගෝලීය උණුසුම ඉහළ යාමට ප්‍රධාන හේතුවක් ලෙස සැලකෙන කාබන්ඩයොක්සයිඩ් වායු විමෝචනය පාලනය කිරීමට ලෝකයේ ම ආණ්ඩුවල අවධානය යොමු කරන්නේ. ඔවුන් ලවා ඒ සඳහා නීති රීති පනවා ඒ අනුව කටයුතු කිරීමට පියවර ගනිමින් සිටින්නේ.

මේ සියලු උත්සාහයන් දරමින් තුබුණ ද ගෝලීය උණුසුම වාර්ෂික ව ම යමින් තිබෙන්නේ උඩුගම් බලා. අමෙරිකාවේ නාසා ආයතනය සහ ස්වාධීන ආයතනයක් වන "නැෂනල් ඕෂනික් ඇන්ඩ් ඇට්මොස්ෆෙරික් ඇඩ්මිනිස්ට්‍රේෂන්" ආයතනයේ අලුත් ම වාර්තාවලින් පෙන්වා දෙන්නේ 2016 ගෝලීය උණුසුම ඉහළ යාම පිළිබඳ ව ඉහළ ම අගයක් වාර්තා කළ බව.

2014 හා 2015 වර්ෂවල ද ගෝලීය උණුසුම ඉහළ ගිය අතර ඒ වර්ෂ ඉක්මවා යමින් ඉහළ උෂ්ණත්වයක් 2016 වර්ෂයේ පැවැති බව යි ඒ වාර්තාව පවසන්නේ. එමෙන් ම එය තවදුරටත් පෙන්වා දෙන්නේ පෘථිවිය මතුපිට සාමාන්‍ය උෂ්ණත්වය පිළිබඳ වාර්තා තබන්නට පටන් ගත් 1880 වර්ෂයේ සිට වැඩි ම උෂ්ණත්වයක් එක දිගට දක්නට ලැබෙන්නේ මේ වර්ෂ තුන ඇතුළත බව. 19 වැනි ශත වර්ෂයේ අවසානයේ සිට මේ දක්වා ගෝලීය උෂ්ණත්වය වර්ධනය වීමේ සාමාන්‍යය සෙල්සියස් අංශක 1.1ක් බව යි සංඛ්‍යා ලේඛන අනුව පෙනී යන්නේ.

කාබන්ඩයොක්සයිඩ් වායුව සහ වෙනත් හරිතාගාර වායු වැඩියෙන් ම වායුගෝලයට මුදා හැරෙන්නේ කාර්මික රටවලින්. එසේ වුව ද නීති රීතිවලට යටත් වී තම කර්මාන්ත ක්ෂේත්‍රය පසුබෑමට ලක් කර ගැනීමට ඒ රටවල් දක්වන්නේ මැලිකමක්. අමෙරිකාව ගෝලීය උණුසුමට දායක වන ප්‍රධාන රටක් වන අතර ගෝලීය සමුළුවලදී එළැඹෙන තීරණ සමඟ එකඟ වීමට ගෙන එන්නේ විවිධ තර්ක විතර්ක.

වත්මන් ජනාධිපති ඩොනල්ඩ් ජේ. ට්‍රම්ප්ගේ අරමුණ වන්නේ දැනට පරිහානියට පත් වෙමින් පවතින එරට කර්මාන්ත ක්ෂේත්‍රය නැවත පණ ගන්වා විදේශ ආනයන අඩු කොට ආර්ථිකය ශක්තිමත් කිරීම. එසේ කිරීම අභියෝගයක් වන්නේ ඒ සඳහා යොදා ගැනෙන බලශක්තිය වායුගෝලයට හිතකර ඒවා කර ගන්නේ කෙසේ ද යන්න.

ලෝක සමාජවාදී වෙබ් අඩවිය ප්‍රකාශ කරන්නේ ගෝලීය උණුසුම පාලනය කිරීමේ වැඩසටහනට අමෙරිකාවේ දායකත්වය නව පාලනය යටතේ පසුබෑමට ලක් විය හැකි ඉඟි පළ වෙමින් තිබෙන බව. උදාහරණයක් හැටියට එය පෙන්වා දෙන්නේ හරිතාගාර වායු පාලනය කෙරෙන නීති රීති පිළිබඳ වගකිවයුතු ආයතනය වන පරිසර ආරක්ෂණ ආයතනය භාර ප්‍රධානියා ලෙස, හරිතාගාර වායු පිළිබඳ නීති නැවත සලකා බැලිය යුතු බවට මතයක් දරන ඔක්ලොහෝමාහි නීතිපති ස්කොට් පෲයිට් පත් කිරීම. ගල්අඟුරු, තෙල් හා ගෑස් කර්මාන්තය නංවාලිය හැක්කේ එසේ කළහොත් ය යන අදහස යි ඔහු දරන්නේ.

චීනය හා ඉන්දියාව ද හරිතාගාර වායු මුදාහැරීමේ ප්‍රධාන චූදිතයන් දෙදෙනෙක්. ඔවුන් ලෝකයේ නැඟී ගෙන එන කර්මාන්තකරුවන්. ඒ තත්ත්වය පහළ දමා ගැනීමට ඔවුන් තුළ ද පවතින්නේ අකැමැත්තක්. ලෝකයේ බලපුළුවන්කාරයන් බවට පත් වීමේ තරගය ද ඒ පසුපස ඇති සාධකයක්. මෙවන් තත්ත්වයක් යටතේ ගෝලීය උණුසුම පාලනය කිරීම අභියෝගයක් බවට යි පත් ව තිබෙන්නේ. මෙහි දුක්මුසු කාරණය නම් මේ නිසා වැඩියෙන් පීඩාවට පත් වන්නේ ශ්‍රී ලංකාව ද ඇතුළත් කුඩා සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් වීම.

ධර්මදාස ගමගේ

# ට්‍රම්ප් යන්නේ කොයි පාරේ

**අමෙරිකානු** ජනාධිපතිවරණයෙන් 2016 නොවැම්බර් 08 වැනි දා ජයග්‍රහණය කළ රිපබ්ලිකන් පක්ෂයේ අපේක්ෂක 76 හැවිරිදි ඩොනල්ඩ් ජේ. ට්‍රම්ප් ජනාධිපති පදවියේ දිවුරුම් දුන්නේ 2017 ජනවාරි 20 වැනි දා. අමෙරිකන් ව්‍යවස්ථාව අනුව හැම ජනාධිපතිවරයකු ම දිවුරුම් දිය යුත්තේ ජනවාරි 20 වැනි දා යි.

අමෙරිකන් ජනතාව පමණක් නො ව ලෝක ප්‍රජාව ද මෙතැන් සිට අමෙරිකාව දෙස බලා සිටින්නේ විමාර්ගනාත්මියෙන් යුතු ව. ඒ, ට්‍රම්ප් සිය ඡන්ද ව්‍යාපාරය තුළ ප්‍රකාශ කළ රැඩිකල් අදහස් නිසා. ඒවා මොන ආකාරයෙන් ක්‍රියාත්මක කරනු ඇද්ද, ඒ අනුව රටේ ජනතාවට මෙන් ම විදෙස් රටවලට කුමන ආකාරයේ වෙනස්කම්වලට මුහුණ දෙන්නට සිදු වනු ඇද්ද යන වික්ෂිප්තභාවය යි පවතින්නේ.

ඉතා කෙටි කතාවක් පැවැත් වූ ට්‍රම්ප් සිය ප්‍රචාරක ව්‍යාපාරයේදී දැක් වූ අදහස් ඒ කතාවට ද ඇතුළත් කර තුබූ බව යි පෙනී ගියේ. ලෝකය හදන්නට ගොස් අමෙරිකාව සහ ජනතාව පරිහානියට පත් වූ බව සහ නැවත අමෙරිකාව අභිමානවත් ව නැගී සිටීමට අවශ්‍ය පියවර ගත යුතු බව යි ඔහුගේ අදහස්වල හරය වුණේ.

පැවැති පාලන සම්ප්‍රදාය සිය කතාවේදී විවේචනයට ලක් කළ ඔහු මින් ඉදිරියට ජනතාවත්, අමෙරිකාවත් ජයග්‍රහණය කරවන පාලනයක් ගෙන යන බව යි ප්‍රකාශ කළේ. පැවැති ආණ්ඩුවලට සහ පාලක පැලැන්තිවලට දෝෂාරෝපණ හා විවේචන ද එල්ල කැරුණේ තදින් ම. පාලකයන් වැජඹුණු අතර ජනතාව පීඩිහුණු බව යි ඔහු සඳහන් කළේ.

“දිගු කාලයක් තිස්සේ ම අප ජාතියේ අගනුවර කුඩා පිරිසක් ආණ්ඩුවේ වරදාන භුක්ති වින්ද අතර එහි පිරිවැය විඳ දරා ගැනීමට සිදු වුණේ ජනතාවට. වොෂිංටනය බැබලුණා. එහෙත් එහි ප්‍රතිලාභ ජනතාවට ලැබුණේ නැහැ. දේශපාලනඥයෝ වැජඹුණා. ඒත් මිනිස්සුන්ට රස්සා නැති වුණා. කම්හල් වැසී ගියා. පාලකයෝ රැකුණා. අපේ පුරවැසියෝ ආරක්ෂා වුණේ නැහැ.”

අගනුවර ඒ පිරිස ජයග්‍රහණ භුක්ති විඳිමින් ඒවා සමරනු ලැබූ නමුත් අනෙක් ප්‍රදේශවල ජීවන අරගලයේ පොර බදන ජනතාවට සැමරිය හැකි දෙයක් තිබුණේ නැහැ යි ද ඔහු සඳහන් කළේ අවධාරණයෙන්.

අද සිට එය වෙනස් විය යුතු බව පැවසූ ඔහු කියා සිටියේ වැදගත් වන්නේ බලයේ සිටින්නේ මොන ආණ්ඩුව ද යන්න නො ව ඒ ආණ්ඩුව ජනතාව විසින් පාලනය කරනු ලබන්නේ ද යන්න බව.

ජනතාව නැවතත් රටේ පාලකයන් බවට පත් වූ දිනය ලෙස 2017 ජනවාරි 20 ඉතිහාසගත වනු ඇති බව යි ඔහු අවධාරණය කළේ.

බාහිර ලෝකය මවා ගෙන සිටින සුපිරි සමාජයට වඩා අතිශයින් පීඩිත අමෙරිකන් ජන සමාජයක් තිබෙන බව යි ට්‍රම්ප් සිය කතාවේ සඳහන් කළ කරුණු අනුව පැහැදිලි වුණේ. “අපේ අභ්‍යන්තර නගරවල මව්වරුන් සහ දරුවන් දුප්පත්කමින් මිරිකිලා; ගරා වැටුණු කර්මාන්තශාලා මුළු රට පුරා ම දක්නට ලැබෙන්නේ සොහොන් ගෙවල් වගේ; සල්ලි ගොඩ ගැහුණු අධ්‍යාපන ක්‍රමයක් තියෙනවාලු, හැබැයි අපේ සුන්දර දරුවන්ට දැනුම අහිමි කරලා; අපරාධ, මැර කණ්ඩායම් සහ මත්ද්‍රව්‍ය විශාල ජීවිත



ජනාධිපති ආර්යා මෙලනි ට්‍රම්ප්, අත රැඳි බයිබල 2ක් මත ට්‍රම්ප් වමත තබා සිය දිවුරුම ප්‍රකාශයට පත් කළ වග



ට්‍රම්ප්ට විරෝධය


# DONALD TRUMP

සංඛ්‍යාවක් පැහැර ගෙන තිබෙන අතර මතු කර නො ගත් ශක්තීන් විශාල ප්‍රමාණයක් මංකොල්ල කාලා"

මේ තත්ත්වය අද සිට ම වෙනස් වන බව අවධාරණය කළ ට්‍රම්ප් ප්‍රකාශ කළේ වෙළෙඳාම, අයබදු, ආගමනය, විදේශ කටයුතු යන මේ හැම දෙයක් පිළිබඳ ව ම තීන්දු ගන්නේ අමෙරිකන් වැඩ කරන ජනතාවගේ සහ අමෙරිකන් පවුල්වල යහපත සැලකිල්ලට ගැනීමෙන් බව. මේ අතර විශේෂ අවධාරණයෙන් සඳහන් කළ තවත් කරුණක් නම් ඉස්ලාම් ත්‍රස්තවාදය



දිවුරුම් දීමෙන් අනතුරු ව මංගල දේශනය:
අභිමානවත් අමෙරිකාවක්. ජනතාවගේ ආණ්ඩුවක්.



පොළෝ තලයෙන් ම තුරන් කර දමන බව. ඒ සඳහා සියලු ශිෂ්ටාචාර රටවල සහයෝගය ලබා ගන්නා බව යි ඔහු කියා සිටියේ.

රටවල් සමඟ සහයෝගය පිළිබඳ ව ඔහු කළ ප්‍රකාශය ද වැදගත් වන්නේ වෙනත් රටවලට බලපෑම් කරන ලෝක පොලිස් කාරයා ලෙස අමෙරිකාව දෝෂදර්ශනයට ලක් ව තිබෙන නිසා. ඔහු ප්‍රකාශ කළේ "ලෝකයේ හැම ජාතියකගේ ම මිත්‍රත්වය හා හොඳ හිත අපි අපේක්ෂා කරනවා. අපි එසේ කරන්නේ ඒ ඒ රටවල වුවමනා එපාකම් පළමු තැනෙහි ලා සැලකීමට ඔවුන්ට ඇති අයිතිය තේරුම් ගනිමින්. අප අපේ ජීවන ක්‍රමය අනෙක් රටවල් පිට පැටවීමට අදහස් කරන්නේ නැහැ. එහෙත් අපේ ජීවන ක්‍රමය බැබලීමට පත් කළ යුත්තේ එය ආදර්ශයට ගෙන එය අනුගමනය කිරීමට අන් රටවල් පොලඹවනු පිණිස."

සැබවින් ම මේ අනුව අමෙරිකන් විදෙස් පිළිවෙත සැකසුණහොත් රටවල් අතර සංහිඳියාව වඩාත් අර්ථවත් ලෙස ක්‍රියාවට නැංවෙනු ඇති බව යි සිතිය හැක්කේ.

මේ අදහස්වලට සහ වැඩපිළිවෙළට ජනතා සහයෝගය කෙබඳු වනු ඇද්ද යන්න ද සැලකිය යුත්තක්. දිවුරුම් දීමේ උත්සවයට ද සහභාගි වුණේ අපේක්ෂිත ප්‍රමාණයට වඩා අඩු සංඛ්‍යාවක්. 2009 ඔබාමා දිවුරුම් දීමේ උත්සවයට මේ ප්‍රමාණය මෙන් දෙ ගුණයක් පමණ සහභාගි වූ බව යි ජනමාධ්‍යවල සඳහන් වුණේ.

ජනමාධ්‍යවල සාකච්ඡාවට ලක් වූ තවත් කරුණක් නම් ජනමත සමීක්ෂණ අනුව ඔහුගේ ජනප්‍රියත්වය 40%ක තරම් අඩු මට්ටමක පවතින බව. දිවුරුම් දීමටත් පෙර මේ වන් පහළ මට්ටමක පැවතීම අසාමාන්‍ය තත්ත්වයක්. ඉලෙක්ටෝරල් ක්‍රමය නිසා ඔහු ජයග්‍රහණය කළත් රටේ සමස්ත ඡන්ද සලකා බලන කළ ජනතා කැමැත්ත හිමි වුණේ හිලරි ක්ලින්ටන්ට. ඇය ලැබූ වැඩි ඡන්ද සංඛ්‍යාව මිලියන 3ක්. මේ තත්ත්වය නිසා ට්‍රම්ප් ජනාධිපති පදවියට පත් වීම නිත්‍යානුකූල නො වන බව යි ජනාධිපතිවරණ ප්‍රතිඵල නිකුත් කළ දින සිට ම රටේ නැග ආ විරෝධතාවලදී සඳහන් කැරුණේ.

එහෙත් මෙය අලුත් ම තත්ත්වයක් නො ව ජනාධිපතිවරණ ඉතිහාසයේ මීට පෙර ද මෙ වැනි දේ සිදු වූ බව යි ආපසු හැරී බලන විට පෙනී යන්නේ. අල් ගෝ සහ ජෝර්ජ් බුෂ් තරග කළ අවස්ථාවේ බුෂ්ට වඩා අල් ගෝ ලබා ගත් සෘජු ඡන්ද සංඛ්‍යාව ලක්ෂ 5ක්. අනිත් අතට ඉලෙක්ටෝරල් කොලෙජ් ඡන්දවලින් ද බුෂ් ලබා ගත්තේ යාන්තමින් ඡන්ද 271ක් පමණයි. අල් ගෝ ලැබූ සංඛ්‍යාවට වඩා යාන්තමින් 5ක් පමණක් වැඩියෙන්. එහිදී බුෂ්ගේ පත් වීම නීති විරෝධී බවට උද්ඝෝෂණ සිදු වුණේ නැහැ.

ජනවාරි 20 වැනි දා රට පුරා ම පමණක් නො ව විදෙස් රටවල සමහරක ද ට්‍රම්ප්ට විරුද්ධ ව විශාල උද්ඝෝෂණ පැවැති අයුරු යි ජනමාධ්‍ය වාර්තා කළේ. අමෙරිකාවේ නම් විරෝධතා ප්‍රචණ්ඩත්වයටත් පත් වුණේ දේපළ හානි පවා සිදු කරමින් සහ පොලිසිය සමඟ ද ගැටුම් ඇති කර ගනිමින්.

ජනාධිපතිවරණ සමයේ තුමන විවේචන, විරෝධතා, ගැටුම් පැවැතිය ද ජනාධිපතිවරණ ප්‍රතිඵලයෙන් පසු රට වෙනුවෙන් එකට එක් ව ජයග්‍රාහකයාට සියලු සහාය ලබා දීම යි සිරිත. හිලරි ක්ලින්ටන්ගේ සමු ගැනීමේ කතාවේදී ඇය කියා සිටියේ ද ට්‍රම්ට සුබ පතන බවත් රට වෙනුවෙන් සියලු සහාය ඔහුට ලබා දෙන බවත්. ට්‍රම්ප්ට එරෙහි ව පැවැති විරෝධතා ගැන හිලරි පාර්ශ්වයෙන් කියා සිටියේ ඒ සඳහා තමන්ගේ කිසිදු සම්බන්ධයක් නැති බව.

විරෝධතාවල නිරත වුණු වැඩි දෙනා සුළු ජාතිකයන් සහ සුදු ජාතික කාන්තාවන් බව යි මාධ්‍ය වාර්තාවල සඳහන් වුණේ. ආගමනිකයන් පිළිබඳ ව දැඩි නීති අනුගමනය කළ යුතු බව ට්‍රම්ප්ගේ අදහස වීම මෙන් ම කාන්තාවන් පිළිබඳ ඔහුගේ ආකල්ප ද ඊට හේතු ලෙස යි සැලකෙන්නේ. එමෙන් ම ඩිමොක්‍රැටික් පාක්ෂික ආධාරකරුවන් තුළ පවතින විරෝධයට තවත් හේතුවක් නම් ට්‍රම්ප් රුසියන් ජනාධිපති ව්ලැදිමියර් පූටින් අගයමින් කතා කිරීම සහ ට්‍රම්ප්ගේ ජයග්‍රහණය වෙනුවෙන් රුසියාව අනියමින් බලපෑම් කරනා ලද බව.

කිසිදු රාජ්‍ය තාන්ත්‍රික පදවියක් හොබවා කිසිදු පූර්ව අත්දැකීම් නැති ඩොනල්ඩ් ජේ. ට්‍රම්ප් සිය රැඩිකල් අදහස් මේ ආකාරයෙන් සිය පිළිවෙතට ඇතුළත් කළත් ඒවා රාජ්‍ය දෙපාර්තමේන්තුව, කොංග්‍රසය සහ සෙනෙට් සභාව ඔස්සේ කෙසේ ක්‍රියාවට නංවාලන්නට සමත් වේ ද යන ප්‍රශ්නය යි ඉදිරියේ ඇත්තේ.

ධර්මදාස ගමගේ



# උන්හිටි තැන් උන් අයටම

## ඊශ්‍රායල් - පලස්තීන ප්‍රශ්නය

ඊශ්‍රායල් - පලස්තීන ප්‍රශ්නයට ස්ථිර හා අවසන් විසැඳුමක් ලබා ගැනීමට ප්‍රධාන ම බාධකයක් වී තිබෙන්නේ, 1967 යුද්ධයේ දී අල්ලා ගත් පලස්තීන භූමි ප්‍රදේශවලින් ඊශ්‍රායලය ඉවත් නො වීමේ දැඩි අදිටන. ඒ අතර ම එසේ අල්ලා ගත් බටහිර ඉවුරේ සහ ජෙරුසලමේ දිගින් දිගට ම නීති විරෝධී ලෙස යුදෙව් ජනාවාස ඉදි කිරීම. සාම සාකච්ඡාවලදී පලස්තීනය පූර්ව කොන්දේසි ලෙස ඉදිරිපත් කරන්නේ නීති විරෝධී යුදෙව් ජනාවාස ඉවත් කිරීම සහ අල්ලා ගත් ප්‍රදේශ ආපසු භාර දීම.

මේ කාරණය යළිත් වරක් ගිය දෙසැම්බර් මාසයේ මතු වුණේ සහ සංවාදයට හේතු වුණේ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය සම්මත කළ යෝජනාවක් නිසා. අංක 2234 නම් වන මේ යෝජනාවෙන් කියැවුණේ "ඊශ්‍රායල ජනාවාස සාමය සඳහා ප්‍රධාන බාධාවක් බවත් එය අන්තර්ජාතික නීතිය බරපතළ ලෙස උල්ලංඝනය කිරීමක් බවත් සහ "රටවල් දෙකක්" යන විසැඳුමේ ජීවශක්තිය දරුණු ලෙස විනාශ කරන බවත්". ඒ යෝජනාව මගින් තවදුරටත් ඉල්ලා සිටියේ ජෙරුසලම ද ඇතුළු ව අල්ලා ගත් සියලු පලස්තීන ප්‍රදේශවල ඊශ්‍රායල ජනාවාස ඉදි කිරීම වහාම නතර කළ යුතු බව.

යෝජනාවට පක්ෂ ව රටවල් 14ක් ඡන්දය දුන් අතර විපක්ෂ ව එක රටක් හෝ ඉදිරිපත් වීම පමණක් නො ව විශේෂ ය වුණේ ඊශ්‍රායලයට එරෙහි ව මීට පෙර සම්මත කැරෙන හැම යෝජනාවක් ම පාහේ සිය නිෂේධ බලයෙන් අස්ථාවර කරන අමෙරිකාව මෙ වර එසේ නොකොට ඡන්දය දීමෙන් වැළැකී සිටීම. අමෙරිකන් නියෝජිත සමන්තා පවර් ඊට හේතු දක්වමින් කියා සිටියේ අමෙරිකාව ඊශ්‍රායලයට ඇති පදම් යුද ආධාර සපයා තිබෙන බවත්, ඊශ්‍රායල් ජනාවාසකරණය දැඩි වේගයකින් පුළුල් කරමින් රටවල් දෙකක් යන විසැඳුම අවදානමට හෙළා ඇති නිසා මෙවර නිෂේධ බලය පාවිච්චි නො කළ බව.

2009ත් 2014 අවසානයත් අතර බටහිර ඉවුරේ හා නැගෙනහිර ජෙරුසලමේ ඊශ්‍රායල ජනගහනය 21%කින් ඉහළ ගොස් තිබෙන්නේ යථෝක්ත වේගවත් ජනාවාසකරණය හේතුවෙන්.

ප්‍රශ්නය නම් මේ යෝජනාවෙන් අපේක්ෂා කරන දේ ඊශ්‍රායලය විසින් ඉටු කරනු ඇද්ද යන්න. මීට පෙර අවස්ථා ගණනාවක දී ද එ. ජා. ආරක්ෂක මණ්ඩලය පලස්තීන අර්බුදය පිළිබඳ ව යෝජනා සම්මත කර ඇති නමුත් ඒ අනුව ක්‍රියා කිරීම ඊශ්‍රායලය විසින් පැහැර හරින ලද බව ප්‍රසිද්ධ කාරණයක්. එසේ වුව ද ඊට එරෙහි ව පියවර ගැනීමට එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය අසමත් වූ ආකාරය යි දක්නට ලැබුණේ. ඒ නිසා එ. ජා. සංවිධානය ඉදිරියේ ඊශ්‍රායලය හැසිරෙන්නේ චණ්ඩියකු මෙන්.

එ. ජා. යෝජනා ක්‍රියාත්මක නොකිරීමට එරෙහි ව ඊශ්‍රායලයට විරුද්ධ ව පියවර නො ගන්නා නමුත් මේ යෝජනාව සම්මත කළ වහා ම ඊශ්‍රායලය කෝපාවිෂ්ට ව පියවර ගත්තේ එයට දායක වූ රටවලට දඬුවම් කිරීමට. අගමැති නෙතන්යාහු ප්‍රකාශ කළේ ඒ රටවලට එරෙහි ව රාජ්‍ය තාන්ත්‍රික හා ආර්ථික පියවර ගන්නා බව. යෝජනාවට පක්ෂ ව ඡන්දය ප්‍රකාශ කළ රටවල් 14න් 12ක් සමඟ ක්‍රියාකාරී සබඳතා සීමා කරන බව යි ඔහු කියා සිටියේ. වෙනිසියුලාව සහ මැලේසියාව ඊශ්‍රායලය සමඟ තානාපති සබඳතා නැති රටවල්.

නැගෙනහිර ජෙරුසලමේ නියෝජ්‍ය නගරාධිපති මෙයිර් ටර්ජ්මන් දැඩි සේ කියා සිටියේ නැගෙනහිර ජෙරුසලමේ අප කළ යුතු නො කළ යුතු දේ ගැන එ. ජා. සංවිධානය හෝ වෙන කවුරුන් හෝ මොන නියෝග කරන්නට ආවත් ඒ කිසිවකට තමන් යටත් වන්නේ නැති බව.

පලස්තීන ජනතාව ජනවාරි 20න් පසු කුමන

**2009ත් 2014 අවසානයත් අතර බටහිර ඉවුරේ හා නැඟෙනහිර ජෙරුසලමේ ඊශ්‍රායල ජනගහනය 21%කින් ඉහළ ගොස් තිබෙන්නේ යථෝක්ත වේගවත් ජනාවාසකරණය හේතුවෙන්. ප්‍රශ්නය නම් මේ යෝජනාවෙන් අපේක්ෂා කරන දේ ඊශ්‍රායලය විසින් ඉටු කරනු ඇද්ද යන්න.**


ඉරණමකට මුහුණ දේ ද යන ප්‍රශ්නය මතු වන්නේ එදින දිවුරුම් දෙන නව අමෙරිකන් ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් රටවල් දෙකක් යන අමෙරිකන් පිළිවෙත ප්‍රතික්ෂේප කරන නිසා. ඔහු ජයග්‍රහණය කළ මොහොතේ ඊශ්‍රායල අධ්‍යාපන ඇමති නෆ්ටලි බෙනට් උදම් ඇනුවේ "පලස්තීන රාජ්‍යයක් පිළිබඳ යුගය අවසන්" යනුවෙන්. ට්‍රම්ප් තනිකර ම වෙනස් පිළිවෙතක් ක්‍රියාත්මක කරනු ඇති බව යි ඔහු මෙතෙක් කී දෑ අනුව නම් සිතන්නට සිදු වන්නේ.

පලස්තීනයේ නව අමෙරිකානු තානාපති ලෙස ට්‍රම්ප් විසින් නම් කරනු ලැබ ඇත්තේ පලස්තීන රාජ්‍යයක් යන අදහසට විරුද්ධ මෙන් ම ඊශ්‍රායල් ජනාවාස ඉදි කිරීමට පක්ෂපාත දැඩි සියොන්වාදියකු වන ඩේවිඩ් ෆ්‍රීඩ්මන් බව යි වාර්තා වන්නේ. එය කිසිසේත් ම සංහිඳියාවකට හේතු නො වන්නක්.

එමෙන් ම ජනාධිපති ට්‍රම්ප් ඉඟි කර ඇත්තේ අමෙරිකන් තානාපති කාර්යාලය නැඟෙනහිර ජෙරුසලමේ ස්ථාපිත කරන බව. නැඟෙනහිර ජෙරුසලම් පලස්තීන රාජ්‍යයේ අගනුවර ලෙස යි පලස්තීනුවන් සලකන්නේ. ඒ අනුව මේ ක්‍රියාකාරකම්වල තේරුම ට්‍රම්ප් යටතේ අමෙරිකාව ඊශ්‍රායල - පලස්තීන ප්‍රශ්නයේ මැදහත් බේරුම්කරුවකු ලෙස පැවැති භූමිකාවෙන් ඉවත් ව ඊශ්‍රායලයේ පාර්ශවකරුවකු විය හැකි බව.

මෙවැනි වාතාවරණයක් යටතේ මැදපෙරදිග නව දේශපාලන වාතාවරණයක් ගොඩනැගෙනු ඇති අතර එය මැදපෙරදිග ස්ථිර සාමයක් සඳහා වන බලාපොරොත්තු තවදුරටත් ඇත් කිරීමට යි හේතු විය හැක්කේ.

ධර්මදාස ගමගේ




පලස්තීනුවන්ට අත් වූ ඉරණම තේරුම් ගත හැක්කේ 1947 සිට මේ දක්වා පලස්තීන සිතියම දෙස බැලීමෙන්.



# ලොකු අයට යටවෙන පොඩි අය

## නේපාල - චීන සබඳතා

කුඩා රටවලට ජාත්‍යන්තර සබඳතා අතිශයින් වැදගත්. ඒ, විදෙස් රටවල් සමඟ ආර්ථික හා වෙළෙඳ ගනුදෙනු සිය රටවල සංවර්ධනය හා සමෘද්ධිය සඳහා ප්‍රධාන සාධකයක් වන නිසා. එහෙත් කලාපීය වශයෙන් සිය ශක්තිය තහවුරු කර ගැනීමේ වුවමනාව නිසා බලවත් විදෙස් රටවල් මේ රටවල් සමඟ සබඳතා පවත්වන්නේ යටි අරමුණු ද සහිත ව. ඒ නිසා සිදු වන්නේ යථෝක්ත කුඩා රටවල් බලවත් රටවල බල-පෑම්වලට යටත් ව නෙරපීමට ලක් වීම. මේ වන විට නේපාලයේ දක්නට ලැබෙන්නේ එවැනි තත්ත්වයක්.

ආසන්න ම හේතුව වන්නේ නේපාලය සහ චීනය ඒකාබද්ධ හමුදා අභ්‍යාසයක් පැවැත්වීම සඳහා පෙබරවාරි 10 වැනි දාට දින නියම් කර ගෙන තිබීම. මෙයින් කලබලයට පත් වුණේ ඉන්දියාව. දකුණු ආසියාවේ බලවතා ලෙස පෙනී සිටින ඉන්දියාව තම යාබද එමෙන් ම චීනයට ද දේශ සීමා වන නේපාලය චීනය වැනි ලෝකයේ නැඟී එන දැවැන්තයකු සමඟ වැඩි පයිරුපාසානයට යාම දෙස බලන්නේ දැඩි සැලකිල්ලෙන් සහ අවධානයෙන්. විශේෂයෙන් ම මිලිටරිමය සබඳතා ඇති කර ගැනීම විමසිලිමත් වීමට හේතු වන්නේ දේශ සීමා ප්‍රශ්න සම්බන්ධයෙන් චීනය සමඟ විරසකතා සහ ගැටුම් පවතින නිසා.

ඉන්දියාවේ මේ අසතුට ගැන දන්නා නේපාලය එය සමනය කිරීමට යි උත්සාහ



නිවපු අගමැති කේ. පී. ෂර්මා ඔලි චීන අගමැති ලී කෙකියංග් සමඟ

වත්මන් අගමැති පුෂ්ප කමල් දහාල් හෙවත් ප්‍රචණ්ඩ

ගත්තේ. ඉන්දියාවේ නේපාල තානාපති දීප් උපාධ්‍යාව් ප්‍රකාශ කළේ "මේ හමුදා අභ්‍යාසය ඉතා කුඩා ප්‍රමාණයේ එකක්. ඉන්දියාව සමඟ පවතින්නේ ඉතා සමීප සම්බන්ධයක්. මේ යුද අභ්‍යාස නිසා එහි කිසි වෙනසක් සිදු වන්නේ නැහැ" යනුවෙන්.

මේ පිළිබඳ ව ඉන්දියානු ආණ්ඩු බලධාරීන්ට වඩා ප්‍රතිචාර පළ වුණේ වෙනත් විද්වතුන් වෙතින්. ජවහර්ලාල් නේරු සරසවියේ පර්යේෂකයකු වන අනුරාධා රාධී කළ ප්‍රකාශයකින් පෙන්වා දෙන්නේ නේපාලයට නව වෙළෙඳ මාර්ග සපයා දෙමින් සහ සිය ක්‍රමෝපායික බැඳීම් වර්ධනය කරමින් ඉන්දියාවට විකල්පයක් බවට පත් වීමට චීනයේ අභිලාෂය පෙන්නුම් කරමින් පවතින බව.

නේපාලය සහ චීනය අතර මෙසේ සබඳතා වර්ධනය වන්නේ අමෙරිකාව චීනය හුදකලා කිරීමට උත්සාහ දරමින් සිටියදී වීම විශේෂයෙන් සැලකිය යුත්තක්. ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ ආගමනය චීනය හුදකලා කිරීමේ වෑයම තවත් උත්සන්න කිරීමට හේතු වනු ඇති බව යි සැලකෙන්නේ.

නේපාලයේ මදේශී වාර්ගිකයන් ස්වයං පාලනයක් ඉල්ලා දියත් කළ විරෝධතාවලට ඉන්දියාවේ සහාය දීම හේතු වුණේ දෙරට අතර සබඳතා දුර්වල වීමට. එහි ප්‍රතිඵලය වුණේ යම් ආර්ථික අවහිරතා විශේෂයෙන් බලශක්ති සැපයීම පිළිබඳ ව ඇති වීම. එහිදී එකල නේපාල අගමැති කේ. පී. ඔලි ඒ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා සෘජු ව ම සමීප වුණේ චීනය වෙත. පෙට්‍රෝලියම් නිෂ්පාදන චීනයෙන් ආනයනය කිරීමට 2015 දී ගිවිසුමක් අත්සන් කැරුණේ ඒ අනුව. එමෙන් ම ඔලි 2016 මාර්තු මාසයේ චීනයේ කළ සංචාරයේදී ගිවිසුම් 10කට අත්සන් කළේ චීන ආධාර යටතේ යටිතල පහසුකම් වර්ධනයට අදාළ ව. මහා මාර්ග හා දුම්රිය මාර්ග සංවර්ධනය මෙන් ම නව අන්තර්ජාතික ගුවන් තොටුපළක් ආරම්භ කිරීම ද ඊට ඇතුළත්. මේ අනුව නේපාලය සවදුරටත් ඉන්දියාව කෙරෙහි ම යැපෙන්නට අවශ්‍ය නො වන මට්ටමට යි පත් වුණේ. එය ඉන්දියාවේ සතුටට හේතු නොවන්නක්.

දේශපාලන විචාරකයන් පෙන්වා දෙන්නේ 2016 ජූලි මාසයේ නේපාලයේ ඇති වූ දේශපාලන පෙරළිය පිටු පස ඉන්දියාව සිටි බව සහ ඒ අනුව අගමැති ඔලි පහ කරනු ලැබුවේ චීනයට වඩාත් නැඹුරු වීමේ හේතුව මත බව. ඒ වෙනුවට පත් වූ පුෂ්ප කමාල් දහාල් හෙවත් ප්‍රචණ්ඩ ඉන්දියාවට හා අමෙරිකාවට නැඹුරුතාවක් දක්වන බව යි පෙනී යන්නේ ඇත්තේ.

නේපාලයට ඇති විදේශ බලපෑම් කෙසේ ද යත් ඔහුට සිදු වුණේ ඉන්දියාවට ගොස් නැවත සබඳතා වර්ධනය කිරීමට පියවර ගැනීමට. ඉන්දීය ජනාධිපති ප්‍රනාප් මුකර්ජි ගිය නොවැම්බර් මාසයේ නේපාලයේ සංචාරයක නිරත වුණේ ද බිඳුණු සිත් පිළිසකර කරනු පිණිස. චීනය සමඟ ගිවිසගත් කාර්යයන් ආරම්භ කිරීම ප්‍රමාදයට පත් වීම ගැන චීනය තුළ නොසතුටක් වර්ධනය වන බව යි පෙනී ගියේ. නොවැම්බර් මාසයේ නියමිත වූ චීන ජනාධිපතිගේ සංචාරය අවලංගු කැරුණේ ද එහි ප්‍රතිඵලයක් ලෙස බව යි සැලකෙන්නේ. ස්වෛරීත්වය හා ස්වාධීනත්වය රැක ගැනීමට කුඩා රටවලට ඇත්තේ කොතරම් අසීරුතාවක් ද?

ධර්මදාස ගමගේ

'නිදහස' යන්න ඉංග්‍රීසි බසින් සිංහලට පෙරළී ආ වදනක් නොවේ. 'හිත නිදහස් කර ගැනීම', 'අත්හැරීම', 'ස්වච්ඡන්දතාව' යන යෙදුම්වලින් හැඟවෙන සංකේතාර්ථ සමුදායක් අපට හමු වේ.

"සිතින් නිදහස්වීම" යනු බුද්ධ ධර්මයේ උගන්වනු ලබන "නොඇලීම"යි. එය ආධ්‍යාත්මික හා ආගමික චින්තාවකි. "නොඇලෙන", "නොසැලෙන" මානවයා ඇලීම් බැඳීම්වලින් වෙන් වූ ආස්ථානයක් හිමි කර ගත්තේ ය. ඒ ආස්ථානය (Stand point) පරමාදර්ශී නිදහස්වාදී අත්පත් කර ගැනුමකි.

"මගේ හිතට කිසි ම නිදහසක් දැනෙන්නේ නැහැ" යි සමහරු කියති. මේ කියමනේ අර්ථය වටහා ගත හැක්කේ "හිත නිදහස් කර ගැනීම" (Freeing one's mind) යන දාර්ශනික සංකල්පය වටහා ගැනීමෙනි. මෙහි සුලමුල ඇරඹෙන්නේ දාර්ශනික ලිපිලේඛන සැපයූ මහා ග්‍රීක දාර්ශනික ඇරිස්ටෝටල්ගේ (Ethics) කෘතියෙනි. එහිලා මිනිසා උපතේ සිට මරණය දක්වා වූ ජීවන කාලය ඇතුළ තදී විවිධ ඇවතුම් පැවතුම් සමුදායකින් බැඳී ඇති අයුරු විදහා දැක්වීමට වෑයම් කෙරේ. මේ ඇලුම් බැඳුම්වල සීමා ඔහු වූල පුස්තක දහයකින් විමසීමට බඳුන් කර ඇත. මේ වූල පුස්තක දහය මගින් ඇරිස්ටෝටල් විවරණය කරන්නේ මිනිසා විසින් ම සකසා ගන්නා ලද සීමා (limits) හා ඒ සීමාවලින් මිදීම (transgression from limits) යන සංකල්පයන් ය. තමන් අභිමත පරිද්දෙන් ජීවන කාලය ගත කිරීමට යම් කිසි බන්ධනයක් (Bond) ඇත්නම් ඉන් මිදීමට මිනිසා විසින් ම දරනු ලබන ප්‍රයත්නය ද ඇරිස්ටෝටල්ගේ විමර්ශනයට ලක් වේ. තමන් අභිමත පරිද්දෙන් දිවි

# නිදහස් චින්තනයේ මන්ත්‍රය



මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර

ගෙවීමට නොහැකි වීම එක්තරා නිදහස හිරවීමකි. නැතහොත් 'නිදහස සීමා වීමකි' යන්න හැම මට්ටමකින් ම වටහා ගැනීමට සිදු වේ. "මගේ හිත බන්ධනවලින් මුදා ගැනීම සඳහා මම නිර්මාණ කටයුතුවල නිරත වෙමි. ඒ අනුව බලන කල මා තුළ රැඳී පවත්නේ සාන්තුවර ආකල්පයක් බව ඔබ වටහා ගත යුතු ය" යනුවෙන් අතිශය නිර්භීත කලා සංකල්පයක් ගොඩ නැගුවේ ඩී. එච්. ලෝරන්ස් නම් වූ ඉංග්‍රීසි ජාතික විවාදාපන්න නිර්මාණශීලී නවකතාකරුවා හා කවියා ය. මේ නිදහස්වාදී චින්තනය ප්‍රංශ මහා චිත්‍ර ශිල්පියා වන පැබ්ලෝ පිකාසෝ ද මහා දාර්ශනිකයා වූ බර්ට්‍රන්ට් රසල් ද අනුමත කළේ ය. අනුමත කිරීමෙන් පමණක් නො නැවතුණු ඔවුහු තම නිදහස්වාදී මත සමුදාය ද පළ කළහ.

"මිනිසා කොහි ගියත් ඔහු බන්ධනවලින්, යදම්වලින් බැඳී ඇත. Where ever the man goes be is bound by chains යනුවෙන් මාක්ස් කළ ප්‍රකාශය හුදු දේශපාලන චින්තාවක් නොවන බවත් එහි අනුඉති සෙසු සමාජ ජීවන ධාරා කරා දිවෙන බවත් නෝම් චොම්ස්කි වැනි දාර්ශනිකයෝ පෙන්වා දෙති. චොම්ස්කි තම ජීවන දර්ශනය වාග් විද්‍යාවට සීමා නොකොට ප්‍රකාශ කළේ මාක්ස්ගේ නිදහස්වාදී චින්තනය අනුව 'පරම නිදහස්වාදී බව' (the ideal state and freedom) යන්න මානව පැවැත්මේ ම පවතින අභියෝගයක් බව ය. මේ අභියෝගය ජය ගැනීමට නම් සකලවිධ බන්ධනවලින් මිනිසා නිදහස් විය යුතු බවය. එය පූර්ණ නිදහස්කාමිත්වයකි. "කෙතරම් බන්ධනාගාරවල මිනිසුන් හිරගත කළත් එමඟින් අන්‍යයන්ට නිදහසක් ළඟාවෙතැයි නොසිතිය යුතු යි" යනුවෙන් ප්‍රකාශයක් කළේ එරික් ෆ්‍රොම් (Eric Fromm) නමැති

> **අභියෝගය ජය ගැනීමට නම් සකලවිධ බන්ධනවලින් මිනිසා නිදහස් විය යුතු බව ය. එය පූර්ණ නිදහස්කාමිත්වයකි. "කෙතරම් බන්ධනාගාරවල මිනිසුන් හිරගත කළත් එමඟින් අන්‍යයන්ට නිදහසක් ළඟාවෙතැයි නොසිතිය යුතු යි"**


සමාජ විද්‍යාඥයා ය. වියට්නාම් යුද්ධය පවතින කාලයේ රසල් වතාවක් කීවේ, 'යුද්ධයකින් නිදහසක් ලබා ගැනීම අපේක්ෂා කළ නොහැකි බවත්, එය සාමයෙන් හා සමථයෙන් අත්පත් කර ගත යුතු බවත් ය. විටෙක සුළු පිරිසක් තම පාලන බලධාරිත්වයෙන් ලබන ආධිපත්‍යය විශාල පිරිසකගේ 'ජීවන නිදහස' යටපත් කිරීමක් වීම වැළැක්විය නොහැකි ය. මේ හේතුවෙන් යටත්විජිත රාජ්‍යය (Colonial States) යන යෙදුමක් ද ප්‍රචලිත විය. ස්වදේශිකයා හිර කොට විදේශිකයා තම ආධිපත්‍යය මඟින් විජිතයක් සකසා ගැනීම මෙහි අරමුණ විය. එවිට සිදු වන්නේ ස්වදේශික ජීවන රටාවේ නිදහස වැළලී යාමකි. විදේශීය අධිපත්‍යය නැගී ඒමකි. මේ හේතුවෙන් ඓතිහාසික ව ගොඩ නැගුණු 'නිදහස් චින්තනය'ට නව අර්ථ සමුදායක් එකතු වන්නට විය. ආසියානු හා අප්‍රිකානු බොහෝ රටවලට සිදු වූයේ මෙකී නිදහස හිරවීමකි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 'වහල් මනස' (slavish minds) හා වහල් ගතිපැවැතුම් වගාවන්නට පටන් ගති. ඊට ප්‍රතිවිරුද්ධ වීමේ ප්‍රතිඵලයක් වශයෙන් 'නිදහස් සටන්' (Freedom fights) ඇති වීම වැළැක්විය නොහැකි ය. ඊට මඟ පෑදුවන් විරුවෝ වූහ. "සතර දිග්භාගයෙන් හමා එන සුළඟට හමා ඒමට ඉඩ දී මම ඊට නතුනොවී මගේ සිත නිදහස ව තබා ගනිමි" මහත්මා ගාන්ධි කළ ප්‍රකාශය නිදහස් මන්ත්‍රයක් ලෙස ලොව පුරා ප්‍රචලිත විය. "නුඹලා කෙතරම් දවසින් දවස කාලය ගත කළත් නුඹලාගේ හාම්පුතුන්ගේ වහල් බන්ධනවලින් නිදහස් නොවනතාක් කල් නුඹලා ගත කරන්නේ නිදහස හිරවුණු වහල්භාවයේ බව අමතක නොකරන්න"යි ඒබ්‍රහම් ලින්කන් කියා සිටියේ, තම නිදහස්වාදී මනසේ ස්වභාවය අමෙරිකන් වහල් මෙහෙවර අහෝසි කිරීම සඳහා කෙරෙන බලගතු සිංහ නාදයක් ලෙසිනි. එහෙත් ඔහු තම ජීවන නිදහස කෙරෙහි අබමල් රේණුවක හෝ භීතියකින් පසු නොවී ය. ඔහු පෙන්වාදුන් අභීත නිදහස්වාදී සමාජ චින්තනය අදත් ශේෂ ව පවතී.

'චින්තන නිදහස කුමක් ද' යනුවෙන් වතාවක් කෘෂ්ණමූර්ති තුමා කතාවක් පැවැත්වීය. කතාව අවසානයේදී එක් පුද්ගලයෙක් ප්‍රශ්නයක් ඇසීය. "සිත නිදහස් කර ගැනීමට විධි ක්‍රමයක් කියාදෙන්නට පුළුවන් ද" කෘෂ්ණමූර්ති තුමා සිනාසී මෙසේ කීය. "ඔබට ගරහන කෙනකු මුණගැසුනොත් ඔබ ඔහුට නොගරහා අසන්න ඇයි මට ගරහන්නේ කියල. ඔබට ඔබේ හිත නිදහස් කරගත හැකි යි. ඔබට වෛර කරන කෙනකුට ඔබ වෛර නොකොට ඔහු හා ඇය ඔබට වෛර කරන්නේ ඇයි කියල දැනගන්න. එවිට ඔබට ඔබේ හිත නිදහස් කර ගැනීමට පුළුවන්. මේ විදියට දිගින් දිගට ම ඔබ බැඳුම්වලින් මිදෙන්න. හිත නොදැනීම නිදහස් වේවි."



# අපට දැනෙන නිදහස

නිදහස ලබා හැට නව වසරක් ගත වන මේ මොහොතේ පුරාපේරු, වර්ණනා ආදියෙන් නිදහස ගැන අලංකරණය කිරීමට නොව, රටේ ජනතාවට දැනෙන නිදහස ගැන කියන්නට මෙවර දෙසතිය කවරයේ කතාව වෙන් වුණා. එහිදී පේදුරුතුඩුවේත්, දෙවුන්දරතුඩුවේත්, නුවරඑළියේත්, මඩකලපුවේත් ජනතාව නිදහස අරුත් ගැන් වූ අයුරුයි මේ.













# උතුරේ නිදහස

**පුරා තිස් වසරක් යුද ගැටුම්වලින් වූ නේකවිධ පීඩා විඳි උතුරේ ජනතාව නිදහස අත්විඳින්නේ කොහොම ද? ඔවුන්ගේ හද ගැස්ම සේයා රූ සමඟ දෙසතියට පවසන්නේ යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රවෘත්ති නිලධාරි එස්. ප්‍රශාන්ති විසින්.**

**වර්තමානයේ** අපේ රටට නිදහස නොමැති බවක් ප්‍රකාශ කළ නොහැකි යි. යම්තාක්දුරකට වූ සමාන්‍ය නිදහසක් තිබෙන බව පිළිගත යුතු යි. සංස්කෘතික නිදහස රට තුළ ඇති වෙලා. රැකියා ආදිය ලබා දීමේදී නිසි පරිදි දේශපාලනයෙන් තොරව දක්ෂ යන්ට රැකියා ලබා දීම ඒ නිදහස වඩාත් අර්ථවත් වීමට හේතුවක් වනු ඇති. මේ නිසා සුදුස්සාට සුදුසු තැන ලැබිය යුතු යි.

විශාල රැකියා වියුක්තියක් රට තුළ පවතිනවා. ඒ සඳහා යම් කිසි රැකියා ඉලක්ක වැඩපිළිවෙළක් අවශ්‍ය යි. කර්මාන්තශාලා බිහිකර රැකියා ලබා දීමේ අවශ්‍යතාව වර්තමාන රජයට පැවතීම ඉතා යහපත් තත්ත්වයක්. සමාන්‍ය ජනතාවට යහපාලනය යටතේ සහජීවනයෙන් සාමයෙන් රට තුළ ජීවත් වීමට අවස්ථාව ලැබිලා. මේ නිසා සැම දෙනාට ම ජාති, ආගම්, කුල භේදයෙන් තොර ව සමානාත්මතාවයෙන් ජීවත් වීමේ පසුබිම ද සකස් විය යුතු යි. පවත්නා තත්ත්වයට වඩා සැම සංස්කෘතියකට ම සමාන අගයක් පැවතිය යුතු යි. සංවර්ධන ප්‍රතිලාභ බෙදීයාම ද ජාති ආගම් භේදයෙන් තොරව යි සිදු විය යුත්තේ. ඒ සැම දේ ම සමාජයේ ඇති කිරීමට ක්‍රියා කරනවා නම් පමණයි රට තුළ සැබෑ නිදහසක් ඇති බව කිව හැකි වන්නේ.



**පූජ්‍ය අගුණොච්චියේ කුමාර කස්සප හිමි**
නාග විහාරය - යාපනය

---



**නල්ලයි ආදීනම් ගුරුමුදල්වර්**
පූජක - නල්ලූර් කෝවිල යාපනය

**පෙර** පැවැති තත්ත්වයට වඩා යම්තාක් නිදහසක් පවතින බව කීමට පුළුවන්. එසේ වුවත් යම් යම් ප්‍රශ්න තිබෙන බවත් සඳහන් කළ යුතු යි. විශේෂයෙන් එහිදී අපගේ ආගමික ඇදහීමේ නිදහසට පවතින බාධා ද පෙන්වා දිය යුතු වෙනවා. ආරක්ෂාව පිළිබඳ ව විමසීමේදී පවත්නා ආරක්ෂාව ආගමික ක්‍රියාවලට නිසි පරිදි නොලැබෙන බවයි කිව යුත්තේ. අපට අපගේ ආගමික ඇදහීම්, පූද පූජා, වත් පිළිවෙත් සිදු කිරීමට සුදුසු පරිදි ආරක්ෂාව තහවුරු කර දිය යුතු යි. පොලීසිය සහ ආගමික පාර්ශ්ව ඒකාබද්ධ ව ඒ සඳහා තීරණ ගැනීම සිදු කළ යුතු බව යි මගේ අදහස.

අනෙක් කාරණය නම් දේශපාලනඥයන් යම් යම් තීරණ ගැනීමේදී ප්‍රදේශයේ ප්‍රධාන භූමිකාවක් නිරූපණය කරන ආගමික පූජකවරුන්ගේ අදහස් විමසීමට ලක් කරන්නේ නැහැ. එසේ සාකච්ඡා කර තීරණය ගැනීමට දේශපාලකයන් යොමු වෙනවා නම් සුළු වශයෙන් හෝ ජාතික, ආගමික ප්‍රශ්න මතු වන්නේ ද නැහැ. දේශපාලකයන් අප ව සම්බන්ධ කර ගන්නේ ආගමික වශයෙන් ආශිර්වාද කර ගැනීමට පමණ යි. එසේ නොමැති ව අපගේ අදහස් විමසීමක්, සාකච්ඡා කිරීමක් සිදු කරන්නේ නැහැ. එලෙස සියලු දෙනා එක් ව තීරණ ගන්නේ නම් ස්ථිර නිදහසක් සඳහා අපට ගමන් කළ හැකි යි.



## මවුලවි. පී. ඒ. එස්. සුෆියාන් - යාපනය

හිටපු මහනගර සභා මන්ත්‍රී

**නිදහසෙන්** පසු ව දිගට ම සිදු වුණේ ප්‍රධාන පක්ෂ දෙකක් ආණ්ඩු පිහිටුවමින් පාලනය කිරීම යි. විශේෂයෙන් ම මොවුන් සුළු ජාතීන් අතර ගැටුම් ඇති කරමින් තමන්ගේ පක්ෂයේ අරමුණු ඉටු කර ගනිමින් ආණ්ඩු පිහිටුවීම යි සිදු කළේ. ජාති භේද, වාර්ගික ගැටුම්, රටේ තිබුණු වෙනත් ගැටලු හා හානි ආදිය දකිද්දී අපට සිතෙන්නේ නිදහසට පෙරත් මෙවැනි අවාසනාවන්ත දේවල් මේ රටේ සිදු වුණා ද කියල යි. යුද්ධය අවසන් වෙලා වසර 07ක් වුවත් තවමත් මිනිස්සුන්ට නිදහසේ ජීවත් වීමට හොඳ තත්ත්වයක්, පරිසරයක් බිහි වෙලා නැහැ. අවතැන් වූ සහ ගැටලුවලට ලක්ව සිටින සැම දෙනාගේ ම අදහස මෙය යි. යුද්ධයෙන් අවතැන් වූ මිනිසුන්ගේ ගැටලුවලට විසඳුම් ලබා දීම හෝ ඔවුන් නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය හෝ තවමත් නිසි පරිදි සිදු වී නැති බව යි පෙනෙන්නට තිබෙන්නේ. ඔවුන්ට ජීවත් වීමට අවශ්‍ය මූලික අවශ්‍යතා, ජීවනෝපාය මාර්ග තවමත් සැකසී නැහැ. මේ නිසා සැබෑ නිදහසක් තවමත් ලංකාවට පැමිණ තිබේ ද යන්න ගැටලුවක්.

ලංකාවේ මෙතෙක් කල් පැවත ආවේ පවුල් දේශපාලනයක්. එවැනි තත්ත්වයක් තුළ අනෙක් අයගේ අයිතිවාසිකම් යටපත් වෙලා. මේ නිසා සැබෑ නිදහසක් දේශපාලන ක්‍රියාවලිය තුළ හෝ නොමැති බව යි මගේ අදහස. සැබෑ නිදහස ඇති වීමට අවශ්‍ය නම් විවිධ ජාතීන් ජීවත් වන මේ රටේ සැම දෙනාගේ ම සමාන අයිතිවාසිකම් ආරක්ෂා විය යුතු යි.

ව්‍යවස්ථාවේ පවතින යම් යම් ගැටලු නිරාකරණය කර ජාති, ආගම් භේදවලින් තොරව රට තුළ ජීවත් වීමට අවශ්‍ය ආකාරයට පසුබිම සැකසිය යුතු යි. එසේ ම සැම ආගමකට ම ආගමික නිදහසත් සංස්කෘතික නිදහසත් හිමි විය යුතු යි.

ජාත්‍යන්තර බලපෑම් හමුවේ ශ්‍රී ලංකාවට තනි ව තීරණ ගැනීමට නොහැකි වීම සංවර්ධනයට හා නිදහසට විශාල බලපෑමක්. විශේෂයෙන් ඉන්දියාව, අමෙරිකාව වැනි රටවලට අවශ්‍ය පරිදි තීරණ ගැනීමට යි සිදුවෙලා තිබෙන්නේ. මේ නිසා අප තවමත් නිදහස නොලැබූ රටක් ලෙස යි සිටින්නේ.

**ව්‍යවස්ථාවේ පවතින යම් යම් ගැටලු නිරාකරණය කර ජාති, ආගම් භේදවලින් තොරව රට තුළ ජීවත් වීමට අවශ්‍ය ආකාරයට පසුබිම සැකසිය යුතු යි. එසේ ම සැම ආගමකට ම ආගමික නිදහසත් සංස්කෘතික නිදහසත් හිමි විය යුතු යි.**

## ධර්මිනි - පැරතිතුරෙයි

**අපට** නම් කිසි නිදහසක් ඇත්තේ නැහැ. දුප්පත් අපි එදා දවස ජීවත් වෙන්නෙ දවසේ කුලියක් කරලා. ඒ වෙනුවෙන් අපට දවසේ වියදමවත් පිරිමසා ගන්න තරමේ මුදලක් ලැබෙන්නේ නැහැ. දරුවන් පාසල් යවා ඔවුන්ගේ අවශ්‍යතා පිරිමසා ගන්න, කෑමට බීමට දවසේ කුලියෙන් ලැබෙන මුදල ප්‍රමාණවත් නැහැ. ඉතින් අපි නිදහස භුක්ති විඳිනවා. අපට නිදහසක් තිබෙනවා යැයි කියන්නේ කොහොම ද? මේ දුප්පත්කම නැති කළ දවසට තමයි අපට නිදහස ලැබෙන්නේ.





## එන්. පරමේෂ්වරන්

ජනමාධ්‍යවේදී

යුද්ද සමයේ අප කවුරුත් ජීවත් වූයේ අසීරුවෙන් බාධක මැද. ඒ සමයේ අපට මාධ්‍යවේදීන් ලෙස හෝ නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමට තිබුණේ දැඩි බාධාවක්. එසේ ප්‍රකාශ කිරීම අපේ ජීවිතය අවදානමක හෙළා ගැනීමක් වුණා.

පසුගිය රජය සමයේ මාධ්‍යවේදීන් ලෙස අපට නිදහසේ කරුණු විමසා වාර්තාකරණයට විවිධ බාධක තිබුණා. එහෙත් මේ රජය යටතේ අපට කරුණු විමසා බලා අපගේ රාජකාරිය නිදහසේ කරගෙන යාමට හැකි වී තිබෙනවා. පසුගිය රජය සමඟ සැසඳීමේදී පසුගිය රජයට වඩා වැඩි නිදහසක් අපට ලැබී තිබෙන බව යි කිව හැක්කේ. සුළු ජාතීන් සම්බන්ධයෙන් පසුගිය රජය සමයේ තිබූ බලපෑමේ කිසිදු වෙනසක් සිදු වී ඇති බවක් පෙනෙන්නට නැහැ. වර්තමානයේත් ඒ තත්ත්වය එලෙස ම පවතිනවා.

අපේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් වශයෙන් වෙන්කර බැලීම, සැලකීම නිසයි බොහෝ ගැටලු මතු වෙලා තිබෙන්නේ. එය නිදහසට ද විශාල බලපෑමක්. ඒ නිසා සියලු දෙනාට ම සමාන නිදහසක් භුක්ති විඳීමට නම් සැම දෙනා ම එක ම ශ්‍රී ලාංකික ජාතියක් ලෙස සැලකීම යි වැදගත්.

උතුරේ සහ නැගෙනහිර ජනතාවගේ අවතැන් පිරිස් නැවත පදිංචි කිරීම ඉක්මනින් සිදු විය යුතු යි. එසේ ම ඔවුන්ගේ ආගමික නිදහස, ඉඩම් අයිතිය ලැබුණොත් පමණ යි උතුරේ අපට නිදහස සැබෑවක් බවට පත් වන්නේ.









**හින්දු භක්තිකයන් කෘතගුණ සැලකීමේ මංගල්‍යය හෙවත් තෛපොංගල් සමරන්නේ මහත් භක්තියෙන් සහ ගෞරවයෙන්. යාපනයේදී මෙවර තෛපොංගල් සැමරුණේ ද ඒ භක්ත්‍යාභිමානය ඔප් නැංවෙන පරිද්දෙන්. මේ, ඒ පිළිබඳ ව කැමරාකාචයේ සටහන් වූ දසුන් කිහිපයක්.**

## ධනු - කෝන්ඩාවිල්

**කාන්තාවට** නිදහස අඩුයි. අපේ කාන්තාවන්ට බොහෝ කාරණාවලදී සීමා රැසකට යටත් වෙන්න සිද්ධවෙලා. සහජීවනය පිළිබඳ කතා කිරීම පමණයි සිදු වන්නේ. එහෙත් සත්‍ය වශයෙන් ම එලෙස සහජීවනයක් ඇත්තේ නැහැ. පසුගිය රජය සමයේ එතරම් නිදහසක් නොතිබුණත් ඊට වඩා වැඩි නිදහසක් දැන් තිබෙනවා.

ජාති, ආගම් භේද නොමැති ව සැම දෙනාට ම එකාවන් ව ජීවත් වීමට අවස්ථාව ඇති නම් පමණයි අපට සැබෑ නිදහසක් ලැබෙන්නේ.

## ආදවන් - අරියාලෙයි

රජයේ සේවක

**බාහිර** වශයෙන් සංවර්ධනයත්, ජීවත් වීමේ නිදහසත් තිබෙනවා. ඒත් පුද්ගලයන් වශයෙන් අපට මානසික ව අභ්‍යන්තර නිදහසක් ඇත්තේ නැහැ.

නිදහස පිළිබඳ කතාව වෙනස්. එහෙත්, සැබෑ නිදහස පිළිබඳ ක්‍රියාකාරීත්වය වෙනස්. එක්තරා විදිහකට නිදහස වෙස් මුහුණු බැඳීමක් වගෙයි. සහජීවනය පවතින්න නම් මේ පළාතේ බහුතරයක් වන ජනතාවගේ හිතට සැහැල්ලුවක්, වෙනසක් ලබා දිය යුතු යි.

අප ජීවත් වන්නේ ප්‍රශ්න රැසක් මැද. නියම නිදහස, සහජීවනය ඇති වීමට නම් සංස්කෘතික සහ ආගමික නිදහසත් ලැබිය යුතු යි. ඒ වගේ ම එයට හිමි ගරුත්වය ද ලැබිය යුතු යි.

## ගනේෂන්

පෞද්ගලික ආරක්ෂක

චාවාකච්චේරි

**නිදහස** තිබුණත් සුළු ජාතික කොටසට සහ ඔවුන්ගේ ආගමික ක්‍රියාවලියට සුළු නිදහසක් පමණ යි තිබෙන්නේ. නිදහස පිළිබඳ සතුටින් කතා කරන්නට නම් පළාත් සභාවලට බලය නිවැරදි ව විමධ්‍යගත වීමක් සිදු විය යුතු යි. එනම්, ස්වයං පාලනයක් තිබිය යුතු යි.




# දකුණේ නිදහස

ශ්‍රී ලංකාවේ නිදහස දිනා ගන්නට දකුණේ ජනතාව කළ කැප කිරීම් ඉතිහාස පොතේ රන් අකුරෙන් ලියවී තිබෙනවා. එවැනි මිනිසුන්ගේ කැපවීම් හමුවේ අද නිදහස භුක්ති විඳින දකුණේ ජනතාවගේ අදහසයි මේ.


සටහන
**ශ්‍යාමා සන්ධ්‍යානායකගේ**
**චම්මි ජයනෙත්ති**
**ඩබ්. එම්. ටී. ඉන්දික**

ඡායාරූප
**ලක්සිරි අල්විස්**

# ආර්ථික හා සදාචාරාත්මක නිදහස උවමනායි


**පූජ්‍ය වටගෙදර රේවත හිමි**
මාතර වටගෙදර ශ්‍රී සුදර්මාරාම පුරාණ පොත්ගුල් විහාරය ඇතුළු විහාර ගණයේ අධිපති සහ මාතර බෞද්ධ විද්‍යාලයේ කළමනාකාර අධ්‍යක්ෂ


**නිදහස අර්ථවත් වීමට නම් ආර්ථික වශයෙන් ස්වයංපෝෂිත විය යුතු යි. එමෙන් ම සදාචාරාත්මක විය යුතු යි. අපට ශ්‍රේෂ්ඨ සංස්කෘතියක් හිමිවුවත් තරුණ පරපුර අද රෝගීන් බවට පත් වේ නම් ඉන් අප අදහස් කරන නිදහස අර්ථවත් වන්නේ නැහැ.**

**මීට** වසර 69 කට පෙර ලැබූ උත්තරීතර නිදහසින් අප අද දක්වා ම උපරිම ප්‍රයෝජන ලබා ගෙන නැහැ. අප නිදහස ලබන විට අප වෙනුවෙන් එදා ඉදිරිපත් වූ අනෙක් ඥාති ජාතිය වන්නේ ද්‍රවිඩ ජාතිය යි. සර් පොන්නම්බලම් රාමනාදන් වැනි අය අප වෙනුවෙන් එදා ඉදිරිපත් වුණා. අපට නිදහස දුන්නත් ඔවුන් නික්මිලා ගියේ ජාතීන් අතර පුංචි භේදයක් ඉතිරි කරමින්. එහෙත් ද්‍රවිඩ ජාතිකයන් අපේ ම කොටසක් බව අප අවංකව ම පිළිගන්නා කාරණාවක්. 1915 සිංහල මුස්ලිම් කෝලාහලයේදී අපට සිදු වූ අසාධාරණය පිළිබඳ ව කතාබහ කළ අයෙක් සර් පොන්නම්බලම් රාමනාදන්. එහෙත් එම පුංචි භේදය ක්‍රමානුකූල ව වර්ධනය වෙමින් අවුරුදු 30ක මහා යුද්ධයක් දක්වා ව්‍යාප්ත වුණා. යුද්ධය ජයගත් අපට එහි අනිටු ප්‍රතිඵල අද ද දැකිය හැකි යි. එය නිදහසත් සමඟ පැමිණි තවත් ගැටලුවක්.

ඊළඟ වැදගත් කාරණය වන්නේ අපේ අධ්‍යාපනය යි. කෝල්බෲක් ප්‍රතිසංස්කරණවලින් පසු ව පැමිණි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මඟින් අපට ප්‍රයෝජනවත් අධ්‍යාපන ක්‍රමයක් සකස් වූයේ නැහැ. එහි ප්‍රතිඵල අප භුක්ති වින්දා. අනගාරික ධර්මපාලතුමා 'කළු සුද්දෝ බිහිවෙයි' යනුවෙන් ප්‍රකාශ කළේ ද එහි ප්‍රතිඵල දැන සිටි නිසා. ඊට සාපේක්ෂ ව අද අපට යම් සැනසීමක් තිබෙනවා. ඒ, අද අපේ අධ්‍යාපන රටාව අපට ගැළපෙන ආකාරයට සකස් වෙමින් තිබෙන නිසා. ඒ ගැන අපට ඇත්තේ අවංක සතුටක්.

ඒ කෙසේ වෙතත් අදටත් අපට අත්‍යවශ්‍ය වන ආර්ථික නිදහස ලැබී නැහැ. අපට තිබුණේ තේ, රබර්, පොල් මත යැපුණු වෙළෙඳ ආර්ථිකයක්. කකුල් තුනේ පුටුවක් ලෙසිනුයි එය අර්ථ දැක්වුණේ. මෙවැනි පසුබෑමක පිහිටීමට හේතුව අප කාගේත් මමායනයේ ඇති අඩුකම යි. පාලනයට ඉදිරිපත් වන හැම කෙනකු ම එක මතයකට පැමිණිය යුතු යි. එය විවේචනාවලින් මෙන් ම විනිවිදභාවයකින් යුක්ත විය යුතු යි. පාලක පක්ෂය යම් දෙයක් ඉදිරිපත් කරන විට එය හොඳ වුවත් නරක වුවත් ඊට විරුද්ධ වීම අද අපේ රටේ තිබෙන ක්‍රමයක්. නිදහස ලැබීමෙන් පසු එම තත්ත්වය අපට අඛණ්ඩ ව ම දක්නට පුළුවන්. ඩී. ඇස්. සේනානායක මැතිතුමා අම්පාරේ ගොවිජනපද ව්‍යාපාරය ආරම්භ කරන විට ඊට විරුද්ධ වූ පිරිසක් සිටියා. එහෙත් එය හෝ අද නොතිබුණා නම් අපට අත්වන්නේ කුමක් ද යන්න සිතා ගත හැකි යි. මේ සඳහා අත්‍යවශ්‍ය වන්නේ විනිවිදභාවයෙන් කටයුතු කිරීම යි.

නිදහස අර්ථවත් වීමට නම් ආර්ථික වශයෙන් ස්වයංපෝෂිත විය යුතු යි. එමෙන් ම සදාචාරාත්මක විය යුතු යි. අපට ශ්‍රේෂ්ඨ සංස්කෘතියක් හිමිවුවත් තරුණ පරපුර අද රෝගීන් බවට පත් වේ නම් ඉන් අප අදහස් කරන නිදහස අර්ථවත් වන්නේ නැහැ. හැම ආගමකින් ම අපේක්ෂා කරන්නේ සාරධර්ම, සදාචාරය ආරක්ෂා කර ගැනීමක්. එහිදී තමන්ගේ ආගමට ගරු කරමින් අන්‍යාගමික මත ඉවසිය යුතු වෙනවා. ඒ අනුව නිදහස අර්ථවත් වීමට නම් ආර්ථික මෙන් ම සදාචාරාත්මක වශයෙන් ද අප ස්වයංපෝෂිත විය යුතු යි. ඒ වගේම වටගෙදර පන්සලේ සම්ප්‍රදායයක් විදියට අප ඡන්ද දෙන්න යන්නේ නැති බව ද කිව යුතු යි.

# පන්සල, පල්ලිය, කෝවිල සහ මුස්ලිම් පල්ලිය එකම ප්‍රදේශයක තිබීම ලෝකයට ම ආදර්ශයක්



**මව්ලවි එම්. එන්. ඉක්රාම් (අල්ෆාසි)**
කඩේවීදිය, මීරා ජුම්මා දේවස්ථානය (මාතර)

**ඉස්ලාම්** ධර්මය අන්තර්ගත වූ පාරිශුද්ධ වූ අල් කුරාණය මඟින් වසර 1400කට පෙර (උත්තම නායක) නබි නායක මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා සෑම විටදී ම අපහට පෙන්වා දෙන්නේ දෙවියන් වහන්සේගේ මැවුම්කරුවන් වන අප කිසිවකුට යටත් වී, වහල් වී ජීවත් වීමට අවශ්‍ය නැති බව යි. අප සියලු දෙනා දෙවියන් වහන්සේගේ මැවුම්කරුවන් නම් අප වහලුන් විය යුත්තේ දෙවියන් වහන්සේට පමණ යි. එය කුමන ජාතියක, ආගමක, කුමන තරාතිරමක වුවත් සමාන යි. කාන්තාවන්ගේ, දරුවන්ගේ, දුප්පතුන්ගේ මෙන් ම ධනවතුන්ගේ අයිතිවාසිකම්, වගකීම් කොබඳු දැ යි අපට ඉස්ලාම් ධර්මය මඟින් ඉතා මැනවින් පෙන්වා දෙනවා. ඉස්ලාම් ධර්මයට අනුව දේශපාලනයේදී පවා පවුල් පාලනයට අවසර ලබා නොදෙන්නේ සියලු දේ සුදුස්සාට ලැබිය යුතු හා සියලු දෙනාගේ නිදහස අගය කළ නිසා යි.

මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් එදා උත්තම නායක නබි නායකතුමා මක්කම තුළ ඉස්ලාම් ධර්මයට (ආගමට) අනුව රාජ්‍ය පාලනයක් ඇති කළත් කිසි ම අවස්ථාවකදී වෙනත් ධර්මයක් ඇදහීමට තිබෙන නිදහසට බාධා කළේ නැහැ. බාධා විය හැකි දේ වැළැක්වීමටත් කටයුතු කරනවා. අල්ලාහ් දෙවියන් හැර වෙනත් දෙවිවරුන් අදහන අයට බාධා නොකරන ලෙස යි කුරාණයේ සඳහන් වන්නේ. ඒ වගේ ම බලෙන් මේ ධර්මය ලබා දෙන්නැයි කුරාණය පවසන්නේ ද නැහැ. මිනිසුන් ජාති, කුල, ගෝත්‍ර වශයෙන් වර්ග කර තිබෙන්නේ වෙන්කර හඳුනා ගැනීමට යි. දෙවියන් වහන්සේ ඉදිරියේ ශ්‍රේෂ්ඨ වන්නේ දේව භක්තියෙන් ධර්මානුකූල ව ජීවත් වන පුද්ගලයන් පමණ යි. මේ නිසා ඉස්ලාම් ආගම නිදහස මැනවින් අගය කරන ගරු කරන ධර්මයක්.

වසර 1948 දී අප නිදහස දිනා ගත්තේ මේ රටේ සිංහල, දෙමළ, ඉස්ලාම් සියලු ජාතීන් එකතු වී කටයුතු කළ නිසා යි. ඒ ආකාරයට දිනාගත් නිදහස අර්ථවත් වීමට නම් අප ඉටු කළ යුතු කාරණා කිහිපයක් ම තිබෙනවා. සියලු ජාතීන් තමන්ගේ ධර්මයට අමතර ව සියලු ආගම් ඉගෙන ගත යුතු යි. එවිට එකිනෙකාට ගරු කිරීමටත් එකිනෙකාගේ මත ඉවසන්නටත් අපට හැකි වෙනවා. විවිධත්වයෙන් යුතු සමාජයේ එක්ව ජීවත් වීමට එය ඉතා වැදගත් වෙනවා.

ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජාතියට අයත් ජනතාව සිටින්නේ 9.9%ක් තරම් ප්‍රමාණයක්. බොහෝ රටවල නොමැති නිදහසක්, ජාතියක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ අපට තිබෙනාවා. වරක් ඊශ්‍රායලයේ සිට පැමිණි හිතවතෙක් අපෙන් විමසා සිටියේ ශබ්ද විකාශන යන්ත්‍ර මඟින් ආගම කීමට තරම් හැකියාවක් ලංකාවේ තිබේ ද යන්න යි. එය ඔවුන්ට පුදුමය දනවන කාරණයක් වුණා. පන්සල, පල්ලිය, කෝවිල එක ම ප්‍රදේශයක එකට තිබියදී සියලු දෙනා ම එක්සත් ව, සාමයෙන්, සහයෝගයෙන් ජීවත්වීම ලෝකයට ම ආදර්ශයක්. එය මේ රටේ නිදහස, සමගිය පිළිබඳ ව හොඳ නිදසුනක්. එය ඉදිරියට පවත්වා ගෙන යාමට සියලු දෙනා ම අවබෝධයෙන් කටයුතු කළ යුතු යි.

ඒ සඳහා සමාජයේ පිළිගැනීමට ලක්වන ආගමික, දේශපාලන විද්වත් සියලු දෙනා ම ඉදිරිපත් විය යුතු යි. ජාතිවාදී මතය බැහැර කළ යුතු යි. අප වසර 30ක ත්‍රස්තවාදී යුද්ධයක් නිසා පීඩා විඳි ජාතියක්. මේ නිසා දැන් මේ රටේ සිටිය යුත්තේ ජාතීන් දෙකක් පමණ යි. ඒ, මව්බිමට ආදරය කරන ජාතිය හා මව්බිමට ආදරය නොකරන ජාතිය වශයෙන්. උත්තම නායක නබි නායක තුමා සඳහන් කළෙත් ඔබ ජීවත් වන රටට ආදරය කරන්න. එවිට ඔබ අල්ලාහ් දෙවියන් වහන්සේ විශ්වාස කළ පුද්ගලයකුගේ සලකුණ වනු ඇති.





# ධර්මය තුළ එකිනෙකාට ගරුකරමින් ජීවත් වීමයි නිදහස

**ඩේමියන් අර්සකුලරත්න පියතුමා**
සිද්ධස්ථාන පරිපාලක - මාහර අප ස්වාමිදුවගේ ජාතික සිද්ධස්ථානය

මා විශ්වාස කරන ආකාරයට නිදහස පිළිබඳ ව කතා කරන විටදී එය පොදුවේ සියලු මිනිසුන් විඳින සියලු මිනිසුන්ට දැනෙන දෙයක් විය යුතු යි. එනම්, ආර්ථික, සමාජයීය හා සංස්කෘතික වශයෙන් ඔවුන්ගේ ජීවිතවලට නිදහසක් තිබිය යුතු යි. සමහර විට ජීවත් වීමට නිදහසක් තිබුණත් ජීවිතය ගෙනයාමට අවශ්‍ය ආර්ථික ශක්තිය නොමැති නම් එය සැබෑ නිදහසක් නොවෙයි. වසර 69ක නිදහසින් පසු වසර 30ක පමණ කාලයක් අප ගත කළේ යුද්ධයක් සමඟ යි.

යුද්ධය ඇති වුණේ කලහකාරී ත්‍රස්තවාදී කණ්ඩායමක් මර්දනය කිරීමට වුවත් එහි පීඩාව හා අයහපත් ප්‍රතිඵල සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනතාවට විඳින්නට සිදු වුණා. ජාතීන් අතර තිබූ සබඳතා බිඳ වැටී ඔවුන් හදවත්වලින් දුරස් වුණා. එක ම රටක ජාතීන් දෙකක් එකිනෙකට වෛර කිරීමට පටන් ගත් අතර උතුර - දකුණ අහසට පොළොව මෙන් දුරස් වුණා. යුද්ධය නිමාවට පත් වී එම ප්‍රදේශ නැවත ගොඩනැගීමේ කටයුතුවලට යොමු වූ විට අපට වැටහී ගිය කාරණයක් වුණේ, මේ සියලු දේ සඳහා බලපා තිබෙන ප්‍රධාන කාරණය මේ රටේ පක්ෂ දේශපාලනය බව යි. අද මේ රට පවතින මේ තත්ත්වයට මේ රටේ පක්ෂ දේශපාලනය සෘජු ව ම වගකිව යුතු යි. ලංකාවේ සංචාරයක් සඳහා පැමිණි ලී ක්වාන් යූ අගමැතිවරයා ආපසු සිංගප්පූරුවට ගියේ කවදා හෝ සිංගප්පූරුව ලංකාව මෙන් සංවර්ධනය කරන බව පවසමින්. අද ඒ රට සිටින්නේ කොතැන ද ? අප සිටින්නේ කොතැන ද? අපට දියුණු වීමට නොහැකි වී තිබෙන්නේ කවර හේතුවක් නිසා ද? ජනතාවට ඒ සඳහා සෘජු ව ම බලයක් නැහැ. ඔවුන්ගේ බලය ක්‍රියාත්මක කරන පාලකයන් රට දියුණු කිරීමට කටයුතු කළ යුතු යි.

අද මේ රටේ තිබෙන්නේ කකුලෙන් අදින දේශපාලන ක්‍රමවේදයක්. යහපාලන සංකල්පය ඉදිරියට ගමන් කරන්නේ ද නැහැ. පසුගිය කාලය තිස්සේ සිදු වූ සියලු දේ වසර 02 කදී ආපසු හැරවිය නොහැකි යි. ඒ වගේ ම රජය ක්‍රියාවට නංවන ක්‍රමවේදයෙහිත් කිසියම් වරදක් තිබෙනවා. මේ නිසා මිනිසුන් අතර කිසියම් වූ විරසකයක්, කලකිරීමක් ද ඇති වෙනවා.

නිදහසක් ලෙස අදහස් වෙන්නේ එසේ කලකිරීමට අපහසුතාවට පත් නොවී දරුමල්ලන් සමඟ තමන් කැමැති ධර්මයක් අදහමින් කැමැති රැකියාවක නියැලෙමින් ජීවත් විය හැකි පරිසරය යි. ඒ නිදහස යථාර්ථයක් වීමට නම් සියලු ජාතීන්ට එක් වී ජීවත් විය හැකි පරිසරයක් පාලකයන් විසින් සකස් කර දිය යුතු යි.

බොහෝ දේශපාලනඥයන්ට පැවැත්මක් තිබෙන්නේ මිනිසුන් බෙදී සිටින තරමට යි. මිනිසුන්ට ආදර්ශවත් වන ආගමික නායකයන් පවා විඳි බසින තත්ත්වයට රට පත්වී අවසන්. විද්වතුන් තම හෘද සාක්ෂියට එකඟ නැතත් තම උගත්කම, තත්ත්වය, බලය යන සියල්ල දේශපාලනය ඉදිරියේ බාල්දු කරන ආකාරය ඉතා ම කලකිරෙන සුළු යි. මාධ්‍ය වුවත් එලෙසම යි. සමහර දේශපාලන සංවාද නැරඹූ විට පසුදා අසල්වැසියන් එකිනෙකාගේ මුහුණ බලන්නේ නැහැ. මේ දේශපාලනය මායාවක්. මවාපෑමක්. මේ මවාපෑම, මායාව සමාජයෙන් ගිලිහී ගියදාට මිනිසුන්ට සත්‍යය වටහාගෙන නිදහස යථාර්ථවාදී ව විඳින්නට හැකි වේවි.

ඒ සඳහා අප අතර ආගමික හා ජාතික සංහිඳියාව වර්ධනය විය යුතු යි. යුද්ධය ජයග්‍රහණය කළත් යුද්ධය නිසා බිඳ වැටුණු, පැරුණු සියලු ජාතීන්ගේ සිත් සුවපත් කළ යුතු යි. ඒ සඳහා අවශ්‍ය පරිසරය තව ම අප සකස් කර නැති බව යි විශ්වාස කරන්නේ. යුද්ධයෙන් පසු ව එම ප්‍රදේශවල ජනතාවගේ සියලු අවශ්‍යතා සපුරා දිය යුතු යි. ඔවුන් අප වගේ ම මේ රටේ මිනිසුන්. අපට තිබෙන අවශ්‍යතා ඔවුන්ටත් තිබෙන බව පිළිගැනීමට සූදානම් නොමැති බව යි ගැටලුව. විවිධත්වය අගය කරමින් එයට ගරු කරමින් කටයුතු කළ යුතු යි. ඒ සඳහා මාධ්‍යයට ද ඉටු කළ යුතු විශාල කාර්යභාරයක් තිබෙන බව යි මා විශ්වාස කරන්නේ. යහපත් ආකල්පවලින් පිරී ගිය එකිනෙකාගේ ධර්මය තුළ ජීවත් වන මම, ඔබ, අප එකිනෙකාට ගරු කරනවා නම්, අප බලාපොරොත්තු වන සැබෑ නිදහස තිබෙන ලෝකයේ හොඳ ම රටක් බවට ශ්‍රී ලංකාව පත්වේවි.



**පලඟසිංහ**
(ගොවි මහතා) - පාලටුව

ගොවි ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුම් ලබා දෙන්නට කටයුතු කරනවා නම් පමණයි, ඔවුන්ට නිදහසේ ජීවත් වීමට හැකි වන්නේ.

මම වසර 30කටත් වැඩි කාලයක් වී ගොවිතැනේ නිරත වී සිටිනවා. පාලටුව පැරකුම් ගොවි සංවිධානයේ සාමාජිකයෙක් වශයෙන් ද කටයුතු කරනවා. අපට වී ගොවිතැන සාර්ථකව කර ගැනීමට නොහැකි වී තිබෙන්නේ වතුර ප්‍රශ්නය නිසා. කලින් ඉතා හොඳින් ම වගා කළ මේ යායේ බොහෝ කුඹුරු නිල්වලා යෝජනා ක්‍රමයෙන් ඇළවේලි පුළුල් කිරීම සහ කිවුල් දිය මිශ්‍ර වීම නිසා පුරන් වෙලා.

ගොවිතැන් කටයුතු නිසියාකාර ව කරගන්න නොහැකි ව තිබියදී ගොවි ජනතාවට නිදහසක් ලැබෙන්නේ නැහැ. හාල් මිල ඉහළ ගියත් ගොවියාට ඒ වාසිය ලැබී නැහැ. නිල්වලා යෝජනා ක්‍රමය සාර්ථක කර ගැනීමට ක්‍රමවේදයක් සකස් කර දෙනවා නම් එදාට මේ ප්‍රදේශයේ ගොවි ජනතාවට නිදහස ලැබේවි.





## ශිරන්ති ධම්මිකා - ගොඩගම

(සුළු වෙළෙඳ ව්‍යාපාරික)

යුද්ධය අවසන් නිසා ඇත්තට ම මුළු රට ම දැන් නිදහස්. තමන්ගේ රැකියා කටයුතු සිදු කරගෙන නිදහසේ ජීවත් වීමට පුළුවන්. මේ ව්‍යාපාරය ආරම්භ කර වසර 15කට ආසන්න යි. පසුගිය රජය කාලයේ රුහුණු සංවර්ධන බැංකුවේ ආධාර ඇතිව යි මේ කුඩා ව්‍යාපාරය ආරම්භ කළේ. මේ දිනවල වෙළෙඳාම් සරු යි. එළවළු මිල සාපේක්ෂව අඩුයි. එහෙත් පහතරට එළවළු මිල නම් තරමක් ඉහළයි. එළවළු, පලතුරු මිල අඩු වූ විට මිනිසුන්ගේ වියදම් අඩුයි. මිනිස්සු සතුටින් සිටින්නේ ජීවන ප්‍රශ්න අඩු නිසා. තවත් කාරණයක් සඳහන් කළ යුතු යි. ඒ, අසාර්ථක වී තිබෙන නිල්වලා යෝජනා ක්‍රමය සාර්ථක කර ගැනීමට රජය මැදිහත් වීම. එවිට මේ අවට ප්‍රදේශයේ ගොවි ජනතාවගේ වගා කටයුතු සාර්ථක වේවි. ඔවුන්ගේ අතමිට සරු වේවි. ඒ වගේම අපටත් හොඳ කල දවසක් උදාවීමට එය හේතුවක්. එදාට මේ ප්‍රදේශයේ අප සියලු දෙනාටම සැබෑ නිදහසක් ලැබේවි.

## ඩබ්. එච්. චන්ද්‍රලතා - දෙවුන්දර

(මල් අලෙවිකරන්නී)

මමත් මගේ මහත්මතයත් ජීවත් වෙන්නේ මේ රැකියාවෙන්. මේ රැකියාව පටන් ගත්තේ මීට වසර 30ට පමණ පෙර. මගේ මහත්තයා ඇදුම රෝගියෙක්. ඔහුට රැකියාවක් කළ නොහැකි යි. මේ නිසා සියලු වියදම් දරා ගන්නේ මේ රැකියාවෙන්. මිනිසුන්ට නිදහසක් ලැබෙන්න නම් ආර්ථික අපහසුකම්වලට මීට වඩා විසඳුමක් ලැබෙන්නට අවශ්‍ය යි. බඩු මිල අඩුවිය යුතු යි.

අපේ ආදායම වැඩි වෙන්නේ මිනිස්සු වැඩිපුර පන්සලට එනවා නම් පමණ යි. පෝයදාට බැතිමතුන් වැඩිපුර පන්සලට පැමිණෙනවා. මිනිස්සු බියෙන් සැකෙන් තොරව නිදහසේ පන්සලට පැමිණෙන්නේ රටේ නිදහසත් තිබෙන නිසා ය කියලයි මම විශ්වාස කරන්නේ. ඇත්තට ම ඒ නිදහස නිසා වෙන්නට ඇති.



## ජයන්ත

බෝට්ටු හිමිකරු

දෙවුන්දර

පුරාණවැල්ල

ධීවර වරාය

මේ වරාය වැඩි ම ආදායමක් ලබන ධීවර වරායක්. ඒත් ධීවරයන්ට සහ බෝට්ටු හිමිකරුවන්ට මෙහි කිසි ම පහසුකමක් නැහැ. අඩු ම තරමේ මූලික පහසුකම් වන නාන කාමර පහසුකම් හෝ වැසිකිළි පහසුකම්වත් නැහැ. අපට නිදහසේ මුහුදු යන්නත් නැහැ. දැන් තිබෙන්නේ යුද්ධය පැවති කාලයේවත් නොතිබුණු ප්‍රශ්නයක්. මුහුදු නොගියත් බෝට්ටුව නවතා තබනවාට මෙහි තීරු කුලිය දවසට රු. 160/=ක් ගෙවන්න ඕන. මේක හරිම අසාධාරණ වැඩක්. දැන් අපේ ආදායමත් පෙරට වඩා 50%කින් අඩුවෙලා.



## ආර්. පී. කමල්

තංගල්ල

අපට මේ රැකියාව කරන්න නම් නිදහසක් තිබෙනවා. ගැටලුවක් නැහැ. ධීවර වරායට දෛනික ව පැමිණීමේදී පවතින අපහසුතා තමයි තිබෙන්නේ. දකුණේ සිටින ධීවරයන් වැඩි දෙනෙක් පොඩි බෝට්ටුවල රැකියාව කළත් දැන් ඒවා ක්‍රමයෙන් නැති වෙලා. ඒ නිසා බහුදින යාත්‍රාවල අයට වැඩි ආදායමක් ලැබෙනවා. කුඩා බෝට්ටුවල රැකියාව අහිමි වූ නිසා දෛනික ව අපට කීයක් හරි උපයා ගන්න දැල් මහන්න එන්න වෙලා. මේ රැකියාවෙන් අපට දිනකට ලැබෙන්නේ රුපියල් 1200/- යි. ඊට පෙර මුහුදු ගිහින් රු. 4000/=ක් 5000/=ක් පමණ දවසකට ආදායම් ලැබුවා. දැල් මැහීම වුවත් දීර්ඝ කාලීන ව කරන්න මගේ බලාපොරොත්තුවක් නැහැ. රස්සාවක් නැති නිසා දැන් මේක කරනවා.

## සුගත් මහතා

සුළු වෙළෙඳ ව්‍යාපාරික

දෙවුන්දර

අපට නම් රැකියාව කරගෙන යන්න නිදහස තිබෙනවා. දැන් ලංකාව පෙරට වඩා ටිකක් දියුණු යි. නිදහස තිබෙන නිසා විදේශිකයන් ද අපේ රටට එනවා. ප්‍රදීපාගාරය නරඹන්නට කොළඹ කාර්යාලයෙන් අවසර ලබා ගත් දේශීය මෙන් ම විදේශීය සංචාරකයන් වැඩි පිරිසක් පැමිණෙනවා. වසර ගණනාවක් ධීවර රැකියාවේ යෙදී සිටියත් සෞඛ්‍ය හේතු මත ඉන් ඉවත් වී සාමාන්‍ය විදියට ප්‍රදීපාගාරය අසළ නිදහසේ සුළු වෙළඳාමක් කරගෙන මම සතුටින් ජීවත් වෙනවා.



## සුනන්ද

බෝට්ටු හිමිකරු

දෙවුන්දර පුරාණවැල්ල ධීවර වරාය

මේ වරායේ මට බෝට්ටු දෙකක් තිබෙනවා. ඒත් ප්‍රශ්න ගොඩක් තිබෙනවා. නීති රීති දාලා අපේ නිදහසට බාධා කරලා නොයෙකුත් පෝරම පුරවලා ඉවරයක් නැහැ. මේ නිසා දැන් රාහු කාලයට පෙර මුහුදු යන්න ලැබෙන්නේ ම නැහැ. මීට අවුරුදු 10කට 15කට පෙර මේ වගේ කිසි ම ප්‍රශ්නයක් තිබුණේ නැහැ. නිදහසේ අප රැකියාව කළා. මුහුදු ගියා. ඒත් දැන් අපට කිසි ම නිදහසක් නැහැ. අපේ වියදමෙන් සියලු දේ කර ගත්තත් මුහුදු යන්න කිසි ම නිදහසක් නැහැ. අපට බෝට්ටු වගේ ම මුහුදු රස්සාවත් එපා වෙලා. මෙහේ කාර්යාලයෙන් කියන්නේ දැන් තිබෙන නීතිය ඒක කියලා. නිදහසේ රැකියාව කරගන්න අනවශ්‍ය වදයක් වන නීතිය ලිහිල් කරන්න කියල යි අපි ඉල්ලන්නේ. රේඩියෝ මධ්‍යස්ථානය අක්‍රිය වෙලා. මෙහි තිබෙන මූලික පහසුකම් පවා ප්‍රමාණවත් නැහැ. මේ වරායේ බෝට්ටු 700ක් පමණ නවතා තැබිය හැකි වුණත් එකවර මාලු අලෙවි කිරීමේදී පවතින ඉඩකඩ කොහොමටවත් ප්‍රමාණවත් නැහැ. බෝට්ටුවලට තෙල්, වතුර ගහන්න ගියත්

# නැඟෙනහිර නිදහස

සටහන
**ගනේෂ් මයුරප්‍රියන්**

සමඟ මඩකලපු දිස්ත්‍රික් ප්‍රවෘත්ති නිලධාරී
**වී. ජීවානන්දන්**



## ජීවත් වීමේ නිදහස දැන් ලැබී තිබෙනවා

**නඩරාජා සෙන්දිල්**
පූජක - ආනයිප්පන්දි කෝවිල

**පසුගිය** යුද සමයේ අපට කිසිදු නිදහසක් තිබුණේ නැහැ. ඒ කාලේ අපේ ඥාති නිවෙසකට හෝ උත්සවයකට හෝ අප කැමති තැනකට යාමේ හැකියාවක් හෝ තිබුණේ නැහැ. යුද්ධය නිවී අවුරුදු 07ක් ගත වුණාට පසුව යි වසර 69ක නිදහසට අර්ථයක් ලැබී තිබෙන්නේ. දැන් අපට රට තුළ සමාජයේ බාධාවකින් තොරව නිදහස භුක්ති විඳිමින් ජීවත් වීමේ නිදහස ලැබී තිබෙනවා. චෙක් පොයින්ට්, මාර්ග බාධක, පරීක්ෂා කිරීම් කිසිවක් නැති නිසා සැම දෙනාගේ ම සිත්වලට තදින් ම ඒ නිදහස දැනී තිබෙනවා.

මේ වන විට මේ ප්‍රදේශවල සියලු ම ජාතීන්වලට අයත් අය ජීවත් වන්නේ ඥාතීන් විදිහට. සැමදෙනා අතර ම ඉතා හොඳ සහෝදරත්වයක් සහ බැඳීමක් තිබෙනවා. කරදරයකදී අවශ්‍යතාවකදී අප හැම දෙනාම එකිනෙකාට උදවු කර ගනිමින් එකා වගෙයි ජීවත් වන්නේ. සමාජයේ යම් යම් කොටස් විසින් ජාතික ආගමික ගැටලු මතු කිරීමට උත්සාහ ගන්නවා. අප බුද්ධිමත් ව සිතාමතා මේ නිදහස තවදුරටත් ආරක්ෂා කර ගත යුතු යි.

තවමත් යම් ප්‍රදේශවල අවතැන් වූ පිරිස් ජීවත් වෙනවා. ඔවුන් ඉක්මනින් ඔවුන්ගේ භූමිවල පදිංචි කරවා ඔවුන්ට ද සතුටින් නිදහසේ ජීවත් වීමට අවස්ථාව ලබාදීම කළ යුතු වෙනවා.

එසේ ම වර්තමානයේ ආර්ථික වශයෙන් සැම දෙනා ම ඇඩි අසීරුවකට පත්ව තිබෙනවා. ඒ, ජීවත් වීමේ ගැටලුව. බඩු මිල ඉතා ඉහළ යි. මෙය දෛනික රැකියා කර ජීවත් වන පිරිසට තදින් ම බලපා තිබෙනවා. මේ නිසා ආර්ථික වශයෙන් සහනයක් ලැබීමට ද සැබෑ නිදහසේදී අවශ්‍යයි.

## නිදහස හැම ජන කොටසකටම ලැබිය යුතුයි



**මව්ලවි ජේ. එම්. ජාසීර්**
කාතන්කුඩි

**සියලු** පාර්ශ්ව නිදහස වෙනුවෙන් කැප වී සිටින බවක් පෙනෙන්නට තිබෙනවා. යුද සමයේ මිනිසුන් නිදහස නොමැතිව පීඩාවෙනුයි ජීවත් වුණේ. දැන් යුද්ධය නිම වී ඇති නිසා මිනිසුන් සාමයෙන් සහ සතුටින් ජීවත් වෙනවා. ඒ සඳහා සහයෝගය ලබා දුන් සියලු දෙනාට ම ස්තුති කළ යුතු යි.

මේ වන විට බොහෝදුරට නිදහසේ ජීවත් වීමට, රැකියා කිරීමට අවස්ථාව ලැබී තිබෙනවා. එහෙත් සමහර අවස්ථාවල නිසි ගෞරවය ලබා දීමක් සිදු වන්නේ නැහැ. උදාහරණ ලෙස, බස් රථවල හිමිවරුන්ට ආසනයක් වෙන් කර තිබුණත් වෙනත් ආගමික නායකයන් වෙනුවෙන් ඒ ගෞරවය ලබා දීමට ක්‍රියා කර නැහැ.

යහපාලනය ආරම්භ වන විට සියලු දෙනා ම එක්ව සාමයෙන් ජීවත් වුණා. ආණ්ඩුවටත් ඒ පිළිබඳ අවශ්‍යතාව තිබුණා. ජාති භේද ඇති කිරීමට ආණ්ඩුවට කිසිදු වුවමනාවක් නැහැ. එහෙත් විවිධ තනි කණ්ඩායම් තමන්ගේ පැවැත්ම වෙනුවෙන් ජාතිවාදී කතා අවුස්සමින් ක්‍රියා කරනවා.

ලැබී තිබෙන නිදහස සියලු ජන වර්ගයන්ට ම එක ලෙස ලැබිය යුතු යි. එවිට යි වඩා හොඳ නිදහස් සමාජයක් බිහි වන්නේ. මේ රජය මුල් කාලයේදී බඩු මිල අඩු කරමින් ක්‍රියා කළා. එහෙත් නැවතත් ජනතාවට දරා ගැනීමට අපහසු ලෙස බඩු මිල ඉහළ ගිහින්. ආණ්ඩුව පත් කිරීමට එකඟ වූ ජනතාව ම අද ආණ්ඩුවට විරුද්ධ ව අදහස් ප්‍රකාශ කරන ආකාරයකුයි දකින්නට තිබෙන්නේ. එසේ ම රට තුළ ජාතිවාදී අදහස් ඇති වන විට ඊට එරෙහි ව කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට ද ආණ්ඩුව අපොහොසත් වුණා.





## මව්ලවි අබ්දුල් කෛයුම්
මඩකලපුව

**පෙර** තිබූ තරම් නිදහසක් ජනතාවට තිබෙන බවක් පෙනෙන්නට නැහැ. පසුගිය සමයේ විවිධ ප්‍රශ්න තිබිය දීත් නිදහසේ ඇවිදීමට සහ වැඩ කටයුතු සිදු කර ගැනීමට අවස්ථාව තිබුණා.

රජයේ සහජීවන ක්‍රියාදාමය ඉදිරියට ගෙන යාම අපහසු වී තිබෙනවා. සිංහල සහ මුස්ලිම් ජනතාව අතර ප්‍රශ්න මතු කර තිබීම ඊට ප්‍රධාන හේතුවක්. බොදු බල සේනා, සිංහලේ ආදී කණ්ඩායම් සංවිධානය විසිනුයි මෙවැනි ප්‍රශ්න නිර්මාණය කරමින් සිටින්නේ. පවත්නා තත්ත්වයට වඩා එහා ගිය නිදහසක් ඇති විය යුතු යි. පොදු සේවාවන් වැනි දේ තුළදී මේ නිදහස පැහැදිලි ව ක්‍රියාත්මක විය යුතු වෙනවා.

## කුසුමා මල්ලවආරච්චි
ගෘහණියක් මඩකලපුව

**යුද්ධ** කාලයේ අපි ජීවත් වුණේ බියෙන් හා සැකෙන්. කොයි මොහොතක අපේ ජීවිතවලට අනතුරක් එයි ද කියන එක ගැන අවධානමක් තිබුණා. එහෙත් පසුගිය රජය යුද්ධය නිමා කරල රටේ ඕනෑම තැනක අපට ජීවත්විය හැකි පසුබිමක් හදල දුන්නා. ඔවුන්ට ඒ නිදහස ලබා දීම ගැන ස්තුතිවන්ත විය යුතු යි. මේ වන විට මේ ප්‍රදේශයේ සියලු ජාතීන් ගැටලුවකින් තොරව සහජීවනයෙන් ජීවත් වෙනවා.

මම දකින ගැටලුව වන්නේ කුමන නිදහස තිබුණත්, ජීවත් වීමට ආර්ථික නිදහස නොමැතිකම. බඩු මිල අහස උසට නැගලා. පවුලක් නඩත්තු කිරීම විශාල ප්‍රශ්නයක්. මෙය සමාජයේ කවුරුත් පිළිගන්න දෙයක්. මේ නිසා ජීවත් වීමේ ගැටලුව නිසා අපට සැබෑ නිදහසක් තිබෙනවා ද කියන තැනට පත් වෙලා. ඒ නිසා මේ නිදහස වඩාත් අර්ථවත් වන්නේ ජීවත් වීමට සුදුසු ආර්ථිකයක් තිබුණොත් පමණ යි.

අනෙක් කාරණය තමයි මේ රජය සියලු ජාතික සම්පත් විකුණා දැමීම ආරම්භ කරලා. ඒ නිසා මේ නිදහස තව කොපමණ කලක් භුක්ති විඳින්න හැකි වෙයි ද යන්න ගැටලුවක්. ඒ හැර මේ රජය පිළිබඳ ව නම් වෙන කිසි ම කාරණයක් මගෙන් අහන්න එපා.



## එස්. සිවලිංගම්
සිවිල් ඉංජිනේරු - තාන්ඩවන්වලි

**1948** නිදහස ලැබුවා. යුද්ධය අවසන් වෙලා වසර 07ක් ගෙවුණා. එහෙත් අප හිතන්නේ නැහැ අප සම්පූර්ණ නිදහස භුක්ති විඳිනවා කියා. මේ නිදහස වඩාත් අර්ථවත් වන්නට නම් රට තුළ බලය පළාත් මට්ටමින් බෙදා දීම ද කළ යුතු යි. එවිට යි අපට පූර්ණ නිදහසක් සියලු දෙනාට ම තිබෙනවාය කියා කියන්න පුළුවන්. කෙසේ වුවත් පවතින තත්ත්වය තුළ වෙනදාට වඩා නිදහසක් තිබෙන බව අප බැහැර කරන්නේ නැහැ.

මේ ප්‍රදේශවල සිංහල, දෙමළ, මුස්ලිම් අපි සැමදෙනා ම සහයෝගයෙන් සහජීවනයෙන් ජීවත් වෙනවා. අපි අතර කිසි ම ගැටලුවක් නැහැ. නමුත් දේශපාලනඥයෝ සහ විවිධ සංවිධාන ඔවුන්ගේ පැවැත්ම සඳහා අප අතර ගැටලු මතභේද නිර්මාණය කිරීමට උත්සාහ කරන බවක් පෙනෙන්නට තිබෙනවා.

බහුතර ජාතියක තිබෙන සියලු අයිතිවාසිකම් සුළුතරයටත් ලැබෙනවා නම් පමණයි නිදහස සැමට ම සමාන නිදහසක් ලෙස පෙන්වා දෙන්නට පුළුවන්. ඒ නිසා එවැනි සමාජ පසුබිමක් නිර්මාණය විය යුතු යි.

ජනාධිපතිවරයා පැහැදිලි දර්ශනයකින් තමන්ගේ බලය අනෙක් පාර්ශ්වවලටත් ලබා දීමට උත්සාහ ගන්නවා. සමහර දේශපාලන ක්‍රියාකාරකම් නිසා සහ විවිධ කණ්ඩායම්වල මතභේද නිසා ඊට බාධා ඇති වෙලා.



## සිවලිංගම් රාජනායගම්
ගොවි මහතෙක් - නාවක්කාඩු

**වසර** 69ක නිදහස තුළ අප ඉතා ම සාමකාමී ව සහ සතුටින් ජීවත් වෙනවා. කිසිදු බාධාවකින් තොරව නිදහසේ අපේ රැකියාව සහ අනෙකුත් දේවල් කිරීමට සුදුසු පරිසරයක් බිහි වී තිබීම ඉතා වැදගත්.

ජාතීන් වශයෙන් සලකා බලද්දී අප සියලු ම ජාතීන් ඉතා සහයෝගයෙන් වගේ ම එකිනෙකාට උදවු කර ගනිමින් සහජීවනයෙන් ජීවත් වෙනවා. මේ නිසා අප අතර ගැටලු හෝ ගැටුම් හෝ ඇත්තේ නැහැ. මේ වන විට අප කාටත් නිදහසේ රටක් තුළ නිදහසේ ජීවත් වීමටත් නිදහසේ ඕනෑම තැනක යාමට ඒමටත් හැකි පසුබිමක් තිබෙනවා. එය අපේ දරුවන්ගේ අනාගතයටත් ඉතා වැදගත්. යම් යම් සුලු ගැටලුකාරී තත්ත්වයන් මඟ හැරුණා නම් මේ නිදහස තවත් අර්ථවත් ව භුක්ති විඳින්නට පුළුවන්.

පසුගිය රජය යුද්ධය වැනි අසීරු තත්ත්වයක් තුළ යි පොහොර සහනාධාරය වැනි සහන ගොවියාට ලබා දුන්නේ. දැන් යුද්ධය සහ වෙනත් ගැටලු නිම වෙලා. එහෙත් වර්තමාන රජය මේ සහනය යම් කප්පාදුවකට ලක් කරලා. පොහොර සහනාධාරය වෙනුවට ලබා දෙන්නේ මුදල්. එය ප්‍රමාණවත් නැහැ. එසේ ම පොහොර සඳහා මුදල් ලබා ගැනීමට යාමේදී විවිධ දුෂ්කරතාවලට මුහුණදීමට සිදු ව තිබෙනවා. මේ සඳහා රජය මැදිහත් ව සහනදායි ක්‍රමයක් සකසා දිය යුතු යි.



**රාමයියා සුබ්‍රමනියම්**
ගොවි මහතෙක් - වවුනතිව්

**පෙර රජය විධිමත් විදිහට පොහොර සහනාධාරය ප්‍රමාදයකින් තොරව ලබා දුන්නා. එහෙත් දැන් ඒ වැඩපිළිවෙළ සිදු වන්නේ කිසි ම පිළිවෙළක් නැතිව.**



**එම්. රත්නම්**
ධීවර වෘත්තිකයෙක් - වවුනතිව්

**දැන්** අප සතුටින් ජීවත් වෙනවා. නිදහස පිළිබඳ ගැටලුවක් නැහැ. කලින් තිබුණු තත්ත්වයට වඩා හොඳ තත්ත්වයක් තිබෙනවා.

ගොවියන් වශයෙන් අපට වැදගත් වන්නේ අපේ ගොවිතැන් කර ගෙන යාමට නිදහස සහ පහසුව ලැබෙනවා නම් පමණ යි. පෙර රජය විධිමත් විදිහට පොහොර සහනාධාරය ප්‍රමාදයකින් තොරව ලබා දුන්නා. එහෙත් දැන් ඒ වැඩපිළිවෙළ සිදු වන්නේ කිසි ම පිළිවෙළක් නැතිව. පොහොර සහනාධාරය වෙනුවට මුදල් ලබා දීම සිදු කළත් ඒ මුදල ප්‍රමාණවත් නැහැ. එසේ ම ඒ මුදල ගැනීමට පවා දැඩි අසීරුවකට පත් වීමට සිදු වෙලා. ගොවිතැනට යොදවන කාලය සහනාධාරය ලබා ගැනීමට යොමු කිරීමට සිදු වීම නිසා අපි ප්‍රශ්න ගොඩකට මැදි වෙලා. අනෙක් කාරණය නම් එතරම් අසීරුතා මැද සියලු වැඩ කටයුතු කළත් රජයෙන් පොහොර සහනාධාරය ලැබෙන කාලය වන විට අපේ වගාවන්ට පොහොර යෙදිය යුතු කාලය ද පසු වෙලා. මේ පිළිබඳ රජයේ අවධානය යොමු විය යුතු යි.

ජාතීන් විදිහට සහජීවනය ගැන කිසි ගැටලුවක් නැති වුණත් වර්තමානයේ පවතින දේශපාලන තත්ත්වය සහ ඒකාබද්ධ විපක්ෂය වැනි කණ්ඩායම්වල විවිධ හැසිරීම් නිසා ජනාධිපතිවරයාට නිදහසේ තීන්දු තීරණ ගෙන රට ඉදිරියට ගෙන යාම අපහසු වී තිබෙනවා.

**නිදහසේ** අපේ රැකියාව කරගෙන සතුටින් ජීවත් වීමට පුළුවන් තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. දරුවන් පවා නිවසින් පිට ව ගියත් අතීතයේ වගේ ඔවුන් නිවසට පැමිණෙන තුරු බියෙන් ජීවත් වූ කාලය නිමා වෙලා. මේ තත්ත්වය දරුවන්ගේ අධ්‍යාපනයටත් යහපත්.

ධීවරයෙක් විදියට අද මගේ වෘත්තිය නිදහසේ කර ගන්න පුළුවන් වුණත් දැල් ආම්පන්න භාවිතයේදී යම් යම් නීති සීමා පනවා තිබීම අප වැනි සුළු පරිමාණ ධීවරයන්ට ගැටලුවක්. විශේෂයෙන් දැල් භාවිතයේදී තිබෙන ගැටලු යි මීට ප්‍රධාන වන්නේ. සමාජයේදී වගේ ම අපේ රැකියාව කිරීමේදීත් සිංහල, දෙමළ, මුස්ලිම් අප හැම දෙනා ම සහයෝගයෙන් සතුටින් රැකියාව කරනවා. අපේ බලාපොරොත්තුව නම් ඉදිරියටත් මේ නිදහස මේ විදිහට ම භුක්ති විඳින්නට ලැබෙයි කියලයි.

පසුගිය ආණ්ඩුවත්, වර්තමාන ආණ්ඩුවත් අතර විශේෂ වෙනසක් මම දකින්නේ නැහැ. දෙගොල්ලොම එක ම විදිහටයි වැඩ කරන්නේ.



# කඳුකරයේ නිදහස

**නුවරඑළියේ ජනතාව අපට අමතක කළ නොහැකි ජන කොටසක්. විදේශ විනිමය උපයා දෙන තේ වතු කර්මාන්තයට හිමිකම් කියනු ලබන එම දිස්ත්‍රික්කයේ සාමාන්‍ය ජනතාවට නිදහස දැනෙන්නේ කොහොමද? මේ පිළිබඳ ක්ෂේත්‍ර චාරිකාවක යෙදුණේ සුබ්‍රමනියම් ත්‍යාගු (අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමාගේ මාධ්‍ය ලේකම්)**



## ශිව ශ්‍රී ආර්. එන්. කේ. තිලගේෂ්වර ෂර්මා

ප්‍රධාන කුරුක්කල්තුමා
නුවරඑළිය, හාවාඑළිය, ශ්‍රී මුත්තුමාරි අම්මාන් කෝවිල

**යුද්ධය** අවසන් වෙලා ජනතාව බයක් නැතුව සතුටින් නිදහසේ ජීවත් වෙනවා. විශේෂයෙන් ම පසුගිය දෙවසර තුළ දෙමළ හින්දු ජනතාවට ගොඩක් බලාපොරොත්තු ඇති වුණා. විශේෂයෙන් හින්දු ආගමික කටයුතු සම්බන්ධ ව වෙනම ඇමතිවරයෙක් පත් කර තිබෙනවා. එහෙම පත් කළේ සෑහෙන කාලයකට පස්සෙයි. උතුරු නැගෙනහිර පළාත්වල යුද්ධයෙන් විනාශ වුණු කෝවිල් නැවත හදාගෙන එනවා. නුවරඑළියේ කෝවිල්වලටත් උදව් කිරීමට වෙනම ඇමතිවරයෙක් සිටින නිසා ඊට ද අවස්ථාවක් ලැබී තිබෙනවා. ආගමික නිදහස පැත්තෙන් සැලකුවම එය ඉතා වැදගත්.

ලෝකයේ රටවල් දියුණු වී තිබෙන්නේ ජාති, ආගම් ආදී භේද පැත්තකට දාලයි. එවැනි භේද නැතුව එකතු වෙලා වැඩ කළොත් රටක් ලෙස දියුණු වෙන්න පුළුවන්. රට බෙදන එක අප කිසි ම දවසක අනුමත කරන්නේ නැහැ. එහෙත් පුරවැසියන් ලෙස සමානත්වයක් තිබිය යුතු යි. වත්මන් ආණ්ඩුව එය කරන්න උත්සාහ කරන බව පේනවා. එහෙත් ඇතැම් අයගෙන් පොඩි පොඩි බාධා තිබෙනවා. ඒවා මැඩගෙන කටයුතු කළොත් නියමාකාර නිදහසක් හැම පුරවැසියකුට ම හිමි වේවි.



## ඒ. ජෙගනාදන්

කඳුරට ජනතා පෙරමුණේ සංවිධායකවරයෙක් හා වෘත්තීය සමිති සාමාජිකයෙක්.

**තේ** දළු නෙළන අයගෙන් නිදහස් දිනය කවදා දැයි තවම දන්නේ නැති අයත් ඉන්නවා. වතු ක්ෂේත්‍රයට නිදහස් දිනය මුල්කරගෙන විශේෂ වැඩසටහනක් අවශ්‍යයයි. දෙමළ ජනතාවගේ ප්‍රශ්නය දැන් බලයේ සිටින නායකයන්ට විසඳගන්න බැරිනම් තව අවුරුදු 100කින් වත් විසඳගන්න බැහැ. තවමත් රාජ්‍ය ආයතනවල දෙමළෙන් සන්නිවේදනය සිදු කරන්නේ නැහැ. උත්තර එන්නේ ඉංග්‍රීසියෙන් නැත්නම් සිංහලෙන්. මේ නිසා EPF, ETF ගන්න ගියා ම සෑහෙන්න කරදර විඳිනවා. ඉතින්, මේක ද නිදහස?





## ජී. ජයසීලන්

ත්‍රිරෝද රථ රියැදුරෙක්.

**යටත්** විජිතයෙන් නිදහස ලබපු ලෝකයේ රටවල් දියුණු වී තමන්ගේ ම නිෂ්පාදන ලෝකයට දෙනවා. එහෙත් පිටරටින් ගේන ත්‍රිරෝද රථවලට වුවමනා එක ඇණයක්වත් අපේ රටේ හදන්නේ නැහැ. පිටරටින් ගේනකොට බදු වදිනවා. එතකොට වියදම වැඩි යි. ඇයි අපට ඒවා නිෂ්පාදනය කරන්න බැරි?

රටේ මිනිසුන් ශ්‍රී ලාංකිකයන් ලෙස ජීවත් වෙනවා. එහෙත් රට පාලනය කරන අය අප ව වෙන්කරලා සෙල්ලම් කරනවා. මේ සෙල්ලමේදී හැමදාම ඒ දේශපාලනඥයන් දිනනවා. අප හැමදාම පරදිනවා. මේ තත්ත්වය නතර කරලා අපි ඔක්කොම මිනිසුන් කියලා හිතුවොත් මේ රට දියුණු කරන්න පුළුවන්. නිදහස ලබාගත්තට ජනතාවට නිදහස භුක්ති විඳින්න දේශපාලනඥයන් ඉඩ දෙන්නේ නැහැ. ඒ නිසා නිදහස කියන්නේ මොකක්ද කියලා දේශපාලනඥයන්ට තේරුම් කරලා දෙන්න ඕන.

## සින්නයියා බාලක්‍රිෂ්ණන්

එළවළු ගොවි මහතෙක්.

**නිදහසෙන්** පස්සෙත් සිංහල, මුස්ලිම්, දෙමළ ජනතාව එකට ජීවත් වුණා. පස්සේ අපව බෙදන්න පටන් ගත්තේ දේශපාලනය යි. පක්ෂ දේශපාලනය තිබෙනකම් සියලු ජාතීන්ට එකට ජීවත් වෙන්නට අමාරුයි කියලයි මම හිතන්නේ. ජාතීන් එකිනෙකාට විරුද්ධ ව වැඩ කිරීම නතර වුණොත් සියලු ම ජනතාවට එකට එකතු වී රට දියුණු කරන්න පුළුවන්.

එමෙන් ම අපට එදිනෙදා ජීවිතය පහසුවෙන් ගෙවන්න බැරි ආර්ථිකයකුයි තිබෙන්නේ. අනෙක, අපේ ප්‍රශ්නවලට විසඳුම් දෙන්න, සාකච්ඡා කරන්න, දෙමළ භාෂාව කතා කරන නිලධාරීන් ඉතා ම අඩු යි. සමහර විට ඇත්තේ ම නැහැ. නිදහස ලබලා අවු:70ක් වුණත් අපේ යාන්ත්‍රණයේ ප්‍රශ්නයක් තිබෙනවා වගේ. ඒවා මොනවා ද කියලා මට තේරෙන්නේ නැහැ.


**යටත් විජිතයෙන් නිදහස ලබපු ලෝකයේ රටවල් දියුණු වී තමන්ගේ ම නිෂ්පාදන ලෝකයට දෙනවා. එහෙත් පිටරටින් ගේන ත්‍රිරෝද රථවලට වුවමනා එක ඇණයක්වත් අපේ රටේ හදන්නේ නැහැ. පිටරටින් ගේනකොට බදු වදිනවා. එතකොට වියදම වැඩි යි. ඇයි අපට ඒවා නිෂ්පාදනය කරන්න බැරි?**



## පී. කනගනායගී

තේ දළු නෙළන්නියක්.

**සුද්දගේ** කාලයේ අපට තිබුණු දේවත් දැන් නැහැ. වතුවල පඩිනඩි, ශීත ඇඳුම්, ගෙවල් ආදිය ලැබුණට වතු පෞද්ගලික අංශයට බාරගත්තට පස්සේ දැන් ඒවා ලැබෙන්නේ නැහැ. අප තාම එතැනම යි. දේශපාලනඥයන් අපේ ඡන්දේ විතරයි ගන්නේ. අපේ පඩිනඩි ගැන බලන්නේ නැහැ. මාසික ආදායම මදි. පඩි වැඩි කරගන්න උද්ඝෝෂණ කරන්න වෙලා තිබෙනවා. දවසින් දවස රස්සාව ගැන තිබෙන සහතිකය නැති වෙනවා. තවමත් උප්පැන්න සහතිකය ලියන්නේ ඉන්දියානු දෙමළ කියල යි. ඒත් අපි ලංකාවේ දෙමළ. අවු: 200ක් වෙනවා අප ඇවිල්ලා. අපි අතීතයේ ඉන්දියාවෙන් ආවා කියලා කියන එක පිළිගන්නවා. ඒත් තව ම ගහන්නේ පරණ බෙරයම යි.





### සුබ්‍රමනියම් ගජේන්ද්‍රන්

කඳපොළ එළවළු ගොවි මහතෙක්.

**නිදහස** ලැබිලා අවු:70ක් පුරා සැමරුවත් නිදහස් දිනයේදී කතාකරන එක තීරණයක්වත් ක්‍රියාත්මක වී තිබෙනවා ද? නිදහස ගැන පාලකයන්ට මතක් වෙන්නෙත් නිදහස් දිනයට විතරයි. කොහේ හරි දේශපාලනඥයෙක් ලොකු කතාවක් කරලා ජාතික කොඩිය ඔසවලා අප සියලු දෙනා එකට වැඩ කරන්න ඕන කියල යනවා. 1948 නිදහස ලබපු දවසේ ඉඳල ම වෙන්නේ මේකයි. ඒ කියන දේවල් ක්‍රියාත්මක වෙන්නේ නැත්නම් නිදහස සැමරීමෙන් වැඩක් නැහැ. මේ අවුරුද්දේ ගන්න තීරණ ලබන අවුරුද්දේ නිදහස් දිනය වෙනකොට කොයිතරම් ඉටු වෙලා තිබෙනව ද? කියන එක ආපසු හැරී බලන්න ඕන.



### ආප්පුනාදන් සුබ්‍රමනියම්

එළවළු ගොවි මහතෙක්.

**මීට** අවු:40කට 50කට පෙර රටේ නිදහස ගැන පාසල් ගිය අපට හැඟීමක්, උනන්දුවක් තිබුණා. ඒත් අද දරුවන් ඉන්නේ ෆෝන් එකේ, පරිගණකයේ. නිදහසට කියලා අර්ථවත් දෙයක් කරන්න පුළුවන් නම් අඩුතරමින් දරුවන්ට පොතක් පතක්වත් දෙන්න පුළුවන් නම් නිදහස ගැන අර්ථවත් හැඟීමක් ලැබෙනවා. ඒත් එහෙම වැඩපිළිවෙළක් රටේ නැහැ.

**නිදහස ලැබිලා අවුː70ක් පුරා සැමරුවත් නිදහස් දිනයේදී කතාකරන එක තීරණයක්වත් ක්‍රියාත්මක වී තිබෙනවා ද? නිදහස ගැන පාලකයන්ට මතක් වෙන්නෙත් නිදහස් දිනයට විතරයි. කොහේ හරි දේශපාලනඥයෙක් ලොකු කතාවක් කරලා ජාතික කොඩිය ඔසවලා අප සියලු දෙනා එකට වැඩ කරන්න ඕන කියල යනවා.**



### රාජරත්නම් කෝනේෂ්වරම්

කෘෂි ද්‍රව්‍ය විකුණන ව්‍යාපාරිකයෙක්.

**නිදහස** ගැන අවුරුදු ගණනාවක් පුරා ලියනවා, කියනවා. වෙච්ච දෙයක් නෑ. මාධ්‍යයෙන් එදා දවස පුරවගන්න කාගෙ හරි මොනවහරි දානවා. සමහර මාධ්‍ය එදාට දැන්වීම්වලින් පුරවගන්න බලනවා. ලබන අවුරුද්දෙත් මේ වගේ දෙයක් මාධ්‍යයෙන් කරලා අවසන් කරනවා. අපට වුණ සෙතක්, වැඩක් නැහැ. දරුවන්ගේ මනසට වදින්න පුළුවන් වැඩපිළිවෙළක් පාසල් තුළ නැහැ. ජාත්‍යන්තර පාසල්වල කිසි ම ජාති ආගම් භේදයක් නැතුව දරුවන් වැඩ කරනවා. ඒත් අනෙක් පාසල්වල එකට එකතු වෙලා වැඩ කරන්න දරුවන්ට හැඟීමක් දෙන්නෙ නැහැ. මේවා අපි කිව්වට කවුද ගණන් ගන්නෙ?



# යටගියාවක හැබෑ වගතුග

## එදා මෙදා නිදහසේ ගමන් මඟ



"ස්වස්ති ශ්‍රී සෞභාග්‍ය සුපූරිත, පුණ්‍ය භූමි ලංකා, ධර්මද්වීපනී ලංකාධරණී" යනුවෙන් ගුවන් විදුලියේ ගීත ගැයෙන විට අපි ඊට ආශාවෙන් සවන් දුනිමු. ධර්මද්වීපය, රත්නද්වීපය, පෙරදිග ධාන්‍යාගාරය, පෙරදිග මුතු ඇටය වැනි විරුදාවලීලත් ඉන්දියාව පාමුල ඉන්දු සයුරේ පිහිටි දිවයිනක වැසියන් වන අප ඉතිහාසය පුරා අනවරත ස්වාභාවික ප්‍රපංචයන්ට, ආක්‍රමණ මෙන් ම සංක්‍රමණයන්ගෙන් ද සමුපේත ව විවිධාකාර, සමාජ සංස්කෘතික, දේශපාලනික මෙන් ම ආර්ථික ගැටලු හා අභියෝගවලට මුහුණ දෙමින් අත්‍යන්ත ජීවන අරගලයක යෙදෙමින් පසුවන බැව් අමුතුවෙන් කිව යුතු නොවේ. එහෙත් අපේ සාහිත්‍යකරුවෝ උත්ප්‍රාසයෙන් හෝ සැබෑ දේශවාත්සල්‍යයෙන් හෝ ලෝකෙන් උතුම් රට තම රට යනුවෙන් උදම් ඇනූහ. කවි ලියූහ. ගී පබැඳූහ. රටේ ප්‍රගතියට අත්වැල් ඇල්ලූහ. ගද්‍ය රචනා කළහ. එහෙත් ඉදානීන්තනයෙහි (වර්තමානයේ) අප විසින් මුහුණ පාමින් සිටිනු ලබන සමාජ යථාර්ථය අභිමුඛයේ මේ රට ශීඝ්‍ර සංවර්ධනයක් කරා මෙහෙයැවීමට ඉමහත් ප්‍රයත්නයක් දැරිය යුතු ව ඇත. මුළු ලෝකයේ කවර රටක් අභියස වුව ඇති සකල විධ ප්‍රශ්න කන්දරාවක් අප දේශයේ ද පවතින බැවින් එය විසඳිය යුතුව ඇත. පාරිසරික, දේශගුණික, කාලගුණික ගැටලුවල සිට පුද්ගල, සමූහ, සමාජීය, සංස්කෘතික ක්ෂේත්‍ර අරබයා ඒ ප්‍රශ්න විහිදී තිබේ. ඒ අනුව එම ප්‍රශ්න ගැටලු විසඳීමේ මූල සාධක අධ්‍යාපන, ආර්ථික, දේශපාලන මෙන් ම ජනමාධ්‍ය සහ නව මාධ්‍ය කරා ද විහිදී තිබේ. ප්‍රබල සිවිල් සමාජයක්, ප්‍රබල ප්‍රජා සංස්කෘතියක් ගොඩනගාගෙන ශ්‍රී ලංකා ජන සමාජය ප්‍රගතිය කරා මෙහෙයැවීමට අවශ්‍ය බව ප්‍රබුද්ධ ජන මනසේ අදහස යි; ආකල්පය යි.

විවිධ ශික්ෂණ මඟින් පෝෂණය වූ මානව විද්‍යාව ඉගෙනගෙන තිබුණා නම් මානවයා පිළිබඳ අගතිගාමී නොවූ චින්තනයක් මේ රටේ බිහිකරන්නට ඉඩ තිබුණි. අන්‍ය සංස්කෘති හෙළා තලා දැමීම, අවතක්සේරුවට ලක්කිරීම, අන්‍ය සංස්කෘති හෝ සංස්කෘතික විශේෂතා ප්‍රතික්ෂේප කිරීම හා තම සංස්කෘතික රාමුව අනවශ්‍ය තරමින්, යථාර්ථවත් නොවන ස්වරූපයෙන් ආරක්ෂා කරන්නට පෙළඹීම ප්‍රථම සදාචාරවාදය හෙවත් ස්වයං සංස්කෘතිවාදයේ ලක්ෂණය යි. මානව කේන්ද්‍රණවාදී ලක්ෂණය යි. නූතන ලෝකයේ සංස්කෘතික සාපේක්ෂතාවාදය අගය කරනුයේ කිමදැයි සෙවීම වටී.

**1505න් ඇරඹුණු පෘතුගීසි සමය යටපත් කොට ලන්දේසීන් ලංකාවේ පාලනය අතට ගැනීමේ සිට විවිධ විලෝපනයන්ගෙන් බැටකමින් සිටි කීර්ති ශ්‍රී රාජසිංහ (1747 – 1782), රාජාධි රාජසිංහ (1782 - 1798) සහ ශ්‍රී වික්‍රම රාජසිංහ (1798 – 1815) යන නායක්කර් වංශික රජවරු අසරණ වූහ. එනිසා ලන්දේසීන් මෙරටින් පන්නා දැමීමට විදේශික ජාතියකගේ පිහිටාධාර විමසමින් සිටි අඳුරු යුගයකි ඒ.**

සංස්කෘතික සාපේක්ෂතාවාදය (Cultural Relativism) වූ කලී වෙනත් සංස්කෘති හා සසඳා බලා ස්වකීය සංස්කෘතියට උරුම වන තත්ත්වය සාපේක්ෂ ව අවබෝධ කර ගැනීමේ මං පෙත් හෙළි පෙහෙළි කර ගැනීම යි. සංස්කෘතීන් පහත් නොකොට ඒ ඒ සංස්කෘතියට ආවේණික ලක්ෂණ ඒ සංස්කෘතික පරිසරය හා පසුබිම ඇසුරින් මතු වූ ඒවා හැටියට වටහා ගැනීමේ හැකියාව යි. අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම, අන්‍ය සංස්කෘති පිළිගැනීම, අවස්ථාව හා පරිසරය අනුව අනෙක් සංස්කෘතීන්ට හැඩ ගැසෙන්නට පුළුවන් වීම හා වෙනස් සංස්කෘති දෙකක අනුකූලනය හා අවස්ථා සංස්කෘතික සාපේක්ෂතාවාදයේ ලක්ෂණ ලෙස මහාචාර්ය දිලීප් චන්ද්‍රලාල් උද්ධරණය කරයි. සංස්කෘතිය වූ කලී වෙනස් වනු ලබන්නකි. පරම නිර්මල ගති සොබා එහි නැත. අප රටේ මුහුණ දෙමින් පවතින උභතෝකෝටිකයන්ගෙන් අවිශ්වාසය, සැකය, චමත්කාරය, මෝහය උඩ ගොඩ නැංවුණු තිමිර පටලය ඉරා දැමීම මගින් සංවර්ධන මාර්ගයට අවතීර්ණ වීමට අත්‍යවශ්‍ය සාධක තේරුම් ගත යුතු ය. ඊට එරෙහි ව ඇති බාධක හා අභියෝග දිනාගත යුතු යි. මිථ්‍යාව සුන් කළ යුතු යි. ප්‍රජා සමාජයක් යනු කුමක් ද ? එය කුමක් ද ? එය කුමකට ද යන ප්‍රශ්නය මෙහිදී වහා හැඟී යනු ඇත.

ප්‍රජා සමාජය වූ කලී සහලේ සහබිම් හා සහහැඟීම් යන තුන් අංශයේ ලේ සම්බන්ධකම්, භූමිය, ප්‍රදේශය අතින් ඇති සම්බන්ධකම් මෙන් ම හැඟීම් වශයෙන් ඇති සම්බන්ධකම් පාදක කොටගත් පොදු ජීවන රටාවකට නෑකම් කියන අන්‍යෝන්‍ය උපකාරය හා අන්‍යෝන්‍ය ශික්ෂණයෙන් බැඳුණු මිනිස් කණ්ඩායමකි. ජපානයේ එබඳු ජන සමාජයක් පවතී.

ඒ ඒ ප්‍රජා සමාජයේ සාමාජිකයන් තම තමන්ගේ යුතුකම් හා කාර්යභාරය තේරුම් බේරුම් කොට ගෙන ක්‍රියා කිරීම ප්‍රජා සමාජයේ පැවැත්මට ඉතා අවශ්‍ය දෙයකි. මේ අතින් බලන විට පුරවැසියන් හා පරිපාලකයන් (රජයේ සේවකයන් හෝ නිලධාරීන්) යන බෙදීම තරමක් ප්‍රශ්නාර්ථයෙන් යුක්ත ය. ප්‍රජා සමාජයේ යහපැවැත්ම හා යහපාලනය සඳහා දෙපක්ෂය පුරවැසියන් හා පරිපාලකයන් එකමුතු වී තම වගකීම් බෙදා හදාගෙන වැඩ කිරීම අත්‍යවශ්‍ය වුවක් බව දිලීප් චන්ද්‍රලාල් උපකුලපතිවරයා 'රට කිරි සහ ගමේ කැකිරි හා ජනසමාජ අවලෝකනය තුළින් ලංකාව නිර්මාණය කරමු' යන කෘතියෙහි මැනවින් පෙන්වා දෙයි.

## ඉතිහාසයෙන් බිඳක්

සැඩ සුළඟකට ගොදුරු වීමෙන් පළමු වැනි පෘතුගීසි කණ්ඩායම ලක්දිවට ගොඩබැස්ස අතර මේ රටේ පැවති ආර්ථික සම්පත් කරණකොට ඔවුහු මෙහි නතර වූහ. ඉක්බිතිව මේ රටේ මුහුදුකරය අල්ලාගත් ලන්දේසීන්ට ද ප්‍රධාන වශයෙන් බලපෑවේ රටේ ආර්ථික වටිනාකම ය. කුළුබඩු ඇතුළු වෙනත් වාණිජ ද්‍රව්‍ය එකතු කොට ලාභ ගැනීම ඔවුන්ගේ පරමාර්ථය වූයේ ය. ඉංග්‍රීසීන් මේ රටේ මුහුදුබඩ පළාත් අල්ලා ගැනීමෙහිලා ආර්ථික කරුණු බලපෑවේ ය. එහෙත් ඔවුන්ට මූලික වශයෙන් ලංකාවේ ස්වාභාවික පිහිටීම වැදගත් විය. ඉන්දු සයුරේ යථායෝග්‍ය ස්ථානයක හොඳ වරායවල පිහිටීම බටහිර දිගුවන්ගේ ඇස මෙරටට යොමු වීමට හේතු බැව් දෙස් විදෙස් උගතුන්ගේ මතය යි. ආචාර්ය කේ. ඩී. ජී. විමලරත්න 'ලංකාවේ බ්‍රිතාන්‍ය ආධිපත්‍යය 1796 – 1948' කෘතියේ කුළු ගන්වන විද්වත් මතය හැදෑරීම වැදගත් ය.

පෘතුගීසි බලය දහඅට වැනි සියවසේදී ආසියාවෙන් බැහැර වන්නට විය. ලන්දේසි යටත් විජිත නැගෙනහිර ඉන්දීය දූපත්වල පිහිටා සිටි නිසා තත් කාලය වන විට ලංකාවේ ස්වාභාවික පිහිටීම ඔවුන්ට එපමණ වැදගත් වූයේ නැත. එහෙත් ඉංග්‍රීසීන් කල්පනා කළේ ඊට වෙනස් ආකාරයකිනි. ඉන්දියානු සාගරය අවට ආසියාතික අධිරාජ්‍යයක් ගොඩනගන්නට කැස කවමින් සිටි ඉංග්‍රීසීන්ට ස්වකීය පෙරදිග යටත් විජිත ආරක්ෂා කර ගැනීමට ලංකාවේ පාරිසරික සාධක බෙහෙවින් වැදගත් බව ඒත්තු ගොස් තිබිණ.

1505න් ඇරඹුණු පෘතුගීසි සමය යටපත් කොට ලන්දේසීන් ලංකාවේ පාලනය අතට ගැනීමේ සිට විවිධ විලෝපනයන්ගෙන් බැටකමින් සිටි කීර්ති ශ්‍රී රාජසිංහ (1747 – 1782), රාජාධි රාජසිංහ (1782-1798) සහ ශ්‍රී වික්‍රම රාජසිංහ (1798 – 1815) යන නායක්කර් වංශික රජවරුන් අසරණ වූ හ. එනිසා ලන්දේසීන් මෙරටින් පන්නා දැමීමට විදේශික ජාතියකගේ පිහිටාධාර විමසමින් සිටි අඳුරු යුගයකි ඒ. එම යුගයේ පසුබා සිටි සිරිලක රජවරු ඇතුළු නායකයෝ දැන හෝ නොදැන හෝ මර උගුලක වැටුණාහ.

1795 ජූලි මස සිට 1796 පෙබරවාරි මස 15 වැනි දින දක්වා කොළඹ ලන්දේසි කොටුව බ්‍රිතාන්‍ය ග්‍රහණයට යටත් වන්නට මාස 6ක කාලයක් ගත විය. ලංකාවේ පිහිටීමේ වැදගත්කම හා ත්‍රිකුණාමලය වරාය අත්පත් කර ගැනීමේ අවශ්‍යතාව බ්‍රිතාන්‍ය අගමැති විලියම් පිට් එංගලන්ත පාර්ලිමේන්තුවේදී කතා කළේ ය. ශ්‍රී ලංකාව ලෝක ගෝලයේ ඔවුන්ට අයත් ව ඇති බෙහෙවින් වටිනා විජිතය බව ද මේ රටේ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාර ධුරය දැරූ තෝමස් මේට්ලන්ඩ් (1805.07.19 – 1812.03.10) එක් අවස්ථාවක පවසා ඇති කරුණක් මෙසේය. "ත්‍රිකුණාමලය වනාහි ඉන්දියාවේ නාවික ආධිපත්‍ය රඳවා තබා ගැනීම සඳහා අයත් කර ගෙන තිබිය යුතු එක ම නියම යතුර" බව ය. දුර්වල තත්ත්වයක සිටි ඕලන්ද ජාතිය වෙනුවට ඉතා බල සම්පන්න විදේශ ජාතියක් ලංකැර ගැනීම එකල උඩරට රාජධානිය ගත් බරපතළ තීරණයකි. මේ ජාතිය වසර 10ක් ඇතුළත, වසර දෙදහස් පන්සියයකට වැඩි කාලයක් නිදහස භුක්ති විඳි රාජ්‍යයක් සම්පූර්ණයෙන් නතු කර ගනිතිය යන අංශු මාත්‍රයක අදහසක් උඩරට පාලකයන් තුළ 1796 පෙබරවාරි මස 15 දින ඇති වූයේ දැයි යන්න කාට කිව හැකි යැයි කේ. ඩී. ජී. විමලරත්න සඳහන් කරයි.

බ්‍රිතාන්‍ය පෙරදිග ඉන්දීය වෙළෙඳ සමාගම හෙවත් ජෝන් සමාගම අතට ලංකාවේ මුහුදුබඩ පෙදෙස් ගොදුරු කොටගත් කල්හි එම සමාගම විසින් මෙහි පිහිටුවාලූයේ යුද

පාලන ක්‍රමයකි. එම කාලයේ අයබදු අය කර ගැනීම එහි පැවති රුදුරු ආධානග්‍රාහී ස්වරූපයට එරෙහි ව සිංහල පෙදෙස් වන කොළඹ දිසාවනියේ හේවාගම් හා සල්පිටි කෝරලවල 1797 දී සිඤ්ඤෝ අප්පු නමැත්තකුගේ නායකත්වයෙන් කැරැල්ලක් ඇති විය. බ්‍රිතාන්‍ය රජය ඕලන්දයන් විසින් මුස්ලිම් ජනයාට එරෙහි ව පනවා තිබූ බාධක ඉවත් කළත් 1797 කැරැල්ලට මුහුදුබඩ පළාත්හි සියලු ජනකොටස් විරුද්ධ ව නැඟී සිටියහ. ඒ, ජෝන් සමාගමේ අයබදුවල පැවති බදු බරෙහි ස්වරූපයට වඩා එම බදු එකතු කළ හිජු දෘඪග්‍රාහී ස්වභාවය නිසා යයි ආචාර්ය විමලරත්න පවසයි. එම කැරැල්ලේ දෝංකාරය යාපනය, මඩකලපුව හා වන්නි පෙදෙස්වලට ඇතිණි. 1798 ඔක්තෝබර් මස ලංකාවට පැමිණි මෙරට ප්‍රථම බ්‍රිතාන්‍ය ආණ්ඩුකාර ෆෙඩ්රික් නෝර්ත්ගේ සමය ලාංකික සමාජයේ බොහෝ වෙනස්කම් සිදු වූ කාලයකි. 1800 මාර්තු මස 25 වැනි දින ඒමියන්ස් සාම ගිවිසුම අනුව නියත වශයෙන් ම ලංකාවේ ලන්දේසි පළාත් බ්‍රිතාන්‍යයන් යටතට පත් කැරිණි. 1802 – 1833 දක්වා මේ රටේ පැවැති ඒකාධිපති පාලන ක්‍රමය කෝල්බෲක් පාලන ප්‍රතිසංස්කරණ මඟින් වෙනස් වන්නට විය. 1802 ජූලි මාසයෙන් පසු ව නෝර්ත් ආණ්ඩුකාරයා විසින් උඩරට රාජධානියට විරුද්ධ ව යුද්ධ කිරීමට අවස්ථාව උදා කැර ගත්තේ විවිධ බලවේග මැඩ පවත්වා සියල්ල තම හස්ත ග්‍රහණයට නතු කර ගැනීම සඳහා ය. 1803 ජනවාරි 31 මැක්ඩොවල් උඩරට ආක්‍රමණය කරන්නට පිටත් ව ගියේ බල ඇණියක් සමඟ ය. 1803 උඩරට ආක්‍රමණය අසාර්ථක වූයේ ඔවුන්ගේ අවිධිමත්භාවය කරණකොට ය.

බ්‍රිතාන්‍යයෝ කොළඹට පසු බැස්සාහ. ශ්‍රී වික්‍රම රාජසිංහ රජ තම යුද සේනාධිපති ලෙව්කේ රාළ සහ පිළිමතලව ප්‍රධාන සේනාංක සංවිධානය කර තමන් ම යුද පිටියට ගියේ ය. හංවැල්ල වන තෙක් බ්‍රිතාන්‍ය හමුදා පල වා පැමිණි උඩරට හමුදාව 1803 සැප්තැම්බර් මස 15 වැනි දින හංවැල්ලේ ඉංග්‍රීසි බල කොටුවට පහරදී ඉංග්‍රීසි සේනාංක පරාජය කිරීමට වෑයම් කළහ. මැලේ හමුදා භටයන් ඉංග්‍රීසි සේනාංකයට එක් වීමත්, ලෙව්කේ රාළගේ සහ පිළිමතලවගේ අසාපසුවීම් හා ප්‍රමාද දෝෂත් හේතු කොට ගෙන සියල්ල විනාශ වූයේ ය. සිය යුද සේනාපතිවරයා පලා යන්නේ යයි වරදවා තේරුම් ගත් රාජසිංහ, ලෙව්කේ රාළගේ සහ පිළිමතලව මොහොට්ටාලගේ හිස ගසා දැමීමට අණ කර ඇත. බ්‍රිතාන්‍ය බලඇණියට මඟ පෙන් වූ දොන් ඒඩ්‍රියන් විජේසිංහ ජයවර්ධන නමැත්තා මේ අවස්ථාවේ උඩරට සේනාංක සමඟ සාකච්ඡා කර සාමදානයක් ඇති කිරීමට උත්සාහ කළේ ය. මේ යුද්ධයේදී උඩරට රජුගේ යුද කොඩිය සහ රාජ්‍ය ලේකම්ගේ ධජය යුද පිටියේදී අත්හැර දමා ගොස් තිබියදී 51 වැනි ඉංග්‍රීසි රෙජිමේන්තුවේ කපිතාන් පොලොක්ගේ හමුදාව අතට පත්විය. මේ කොඩි තුන ම ඉංග්‍රීසි ආණ්ඩුකාරයා විසින් වයිට් හෝල් දේවස්ථානයේ තැන්පත් කිරීමට යවා ඇති අතර පසු ව මේ ධජ වෙල්සි යුද රෝහලේ තැන්පත් කොට තිබිණි. 1948 දී නව ජාතික කොඩිය සැකසීමේදී ආදර්ශයට ගත්තේ එම කොඩිය යි. එම අවස්ථාවේ ධජය නිර්මාණය කර ගැනීමට සියලු ජාතීන්ගේ නියෝජනයකින් සමන්විත මණ්ඩලයක් සැකසුණි.




නිදහස ලබාගැනීමේ වෑයම:
මහාමාන්‍ය ඩී. එස්. සේනානායක මහතා (දකුණු කෙළවර) ඇතුළු පිරිස

ස්වදේශික පාලන තන්ත්‍රයේ සාමූහිකත්වය බිඳී ගොස් සිදු වූ පාවාදීම්, ඝාතන, ලේ වැගිරීම්, කුමන්ත්‍රණ කෙළ වරක් නොවී ය. මේ සියලු අභ්‍යන්තරික සංසිද්ධි ඉංග්‍රීසින්ගේ වාසියට හේතු විණි. ඔවුහු 1815 පෙබරවාරි මස 18 වැනි දින ශ්‍රී වික්‍රම රාජසිංහ රජ හා ඔහුගේ බිසෝවරුන් දෙදෙනා අල්ලා ගත්හ. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අල්ලා ගැනීමෙන් පසු ව උඩරට ප්‍රදේශ පාලනය කිරීම පිණිස පිළිවෙළක් ඇති කර ගත යුතු ව තිබුණි. මේ කටයුත්ත බාර වූයේ ජෝන් ඩොයිලිට ය. මහු උඩරට ගිවිසුමේ වගන්ති කෙටුම්පත් කළ බැව් සිය දිනපොතේ දක්වා ඇත. උඩරට සම්මුතිය 1815 මර්තු මස දෙවැනි දින පස්වරු සතරේ හෝරාවට ඓතිහාසික රාජමාළිගා මඟුල් මඩුවේදී පැවැත්විය. උඩරට සම්මුතිය පැවැති අවස්ථාවේදී පොදු ජනයා ඒ පිළිබඳ කිසිවක් වටහා ගත නොහැකිව උනන්දු හීන ලෙස සිටි බව වෛද්‍ය හෙන්රි මාෂ ල් සඳහන් කරයි. උඩරට ගිවිසුමේ වගන්ති 12කි. ගිවිසුම අත්සන් කරන්නට පෙර ඉංග්‍රීසි කොඩිය එසවීමට විරුද්ධ ව වාරියපොළ සුමංගල හිමියන් කළ ක්‍රියාදාමය වීරත්වයෙන් ඉතිහාසයට එකතු වී ඇත. උඩරට ගිවිසුම අත්සන් කළ දිනය ගැන මතිමතාන්තර තිබේ. උඩරට ගිවිසුමේ වගන්ති පසු ව බ්‍රිතාන්‍යයන් විසින් ඒ ආකාරයෙන් ම ක්‍රියාවට නංවා නැත. ස්වදේශිකයා මං මුළා විය. බ්‍රිතාන්‍ය රජය බුද්ධාගම සමඟ පැවැති සම්බන්ධතා අත්හැර දැමීමෙන් උඩරට ගිවිසුමේ පස්වැනි හා වැදගත් ම වගන්තියට පයින් ගැසී ය. උඩරට ගිවිසුමෙන් අපේක්ෂිත වාසිය සිරිලකට නොලැබුණු අතර රට විලෝපනයට ලක් වූයේ ය. පාලක පාලිත දෙපක්ෂය අතර පරතරය වැඩි වූ අතර සිතුම් පැතුම්, අදහස් උදහස්, ගතිසොබා, සිරිත් විරිත්, භාෂාව හා සහභාගිත්වය වෙතින් උඩරැටියා හා බ්‍රිතාන්‍ය නිලධාරීන් අතර වූ විෂමතාව බොහෝ විය. කන්ද උඩරට රදළ ප්‍රධානීන් මතු නොව භික්ෂූන් වහන්සේලා ද සාමාන්‍ය වැසියෝ ද බ්‍රිතාන්‍ය පාලනය ගැන මහත් කලකිරීමට පත් වූහ. එබැවින් 1818 කැරැල්ලක් පැන නැඟුණේ ඉංග්‍රීසින්ට විරුද්ධව ය. 1817 නොවැම්බර් මාසයේ සෙන්පති මැක් ඩොනල්ඩ් ඌව පෙදෙසේ

ගම්බිම් ගිනිතබා අස්වැන්න විනාශ කිරීම දරා ගැනීමට නොහැකි වූ අපරාධයකි. වැසියන්ගේ ධාන්‍ය සහ ගව සම්පත පැහැර ගත්හ. වාරිමාර්ග ක්‍රම විනාශ කොට ගොවිතැන් කර්මාන්තයේ ප්‍රාණය සිඳලූහ. 1817 – 1818 කැරැල්ල භීෂණකාරී අයුරින් ඉංග්‍රීසීහු මැඩලූහ. ලේ ගැලීම් අනවරත විය. ජීවිත හානි අපමණ විය. සියල්ල සුන් විය. 1843 රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණ පැන නැඟුණි ද ඒවා අසාර්ථක විය. සිංහලේ ජනතාව වසර පහක් ගෙවී යාමට පෙර විදේශීක බ්‍රිතාන්‍ය පාලනයට එරෙහි ව නැඟී සිටීමෙන් 1848 යළිත් කැරැල්ලක් ගැසූහ. එකල ආණ්ඩුකාර ටොරින්ටන් සාමි පනවා තිබූ බලු බද්ද, තුවක්කු බද්ද, මුද්දර බද්ද, වෙළෙඳපොළ බද්ද, කරත්ත බද්ද සහ වතු බද්ද, ඇඟබද්ද වැනි බදුවලින් පීඩිත ජනයා තුළ බ්‍රිතාන්‍ය විරෝධතාව යළිදු පැන නැඟුණි. 1833

**සිංහලේ ජනතාව වසර පහක් ගෙවී යාමට පෙර විදේශීක බ්‍රිතාන්‍ය පාලනයට එරෙහි ව නැඟී සිටීමෙන් 1848 යළිත් කැරැල්ලක් ගැසූහ. එකල ආණ්ඩුකාර ටොරින්ටන් සාමි පනවා තිබූ බලු බද්ද, තුවක්කු බද්ද, මුද්දර බද්ද, වෙළෙඳපොළ බද්ද, කරත්ත බද්ද සහ වතු බද්ද, ඇඟබද්ද වැනි බදුවලින් පීඩිත ජනයා තුළ බ්‍රිතාන්‍ය විරෝධතාව යළිදු පැන නැඟුණි.**




කෝල්බෲක් ප්‍රතිසංස්කරණයෙන් වෙනස් වන්නට වූ ලක් සමාජය තුළ 1840 අංක 5 දරන ඉඩම් පනත හා 1840 අංක 12 දරන මුඩුබිම් පනත පැන වීමෙන් ස්වදේශිකයාට ප්‍රශ්න රැසකට මුහුණ දීමට සිදු වූ අවස්ථා ජනිත විය. රාජ්‍යය තැබෑරුම් විවෘත කිරීමට අවසර දීමෙන් රට පුරා සුරාව ව්‍යාප්ත වන්නට විය. එය සිංහල ජාතිය සතු සංස්කෘතික සමාජය විනාශ මුඛයට හෙළීමේ ඉංග්‍රීසීන්ගේ උපක්‍රමයක් බඳු විය. රට බේරා ගැනීමට පෙරට පැමිණි ගොන්ගාලේගොඩ බණ්ඩා, දීනෝස්, පුරන්අප්පු, ඩිංගිරාළ වැනි වීරයන්ගේ නම් ඉතිහාසයට එක් විය. ඉංග්‍රීසීන් විසින් කඩහපොළ (කහල්ලේ) හිමියන් 1848 අගෝස්තු 26 වැනි දින පෙරවරු හතට සිවුරු දරා සිටියදී ම වෙඩි තබා මරා දමන ලදී.

පණ්ඩුකාභය රජ සමයේ ඇතිවුණු ගම්සභා ක්‍රමය පසු ව රට සභා, මහනාඩුව ඔස්සේ පැමිණි පරිපාලන රටාව, බටහිර බලවේග හමුවේ වෙනස් වූයේ ය. ගොඩ මඩ ගොවිතැන් ක්‍රම අතරට වතු වැවිලි කෘෂිකර්මය පැමිණියේ ය. වික්ටර් අයිවන් "ශ්‍රී ලංකාව, ඉතිහාසයේ සත්‍යත්වය" පොතේ කෝල්බෲක් ප්‍රතිසංස්කරණ හඳුන්වා ඇත්තේ රට නූතන කිරීමට හේතු වූ පදනම වශයෙනි. රාජකාරි ක්‍රමය අහෝසි කිරීම බලවත් අභියෝගයක් විය. රාජකාරිය හැටියට සලකන ලද්දේ රජුට අයත් ඉඩම් භුක්ති විඳින්නන් ඒ සඳහා ජාති, කුල ක්‍රමය අනුව බැඳී සිටි වැඩවසම් සේවාවන් ය. ආණ්ඩුවට පැවැති වෙළෙඳ ඒකාධිකාරිය ඉවත් කිරීම, රට ඒකාබද්ධ කිරීම, ආණ්ඩුකාරයාගේ බලතල සීමා කිරීම, විධායක හා ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභා ක්‍රමයක් බිහි කිරීම, බ්‍රිතාන්‍ය ඒකාධිකාරයක් ව පැවැති සිවිල් සේවය ස්වදේශිකයන්ට විවෘත කිරීම, කෝල්බෲක් ප්‍රතිසංස්කරණවලට ඇතුළත් වූයේ ය. කෝල්බෲක් ප්‍රතිසංස්කරණ නිසා මුහුදුබඩ සිංහල ප්‍රදේශ, මුහුදුබඩ දෙමළ ප්‍රදේශ හා උඩරට ප්‍රදේශය වශයෙන් කොටස් තුනක් ලෙස කළ පාලනය අත්හැර තිබේ.

නිදහස් ජන සම්මිශ්‍රණයකට බාධා කරන, ආර්ථික සංවර්ධනයට ද සීමා පනවන ආණ්ඩුකාරයාට අත්තනෝමතික බලයක් ලබා දෙන ක්‍රමයක් හැටියට කෝල්බෲක් ඒ තත්ත්වය තේරුම් ගත් බව වික්ටර් අයිවන් පවසයි. උතුරු, නැගෙනහිර, දකුණ, බස්නාහිර හා මධ්‍යම හැටියට රට පළාත් පහකට බෙදා මුළු රට ම වෙනුවෙන් පොදු ඒකාබද්ධ පාලන ක්‍රමයක් ක්‍රියාත්මක වන්නට විය. ගමනාගමනය, මාර්ග, අධ්‍යාපනය, සිවිල් පරිපාලනය, අපරාධ, යුක්ති පරිපාලනය, පණිවුඩ හුවමාරු ක්‍රම, වෙළෙඳ ආර්ථිකයක මූලික ස්වරූපය බිහි කරමින්, සමාජ වෙනස්කම් ඇති කරමින් පැවති සාම්ප්‍රදායික සමාජ වටපිටාව විපරිණාමය වූයේ ය. නව සමාජ ස්තරායන රටාවක් බිහි වෙමින් පැවතුණි. නව පන්ති සමාජයක් ජනිත වන අතර පංචමහා වාදය, පුවත්පත් සඟරා බිහිවීම, සාක්ෂරතාව දියුණුවීම, මුද්‍රණ කර්මාන්තයේ ප්‍රබෝධය, නව ආගමික ආධ්‍යාත්මික පුනරුදයකට ඉඩ සැලසීම, බැංකු ක්‍රම, බිහි වීම, සාහිත්‍ය කලා, සෞන්දර්ය කලාවන්ගේ හා ඡායාරූප කලාව, ග්‍රැමෆෝන් භාවිතය, නාඩගම් සිංදු වැටී නූර්ති බිහිවීම සමඟ උතුරු ඉන්දියානු සංගීතයේ පැතිරීම මේ රටේ ජන සමාජයට බලපෑවේ ය. මිෂනාරි ව්‍යාපාරයට මුහුණ දීමට හින්දු, බෞද්ධ, ඉස්ලාම් පාසල් බිහිවීම තවත් කඩඉමකි.

සාම්ප්‍රදායික විහාර දේවාල ඉඩම් භුක්තිය, මුඩු ඉඩම් ඉංග්‍රීසි යුගයේ අණපනත් මඟින් පාලනයකට නතු කිරීම ස්වදේශිකයන්ට ප්‍රශ්නකාරී විය. මෙරට අභ්‍යන්තරික කාරණා නිසා පෘතුගීසි, ලන්දේසි යුගවල උපසම්පදාව නැතිව ගොස් පසු ව සියම්

රටේ උපකාරයෙන් 1753 දී ශ්‍යාමෝපාලි මහා නිකාය පිහිටුවීම, උපසම්පදාව ප්‍රතිස්ථාපනය කිරීම, සරණංකර සංඝරාජ මාහිමිපාණන්ගේ සාධනීය ක්‍රියාමාර්ග අතර විය. ඉක්බිතිව 1802 අමරපුර නිකාය, 1864 ශ්‍රී රාමඤ්ඤ නිකාය ඇති වීමෙන් ද ශාසනික වෙනසක් සිදු විය. 19 වැනි සියවසේ බෞද්ධ පුනරුද ව්‍යාපාරයක් ඇති වීමට එලෙස පසුබිම සැදුණි. 1841 දී රත්මලානේ පරමධම්ම චේතිය පිරිවෙණ පිහිටු වූයේ වලානේ සිද්ධාර්ථ හිමිපාණන් ය. 1873 හික්කඩුවේ සුමංගල හිමියෝ විද්‍යෝදය පිරිවෙණ ද 1875 රත්මලානේ ධර්මාලෝක හිමියෝ විද්‍යාලංකාර පිරිවෙණ ද පිහිටු වූහ. මොහොට්ටිවත්තේ හිමියන්ගේ සහ අනගාරික ධර්මපාල තුමාගේ ක්‍රියාකලාප එමෙන් ම 1883 කොටහේනේ කැරැල්ල බෞද්ධ ප්‍රබෝධයට තවත් පන්නරයක් ලබා දුනි. 1884 හෙන්රි ස්ටීල් ඔල්කට් තුමාගේ පැමිණීම මගින් ආනන්ද, ධර්මරාජ, මහින්ද, මලියදේව පාසල් බිහිවිය. අමද්‍යප ව්‍යාපාරත් පරමවිඥානාර්ථ සමාගමේ, මහාබෝධි සමාගමේ, තරුණ බෞද්ධ සංගමය හා සමස්ත ලංකා බෞද්ධ සම්මේලනයේ වැඩ කටයුතු නොයෙක් දහරාවන්ගෙන් පැන නැගුණු එක ම අරමුණු ඔස්සේ ගලා ගිය භූමිකාවන් ය. 1885 වෙසක් පෝය නිවාඩුව, බෞද්ධ කොඩිය නිර්මාණය කෙමෙන් ලාංකික සමාජ වෙනස් වන්නට විය. පත්‍රිකා පොත් බිහිවීම තවත් අංගයකි.

## හින්දු පුනරුද ව්‍යාප්තිය

ක්‍රිස්තියානි මිෂනාරි කටයුතුවලට එරෙහි ව බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ නැගිටීම මෙන් ම යාපනයේ ද හින්දු ආගමික හා අධ්‍යාපනික නවෝදයක් මතුවිය. ඇඩි හින්දු පලාතක් වුව ද යාපනයේ බටහිර අධ්‍යාපනයට තෝන්තැන්නක් විය. 19 වැනි සියවසේ හින්දු ආගමික හා අධ්‍යාපනික පුනරුදයේ ප්‍රාරම්භකයා වූයේ යාපනයේ නල්ලූර්හි උපන් ශ්‍රී ල ශ්‍රී ආරුමුගනාවලර් තුමා ය. (1822 – 1879) පොන්නම්බලම් අරුණාචලම් හා පොන්නම්බලම් රාමනාදන් වැනි ද්‍රවිඩ ප්‍රබුද්ධ නායකයන් 19 වැනි සියවස මැද 20 වැනි සියවස මුල ලංකාවේ විවිධ ජාතික ප්‍රශ්න කෙරෙහි නිර්භය ව ඉදිරිපත් වූ වියතුන් ය. ලාංකික ද්‍රවිඩ ජනයාගේ සංස්කෘතික උරුමය රැක ගන්නට මවුනු ඉදිරිපත් වූහ. 1879 මැයි 8 වැනි දා ශ්‍රීමත් මුතුකුමාරස්වාමි මහතා අභාවයට පත් වූ පසු ව්‍යවස්ථාදායක සභික ධූරය සඳහා පොන්නම්බලම් රාමනාදන් තුමා පත් විය.



නිදහස සැමරුම:
සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය අගමැති සමයේ

සිංහලයන් පවා මුහුණ දුන් ප්‍රශ්නවලට එතුමා සාධාරණ ව වාද කළේ ය. එහි ප්‍රතිඵල සැමට අත්පත් වූයේ ය.

## මුස්ලිම් පුනරුදය

බෞද්ධ, හින්දු ව්‍යාපාරයෙන් ද ආභාසය ලැබූ මුස්ලිම් පුනරුද ව්‍යාපාරය 19 වැනි සියවසේ දෙවැනි භාගයේ ඉස්මතු වූයේ ය. 1883 ජනවාරි 10 වැනිදා ඊජිප්තුවෙන් ලංකාවට පිටුවහල් කළ ඔරාබිපාෂා ඇතුළු පිරිස ලංකාවට පැමිණුන ද මුස්ලිම් පුනරුදයක් බිහි වීමට එතරම් ආලෝචනා මතු කළ බවක් නොපෙනේ යයි කේ. ඩී. ජී. විමලරත්න ඇතුළු විද්වතුන්ගේ අදහස යි. එහෙත් ඔරාබිපාෂාගේ ලංකා සම්ප්‍රාප්තිය කිසියම් මුස්ලිම් ප්‍රබෝධයකට තුඩු දුණි. එම්. සී. සිද්දිලෙබ්බෙ එහි (1838 - 1895) දැවැන්තයකු විය. ඒ මහතා මහනුවර ප්‍රසිද්ධ නීතිඥවරයෙකි. ඉන්දීය මුස්ලිම් ජාතිකයකු වූ සයිඩ් අහමඩ් ඛාන්ගේ ආභාසය ලද සිද්දි ලෙබ්බෙ මහතා ධනවතකු වූ ඒ. එම්. වපිච්චේ මරික්කාර්ගේ (1868 – 1915) ආධාරයෙන් 1892 දී කොළඹ මුස්ලිම් සමාගම පිහිටුවා ඇත. 1804 නොවැම්බර් මස මරදානේ සහිරා විදුහල ඇති කිරීම ජයග්‍රහණයකි. 1893 දී මහනුවර මුස්ලිම් ශිෂ්‍යාවන්ට ප්‍රථම පාසල පිහිටු විය. අයි. එල්. එම්. අබ්දුල් අසීස් (1867 – 1915) මුස්ලිම් සංස්කෘතික දියුණුවට 1910 දී මුස්ලිම් තරුණ සංගමය පිහිටු විය. 1914 මුස්ලිම් රිවිව් පත්‍රය, 1915 මුස්ලිම් ගාඩියන් පත්‍රය පටන්ගෙන ඇත. ලංකාවේ නිදහස් සටනට උර දීමට 1919 ඇරඹුණු ලංකා ජාතික සංගමයට බැඳුණු මුස්ලිම් ජාතිකයෝ ප්‍රබල සාමාජිකයන් හැටියට ක්‍රියා කළහ. 1944 දී ඒ. සී. අමීර් මහතා ලංකා ජාතික සංගමයේ භාණ්ඩාගාරික වූ අතර, 1920 දී ටී. බී. ජයා මහතා එහි විධායක කමිටු සාමාජිකයෙක් විය. ඒ. සී. එම්. අමීර් 1944 දී ද, එම්. ආර්. ටී. අක්බාර් 1945 දී ද ලංකා ජාතික සංගමයේ ක්‍රියාකාරීහු වූහ.

නිදහස් සටනේ එක් ප්‍රබල සංසිද්ධියක් වූයේ අමද්‍යප ව්‍යාපාරය යි. උඩරට වතු වැවිලි ආර්ථිකය හේතුවෙන් මෙරටියන් අතර සුරාපානය 1840 ගණන්වල සිට පැතිරුණි. 1912 දී සුරාබදු පනත බ්‍රිතාන්‍යයෝ ලංකාවට හඳුන්වා දුන්නෝ ය. මේ පනතට එරෙහි ව වෛද්‍ය මාක්ස් ප්‍රනාන්දු මහතා

කරුණු පෙන්නුම් කළේ ය. සුරා බදු පනතට විරුද්ධ ව කොළඹ, නුවරඑළිය, කුරුණෑගල, මාතර මහජන රැස්වීම් පැවැත් විය. ඩී. බී. ජයතිලක, මාක්ස් ප්‍රනාන්දු, වෛද්‍ය ඩේවිඩ් රොක්වුඩ්, වෛද්‍ය සී. ඒ. හේවාවිතාරණ, එම්. ඩී. ස්ප්‍රවුල්, ඩී. ආර්. විජයවර්ධන වැනි වියතුන්ගෙන් යුක්ත දූත පිරිසක් එංගලන්තයට ගොස් අමද්‍යප ව්‍යාපාරය ක්‍රියාත්මක කළ හ. 1915 සිංහල මුස්ලිම් කෝලාහල ඇති වීමෙන් අමද්‍යප ව්‍යාපාරය කඩාකප්පල් වුණි. අමද්‍යප ව්‍යාපාරයේ නායකයාණන් වූ සී. ඒ. හේවාවිතාරණ, ඩී. එස්. සේනානායක, එෆ්. ආර්. සේනානායක අත්අඩංගුවට ගත්හ. ලංකාවේ ප්‍රතිසංස්කරණ උද්ඝෝෂණ ව්‍යාපාරය සරුසාර කරගෙන නිදහස ලබා ගැනීමට නම් ඒකාබද්ධ මණ්ඩලයක අවශ්‍යතාව වටහාගත් අරුණාචලම් මහතා, 1919 දෙසැම්බර් 13, 14 දිනවල නිදහස් ව්‍යාපාරය ශක්තිමත් කිරීමට ඒකීය සංවිධානයක් යෝජනා කළේ ය. 1919 දෙසැම්බර් 11 ලංකා ජාතික සංගමය බිහි විය. මින් ඇති වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ උද්ඝෝෂණ ව්‍යාපාරයට ඇහුම්කන් දුන් බ්‍රිතාන්‍ය රජය විසින් 1920 මැනිං ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කරන ලදී.

සර්වජන ඡන්ද බලය ලැබුණේ 1931 දී ඩොනමෝර් යෝජනා මඟින් බව බොහෝදෙනා දනිති. එය පොදුජන සුබසිද්ධියට සේවයක් වූ පනතකි. 1935 වෘත්තීය සංගම් ආඥා පනත, 1939 දුගී නීති ආඥා පනත, 1945 දී සම්මත වූ නිදහස් අධ්‍යාපනයට මඟ පෑදුණේ මේ ඩොනමෝර් යෝජනා බව සඳහන් කළ යුතු යි. රිචඩ් ඒඩ්‍රියන් මිරැන්ඩෝ ඔහුගේ ගෙවත්තේදී ම වෙඩිතබා මරා දැමීම, 1915 අගෝස්තු 7 වැනි දින නාගරාරක්ෂක සේවයේ යෙදී සිටි දියුණුගේ එඩ්වඩ් හෙන්රි පේද්‍රිස් යුද්ධාධිකරණය ඉදිරියට පමුණුවා යුද්ධ නීතිය යටතේ වෙඩි තබා මරා දැමීම වැනි භීෂණකාරී තත්ත්වය අළුයට ගිනි පුපුරු මෙන් පැවතුණි. ඒ. ඊ. ගුණසිංහ මහතාගේ කම්කරු ව්‍යාපාරයේ කටයුතු, එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා 1936 දෙසැම්බර් 10 වැනි දින සිංහල මහ සභාව පිහිටුවීම, 1935 ලංකා සමසමාජ පක්ෂය හා කොමියුනිස්ට් පක්ෂය බිහිවීම, 1942 කැලණියේ පැවැති ලංකා ජාතික සංගමයේ සභාවාරයේදී ලංකාවට ඩොමිනියන් තත්ත්වයක් නොව පූර්ණ නිදහස ඉල්ලීමේ යෝජනාව ඉදිරිපත් කිරීම මේ රටේ ඉතිහාසයේ ඇති කළ වැදගත් ප්‍රපංචයන් ය. 1944 දෙසැම්බර් 22 වැනි දා සෝල්බරි කොමිසම ලංකාවට එවනු ලැබීය. 1945 ඔක්තෝබර් මස 9 වැනි දින සෝල්බරි වාර්තාව ප්‍රසිද්ධියට පත් කර තිබේ. මේ කොමිසම ඉදිරිපත් කළ ආණ්ඩු ක්‍රමය පිළිබඳ යෝජනා 1944 ඇමැති මණ්ඩල ආණ්ඩු ක්‍රම කෙටුම්පතින් ඉදිරිපත් කළ ආණ්ඩු ක්‍රමයට සමාන වූ නිසා, රාජ්‍ය මන්ත්‍රණ සභාවට කරුණු ඉදිරිපත් කර තිබේ. සෝල්බරි ව්‍යවස්ථාවට පක්ෂව ඡන්ද 51ක් ද විපක්ෂ ව ඡන්ද 3ක් ද ලැබුණි.

ලාංකික ජනනායකයන් හා සංගම් විසින් දෙන ලද සාක්ෂි විමසන විට ජාතිය කොටස් කීපයකට බෙදී තිබූ වග පැහැදිලි ය. උඩරට පහතරට භේදය, සිංහල හා ද්‍රවිඩ භේදය ඉන් කිහිපයකි. සෝල්බරි කොමිසමේ අදහස වූයේ පටු ජාතිභේද, වාද භේද මතිමතාන්තරවලින් විනිර්මුක්ත වූ පක්ෂ ක්‍රමය මත ගොඩ නැංවුණු ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයක් ලංකාවට පිරිනැමිය යුතු බව ය. ලංකාවට ෆෙඩරල් ක්‍රම හා ජාති මූලික නියෝජිත ක්‍රම සුදුසු නොවන බව සෝල්බරි මතය විය. ප්‍රදේශවල නියෝජන ක්‍රමයෙන් තෝරා ගත් 95 දෙනෙකු ගෙන් සමන්විත නියෝජිත මන්ත්‍රී මණ්ඩලයක් යෝජනා කළේ එබැවිනි. සුළු ජාතියේ කිය පහ කිරීමට 6 දෙනකු ආණ්ඩුකාරයාට පත් කළ හැකි විය. සෙනෙට් සභාව 30ක ගෙන් සංයුක්ත ය. එසේ යෝජනා කළේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ හිතුවක්කාර ක්‍රියා පරීක්ෂා කිරීමට ය. කැබිනට් ආණ්ඩු ක්‍රමයේ ලක්ෂණ මෙහි අන්තර්ගත විය. විදේශ හා ආරක්ෂක කටයුතු පිළිබඳ බලය සතුව පැවැතුණේ බ්‍රිතාන්‍ය කිරීටයට ය. ආණ්ඩු ක්‍රමය සංශෝධනය හෝ වෙනස් කිරීම පිණිස පාර්ලිමේන්තුවේ 2/3ක අනුමැතිය අවශ්‍ය විය. සෝල්බරි කොමිසමෙන් ලංකාවට පූර්ණ නිදහස නොලැබුණි. ඩොමිනියන් ස්වරූපයේ ආණ්ඩු ක්‍රමයක් මෙරටට ප්‍රදානය වුණි. 1946 මැයි මස 15 වැනි දින ප්‍රකාශයට පත් කොට 1946 මැයි 17 වැනි දින නව ව්‍යවස්ථාව ක්‍රියාත්මක විය. 1947 ජූනි 18 අග්‍රාණ්ඩුකාරයා විසින් ලංකාවට ඩොමිනියන් තත්ත්වය දෙන බව ප්‍රකාශ කරන ලදී. අලුත් ව්‍යවස්ථාව අනුව 1947 අගෝස්තු 15 දිනට ප්‍රථම මැතිවරණය පැවැත්විණ. ලංකාවට නිදහස ලබා ගැනීමේ අටියෙන් 1919 ස්ථාපිත ලංකා ජාතික සංගමය වෙනුවට 1946 සැප්තැම්බර් 12 දින එක්සත් ජාතික පක්ෂය පිහිටුවා ගත් ඩී. එස්. සේනානායක මහතා මැතිවරණයේ ආසන 42 ක් දිනා සෝල්බරි ආණ්ඩු ක්‍රමය ක්‍රියාවට නැංවීමට සූදානම් විය. 1947.09.24 දින සිට 1948 පෙබරවාරි 3 වැනි දා තෙක් සෝල්බරි ආණ්ඩු ක්‍රමය ක්‍රියාත්මක වූයේ ය. ඩී. එස්. සේනානායක මහතා 1947 සැප්තැම්බර් 24 වැනි දින ලංකාවේ ප්‍රථම අගමැතිවරයා ලෙස දිවුරුම් දුන්නේ ය. 1947 අගෝස්තු 15 වැනි දා ඉන්දියාවට බ්‍රිතාන්‍යයෙන් නිදහස ලැබුණි. ඉන්දියාව හා පකිස්ථානය බෙදා වෙන් කර ලදී. බුරුමයට ද නිදහස උදා විය. මාක්ස්වාදී කොටස් තවදුරටත් උද්ඝෝෂණය කළේ ලද නිදහස පූර්ණ වූවක් නොවන බව ය. ලංකාවට ස්වයං පාලනය පැවරූ පසු ලංකා ස්වාධීන හා ව්‍යවස්ථා කෙටුම්පත සැකැසුණි. 1948 පෙබරවාරි 4 වැනි දා සිට ලංකාව ස්වාධීන රාජ්‍යයක් විය. 1971 තරුණ කැරැල්ලක් සිදු විය. 1972 මැයි 22 ශ්‍රී ලංකාව ජන රජයක් වූ අතර 1977 ජේ. ආර්. ජයවර්ධන මහතාගේ ජයග්‍රහණයෙන් පසු 1978 සිට පූර්ණ බලතල සහිත විධායක ජනාධිපති ක්‍රමයක් මේ රටට පේන්දු විය. 1983 ජාතිභේද වාදය නිසා මහා විනාශයක් සිදු විය. ගෝලීය සංස්කෘතික අධිරාජ්‍යවාදය ඇතුළත සාමූහිකත්වය උරුම කොට ගෙන කුඩා දිවයිනක දිවි ගෙවූ අපි ඉදානීන්තනයෙහි අප්‍රමාණ රූදුරු දෘෂ්ටිග්‍රාහී පුද්ගලවාදී සමාජයකට අවතීර්ණ වෙමින් සිටිමු. 1948 ජාතික කොඩියට, ජාතික ගීයට, භාෂාවට, ජාතියට, ආගමට වාදභේද ඇති කරගත් අපි අදටත් එබඳුම පටු චින්තන ආකල්ප ඔස්සේ අසහනයට පත් වී සිටිමු. සාධාරණ ව්‍යවස්ථාවක් සකසා ගැනීමට කැස කවමින් සිටිමු. අධ්‍යාපනය, ආර්ථිකය, ව්‍යාපාරික, සමාජ සංස්කෘතික, දේශපාලන විලෝපනය වෙතින් පළට කර තිබෙන්නේ නොමිනිස්කම් ය. පොදු දේපළ තමන් සන්තක කර ගන්නා වූ ස්වදේශයට ගෞරව බහුමාන නැති ඇත්තන් බවට අපි පත් වීමු. අප අපේ අනාගතය සහජීවනය, සංහිඳියාව සහයෝගය, අනුකලනය සෞභාග්‍යය, සශ්‍රීකත්වය කරා එළැඹීමට විවිධත්වය ඇසුරින් ස්වීය ඒකීය මාර්ගයකට පිවිසිය යුත්තේ තමතමන්ගේ අනන්‍යතාව ද ආරක්ෂා කොට ගනිමිනි. ඒ සඳහා අනලස් ව, අනල්ප ව දිවා රෑ නොපසා ධෛර්යයෙන් වීර්යයෙන් යුක්ත ව ක්‍රියා කළ යුත්තෝ වෙමු. ලෝක පරිමාණයේ සිදු වන පාරිසරික, ආර්ථික දේශපාලන, සමාජ, සංස්කෘතික ගතික ස්වරූපය අභිමුඛයේ කුඩා රටක දිවිගෙවන අපි අපරාධයන්ගෙන් විනිර්මුක්ත වෙමින් තිරසර සංවර්ධනය කෙරෙහි උත්සුක වන පර්යන්තයේ ප්‍රබුද්ධ ජනතාවක් ලෙස වහ වහා ක්‍රියා කළ යුත්තෝ වන්නෙමු.

ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර

# ජාතියේ ස්වර අභිමානය

## ශ්‍රී ලංකා ජාතික ගීයේ ආරම්භය

අපේ සියලු ම ගීත අතරින් උතුම් ම ගීතය වන්නේ ජාතික ගීතය යි. එය නිදහස් ලංකාවේ අනන්‍යතාව මුළු ලොවට ම කියාපාන අභිමානවත් පදාවලියකි. ලංකාවේ රාජ්‍ය නායකත්වය නියෝජනය කරන්නේ රාජකීය ගෞරවය ලබන්නේ ද ජාතික ගීය වන නිසා එය අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අංක හත යටතේ නීතිගත කර ඇත්තේ මේ අයුරින් ය. "ශ්‍රී ලංකා ජන රජයේ ජාතික ගීය" ශ්‍රී ලංකා මාතා ගීය වන්නේ ය. ජාතික ගීයෙහි පදමාලාව සහ සංගීතය 3 වැනි උප ලේඛනයෙහි දැක්වෙන්නේ ය.

එවැනි ගෞරවනීය තත්ත්වයකට පත්වී ඇති අපේ ජාතික ගීතයත් නිදහසත් අතරේ ඇති සම්බන්ධතාව තව තවත් තහවුරු වන්නේ ජාතික ගීයෙන් තොර වූ නිදහස් සැමරුමක් නොමැති වන බැවිනි. පුරා වසර 69ක කාල පරාසයක් තුළ උත්තරීතර ගෞරවයකට පත් ව ඇති ජාතික ගීයේ ආරම්භය පිළිබඳ සොයා බැලීම ඉතාමත් කාලෝචිත ය. ලංකාවට නිදහස ලැබීමට පෙර බ්‍රිතාන්‍ය පාලන යුගයේදී ජාතික ගීතය වශයෙන් භාවිත කර ඇත්තේ God Save the King නමැති ගීතය යි. පසුකාලීන ව ඇතැම් අවස්ථාවලදී දන්තෝ බුදුන්ගේ ගීතයේ අනුවාදනයක් ජාතික ගීයක් ලෙසින් වාදනය කරන ලද බව දැනගන්නට තිබේ. ඩන්කන් වයිට් ලංකාවට ඔලිම්පික් පදක්කමක් දිනා දුන් අවස්ථාවේදී වාදනය කර ඇත්තේ ද දන්තෝ බුදුන්ගේ ගීතයේ අනුවාදනය බව ඇතැම් පුවත්පත්වල සඳහන් වේ.

අපේ ජාතික ගීය මුල් අවස්ථා කිහිපයකදී ම 'නමෝ නමෝ මාතා' යනුවෙන් ගායනා කරනු ලැබුවත් 1960 දශකයේදී එම ගීයේ ආරම්භය 'ශ්‍රී ලංකා මාතා' යනුවෙන් වෙනස් කරන ලද අතර එය හුදෙක් ම දේශපාලනික හේතු මත සිදුවූවක් බව එකල විචාරකයන්ගේ අදහසක් වූ අතර තවත් පිරිසක් කියා සිටියේ එහි ඇති අක්ෂර දෝෂයක් නිසා ගීතයෙහි ආරම්භය වෙනස් කරන ලද බව ය.

1948 දී අපේ රටට නිදහස ලැබීමෙන් පසු ව පළමු වැනි නිදහස් සැමරුම පවත්වන ලද්දේ 1949 පෙබරවාරි මාසයේ හතර වැනි දිනදී ය. දැනට නිදහස් චතුරශ්‍රයේ ඉදිකර ඇති නිදහස් මන්දිරය පිහිටා තිබෙන භූමිය පළමු නිදහස් සැමරුම් උත්සවය වෙනුවෙන් වෙන් කර තිබුණේ ය. නිදහස් රාජ්‍යයකට සංකේතයක් වූ ජාතික ගීයක් එදා අපට නොමැතිවීම නිසා එම අඩුව සපුරා ගැනීම සඳහා තරගයක් පවත්වා ජාතික ගීයකට සුදුසු නිර්මාණයක් තෝරා ගැනීම ආණ්ඩුවේ තීරණය විය. එම තරගයේදී විනිශ්චය මණ්ඩලය විසින් තෝරා ගනු ලැබුවේ ගම්පොළ පී. බී. ඉලංගසිංහ නොතාරිස් රාළහාමි විසින් රචනා කරන ලද 'ශ්‍රී ලංකා මාතා - පාලා යස මහිමා ජය ජය' නම් වූ ගීතය යි. එම ගීතයෙහි සංගීතය නිර්මාණය කර තිබුණේ ලයනල් එදිරිසිංහ මහතා විසිනි. මේ දෙදෙනා ම ජාතික ගීතය තෝරා ගැනීමේ විනිශ්චය මණ්ඩලයේ සාමාජිකයන් සේ කටයුතු කිරීම නිසා එම ගීතය තෝරා ගැනීමේදී කිසියම් අකටයුත්තක් සිදුවී ඇති බවට නැඟුණු චෝදනාවත් උද්ඝෝෂණයත් නිසා එම තෝරා ගැනීම අවලංගු කිරීමට සිදුවිය.

ආනන්ද සමරකෝන් මහතා විසින් ලියා ඔහු ම තනුව නිර්මාණය කර තිබූ 'නමෝ නමෝ මාතා ගීතය' නිදහස් ලංකාවේ ජාතික ගීතය බවට රජය විසින් තෝරා ගන්නා ලදී. මේ ගීතය ජාතික ගීතය බවට පත්වන්නට පෙර 1940 දී ආනන්ද සමරකෝන් මහතා ගාල්ලේ මහින්ද විද්‍යාලයේ සංගීත ගුරුවරයා ලෙස සේවය කරන කාලයේදී එම විද්‍යාලයේ සිසුන්ට උගන්වා ඔවුන් ලවා ගායනා කරවා තිබේ. එහෙත් එම ජාතික ගීය 1949 පැවති නිදහස් උත්සවයේදී පාසල් ළමුන් ලවා ගායනා කිරීම සම්බන්ධයෙන් මතුවී තිබුණේ ගැටලුවකි. නිදහස් දින රාජ්‍ය උත්සවයේදී ජාතික ගීය ගායනා කිරීම පුහුණු කිරීමට සුදුසු සංගීතඥයකු සොයා ගැනීමත්, සුදුසු පාසලකින් බාලිකාවන් සොයා ගැනීමත් යන ප්‍රශ්න දෙකට පිළිතුරු සොයා ගැනීමේ වගකීම ආණ්ඩුව විසින් පවරා තිබුණේ මුදල් අමාත්‍ය ජේ. ආර්. ජයවර්ධන මහතාට ය.

ජේ. ආර්. ජයවර්ධන මහතාට අවශ්‍ය වූයේ ශ්‍රී ලංකාවේ ප්‍රථම නිදහස් දින රාජ්‍ය උත්සවයේදී ජාතික ගීතය මුල්වරට එළි දක්වා ගීතයේ අඩංගුව තිබූ ජාතික හැඟීම් සහ දේශානුරාගයත් ලංකාවේ අභිමානයත් නොනැසෙන අයුරින් ඉදිරිපත් කිරීමට ය. ඒ වන විට ද දේශීය සංගීතයේ සලකුණු ඔස්සේ රටට අවශ්‍ය ව තිබූ ගීත රටාවක් නිර්මාණය කරමින් සිටි ප්‍රසිද්ධ සංගීතඥයන් ස්වල්ප දෙනකු සිටියත් ජාතික ගීය පුහුණු කිරීමේ කටයුත්ත සඳහා ජේ. ආර්. විශ්වාසය තබා තිබුණේ වැඩි ප්‍රසිද්ධියක් නොමැති වෘත්තියෙන් සංගීතඥයෙකු නොවූ පුද්ගලයකු වෙත ය. ජේ. ආර්. ගේ එම තෝරා ගැනීමෙහි තවත් විශේෂත්වයක් වූයේ තෝරා ගත් පුද්ගලයා ගරු මර්සලින් ජයකොඩි පියතුමා වීම ය. කතෝලික සභාවේ පියතුමකු වූ මෙතුමා සිංහල සංගීතයේ සලකුණු අනුව කන්තාරු ගී නිර්මාණය කිරීම නිසා එදා කැපී පෙනුණු පුද්ගලයකු ද විය.

මුදල් අමාත්‍ය ජේ. ආර්. ජයවර්ධන මහතා මර්සලින් ජයකොඩි පියතුමා හමුවීමට එතුමා නැවතී සිටි දේවස්ථානයට පැමිණියේ නිදහස් දින රාජ්‍ය උත්සව වංශ කථාවේ මුල් ම පරිච්ඡේදයට එතුමාගේ නාමය ද එක්කර ගැනීමේ අදිටනින් යුතුව ය. පියතුමා හමු වූ ජේ. ආර්. අවශ්‍ය කාරණය පියතුමා වෙත ඉදිරිපත් කළේ ය. තමන් වෙත මෙවැනි භාරදූර කාර්යයක් පැවරීමට සූදානම් වීම පිළිබඳ ව පියතුමා විමතිය පළ කළත් ජාතික ගීය පුහුණු කරවීමේ කාර්යය භාරදීමට සුදුසු ම පුද්ගලයා පියතුමා බව සඳහන් කරමින් ජේ. ආර් කියා සිටියේ යෝජනාව පිළිගන්නා ලෙස ය. පියතුමාගේ කැමැත්ත ලැබීමෙන් පසු ව ජාතික ගීතය ගායනා කිරීම සඳහා මියුසියස් බෞද්ධ කාන්තා විද්‍යාලයේ සිසුවියන් සහභාගි කරවා ගන්නා මෙන් ජේ. ආර්. ජයවර්ධන මහතා ඉල්ලීමක් ද කළේ ය.

එයට ජයකොඩි පියතුමාගේ එකඟත්වය ලැබීමෙන් පසු ව එම අවස්ථාවේදී ම ජයවර්ධන මහතා ඔහුගේ මෝටර් රථයෙන් ම පියතුමාව මියුසියස් විද්‍යාලය වෙත කැඳවාගෙන ගොස් එවකට විදුහල්පති ධුරය දැරූ ක්ලේරා මොට්වානි මහත්මියට හඳුන්වා දුන්නේ ය. එම විද්‍යාලයෙන් පියතුමා විසින් ම තෝරා ගත් ශිෂ්‍යාවන් පනස් දෙනකු ජාතික ගීය ගායනා කිරීමේ පුහුණුවට එක්කර ගන්නා ලදී. පුහුණු කිරීම් සාර්ථක ව අවසන් කිරීමෙන් පසු ව 1949 පෙබරවාරි මාසයේ හතර වැනි දින පැවැත් වූ ජාතික නිදහස් දිනය සැමරීමේ පළමුවැනි රාජ්‍ය උත්සවයේ නිමාව සටහන් කරමින් සවස 05.15 ට මියුසියස් බෞද්ධ කාන්තා විද්‍යාලයේ ශිෂ්‍යාවන් විසින් රාජ්‍ය නායකයන් ඉදිරියේ



ආනන්ද සමරකෝන්ගේ
ආලේඛ්‍ය සිතුවමක්

පළමුවරට ජාතික ගීය ගායනා කරනු ලැබුවා ය. එහිදී වාදක මණ්ඩලයට සංගීතඥ ලයනල් එදිරිසිංහ, පී. එල්. ඒ. සෝමපාල යන මහත්වරු සමඟ මර්සලින් ජයකොඩි පියතුමා ද සහභාගී වූහ. ජාතික ගීය ගායනා කිරීමේ රාජ්‍ය උත්සව වංශ කථාවේ මුල් ම පරිච්ඡේදය සනිටුහන් කිරීමට මර්සලින් ජයකොඩි පියතුමා ද මියුසියස් බෞද්ධ කාන්තා විද්‍යාලයේ සිසුවියෝ ද දායක වූහ.

අපේ ජාතික ගීයේ අසිරිය ඒ ආකාරයෙන් ඉතිහාසයට එක් වෙද්දී එම ගීතයේ අවසානයේ සඳහන් වන

'එක මවකගෙ දරු කැළ බැවිනා යමු යමු වී නොපමා
- ප්‍රේම වඩා සැම භේද දුරැර දා නමෝ නමෝ මාතා'


යනා පදවැල්වලට යථාර්ථය එක්කරමින් සියලු ජාතීන් අතරත් ආගම් අතරත් වර්තමානයේදී ගොඩ නැගෙමින් පවතින සංහිඳියාව මෙවර නිදහස් දිනයේ විශේෂතම සිදුවීමක් ලෙසින් දැකිය හැකි ය.

ගාමිණී පරණයාපා

පුරා විද්‍යා

# ඉතිහාසයක දැනුම් සයුර

## මහාචාර්ය සෙනරත් පරණවිතාන



**සෙනරත් පරණවිතාන 120 වැනි ජන්ම සංවත්සර උපහාර උළෙලට අනුව පෙනී ගියේ මෙරට පුරාවිද්‍යා ක්ෂේත්‍රයට අද්විතීය මෙහෙවරක් කළ මහාචාර්ය සෙනරත් පරණවිතාන සූරීන් පිළිබඳ ජනතාව අවදි කිරීමේ දැඩි අවශ්‍යතාව මෙන් ම අනාගත පරපුරට එම උරුමය පවරාදීමේ ජාතික වැදගත්කම.**


**සාහිත්‍ය** සූරි සාහිත්‍ය චක්‍රවර්ති මහාචාර්ය සෙනරත් පරණවිතාන සූරීන්ගේ 120 වැනි ජන්ම සංවත්සරය පිළිබඳ සැමරුම් උළෙළක් නොබෝදා පැවැත්වුණේ මහාභාරකාර දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේදී. සෙනරත් පරණවිතාන පදනම හා මහාභාරකාර දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කළ මේ සැමරුම් උළෙලේ විශේෂත්වය වුණේ සෙනරත් පරණවිතාන සූරීන් පිළිබඳ මෙහෙවර ඇගැයෙන අතර ම මහා භාරකාර දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමෙන් ඔහු සතු උරුමය ජනතාවට දායාද කිරීමට ඇවැසි මග ද විවර වීම.

මෙහිදී මහාචාර්ය සෙනරත් පරණවිතාන අනුස්මරණ දේශනය පැවැත්වූයේ සම්මානිත මහාචාර්ය කේ. එන්. ඕ. ධර්මදාස. මුලසුන හෙබ වූ මහාචාර්ය ජේ. බී. දිසානායක, ආචාර්ය කලාකීර්ති එඩ්වින් ආරියදාස හා සෙනරත් පරණවිතාන පදනමේ ලේකම් හිටපු පුරාවිද්‍යා සහකාර අධ්‍යක්ෂ සිරිසමන් විජේතුංග විසින් ද සෙනරත් පරණවිතාන සූරීන් පිළිබඳ මතකය අවදි කළේ මේ අසහාය යුග පුරුෂයා සමඟ ගෙවුණු ජීවන අත්දැකීම් රසමුසුව ඉදිරිපත් කරමින්.

මේ අවස්ථාවට සෙනරත් පරණවිතාන පදනමේ සභාපති ආචාර්ය ශිරාන් දැරණියගල ඇතුළු විද්වතුන් මෙන් ම සෙනරත් පරණවිතාන සූරීන්ට ලැදි දැනුමින්, වයසින් මුහුකුරා ගිය විශාල පිරිසකි එක් ව සිටියේ. විශේෂයෙන් තරුණ පිරිස් වෙතින් සෙනරත් පරණවිතාන සූරීන් පිළිබඳ අවධානය ගිළිහී ගොස් ඇති සෙයක් ද එම ප්‍රණාම උළෙල්ලේදී විද්‍යමාන වුණා. මෙයින් තහවුරු වන්නේ එවැනි පුරෝගාමී චරිත අධ්‍යයනයට හා ඔවුන් හෙළි පෙහෙළි කර ගත් දැනුම් සම්භාරය මතු පරපුරට ද උරුම කර දීමේ අවශ්‍යතාව.

ගාල්ල මැටරඹ ග්‍රාමයේ 1896 වසරේ දෙසැම්බර් මස 26 වැනි දින උපත ලබන සෙනරත් පරණවිතාන, ගාල්ල බොනාවිස්ටා පාසලෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබන අතරතුර සිංහල, පාලි හා සංස්කෘත භාෂා අධ්‍යයනය මගින් තම ඉදිරි ගමනට දමා ගන්නේ ශක්තිමත් පදනමක්. වෘත්තියෙන් ගම්පහට නුදුරු උඩුගම්පොළ විදුහලේ ඉංග්‍රීසි උප ගුරුවරයකු වන ඔහු අනෙකුත් භාෂා සාහිත්‍ය ඥානය ඔස්සේ පුරාවිද්‍යා ගවේෂණ හා අභිලේඛන සංස්කරණ කටයුතුවල නියැළීම යි එම විශේෂත්වය.

එසේ ම පුරාවිද්‍යා ක්ෂේත්‍රය තුළ අභිලේඛන විද්‍යාව, නාණක විද්‍යාව, ප්‍රතිමා ලක්ෂණ විද්‍යාව හා කෞතුකාගාර විද්‍යාව පිළිබඳ තුන් වසරක ඉන්දියාවේ ලැබූ පුහුණුව ඔහු ලක්දිව විශිෂ්ටතම පුරාවිද්‍යාඥයා වීමට අඩිතාලම සැකසූ බව යි මහාචාර්ය කේ. එන්. ඕ. ධර්මදාස තම දේශනය තුළදී අවධාරණය කළේ. ප්‍රාචීන භාෂා අධ්‍යයනයත් සමඟ ලැබූ මේ දැනුම ඔස්සේ සෙනරත් පරණවිතාන මෙරට පමණක් නොව ලෝ පතළ විද්‍යාඥයකු බවට යි පත් වුණේ.



සීගිරි කුරුටු ගී

1923 වසරේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට එක් වන ඔහු 1926 වසරේ ඉන්දියාවේ පුහුණුවෙන් පසු ලක්දිවට පෙරළා පැමිණෙන්නේ පුරාවිද්‍යා කොමසාරිස්වරයාගේ "අභිලේඛන සහායක" තනතුරට පත්ව. ඉන් පසු ඔහු පුරාවිද්‍යා ක්ෂේත්‍රයට කළ මෙහෙවර අගයමින් 1940 වසරේ මෙරට ප්‍රථම පුරාවිද්‍යා කොමසාරිස්වරයා ලෙස පත් කරනු ලබන්නේ බ්‍රිතාන්‍ය සුදු අධිරාජ්‍යවාදීන් විසින් ම. එතෙක් එම පදවිය දරනු ලද්දේ බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින්.

සෙනරත් පරණවිතානයන්ගේ අසහාය ශාස්ත්‍රීය සේවාවට අන්තර්ජාතික වශයෙන්ද පිළිගැනීමක් ලැබුණු බව මහාචාර්ය කේ. එන්. ඕ. ධර්මදාස පෙන්වා දෙනවා. ඒ, 1936 වසරේදී නෙදර්ලන්තයේ ලේඩින් විශ්වවිද්‍යාලය විසින් ආචාර්ය (Ph.D) උපාධිය පරණවිතාන සූරීන්ට පිරිනැමීම. මෙහි විශේෂත්වය වන්නේ ඔහු විශ්වවිද්‍යාලයකින් ප්‍රථම උපාධිය ලබා නොසිටියත් ඉදිරිපත් කළ "The Stupa in Ceylon" නිබන්ධය ආචාර්ය උපාධිය පිරිනැමීම සඳහා සලකා බැලීමට එම විශ්වවිද්‍යාලය තීරණය කිරීම. ඒ, එම නිබන්ධයෙහි විශිෂ්ට ශාස්ත්‍රීය අගය හේතුවෙන්.

සෙනරත් පරණවිතානයන්ගේ සේවය තවදුරටත් පැහැදිලි කරන මහාචාර්ය කේ. එන්. ඕ. ධර්මදාස : "සැටවස් පිරුණු 1956 ඔක්තෝබර් 26 වැනි දින පුරාවිද්‍යා කොමසාරිස් ධූරයෙන් එතුමා විශ්‍රාම යන විට 1924 සිට 1956 තෙක් ලියා පළකොට තිබූ පොත්පත් හා ලිපි ලේඛන සංඛ්‍යාව අතිවිශාල යි. එක් තනි පුද්ගලයකු විසින් මේ සා විශාල ලේඛන සමුදායක් නිපදවිය හැකි දැයි අයකු තුළ විස්මය දැනෙන තරම්. විශ්‍රාම ගිය නොබෝ දිනකින් ම ලංකා විශ්වවිද්‍යාලය විසින් 1957 වසරේ ජනවාරි 01 වැනි දින සිට එතුමා එහි ප්‍රථම පුරාවිද්‍යා මහාචාර්ය පදවියට පත් කළා. එතැන් සිට 1965 දෙසැම්බර් 26 වැනි දින සැටපස් වියට පත් වන තෙක් එතුමා ලංකා විශ්වවිද්‍යාලයට ආභරණයක් වෙමින් එහි සේවය කළේ පුරාවිද්‍යා අධ්‍යයනාංශයක් ලක්දිව උසස් අධ්‍යාපන ආයතනයක පළමුවරට පිහිටුවීමේ පුරෝගාමී මෙහෙවර ද ඉටු කරමින්."

වංශ කතාවල සඳහන් පුරාවිද්‍යාත්මක නටබුන් සොයා ගැනීම, ජරාවාස වූ ඇතැම් ගොඩනැගිලි විද්‍යාත්මක ව තහවුරු කිරීම, මෙන් ම අභිලේඛන විද්‍යාඥයකු, පුරාවිද්‍යාඥයකු, ශාස්ත්‍රීය ලිපි ලේඛන සම්පාදකයකු ලෙස සෙනරත් පරණවිතානයන් ඉටු කළ මෙහෙවර විස්තර කළ නොහැකි තරම්. මහාචාර්ය කේ. එන්. ඕ. ධර්මදාස සිය දේශනයේදී අනාවරණය කළ පරිදි 1904 වසරේ ප්‍රථම පුරාවිද්‍යා කොමසාරිස් වූ එච්. සී. පී. බෙල් ගේ යෝජනාවක් අනුව පළ වූ ලංකා ශිලා ලිපි සංග්‍රහය (Epigraphia Zeylanica) සඳහා සෙනරත් පරණවිතානයන් පළ කළ ලිපි සංඛ්‍යාව 87ක්. ඔහු එම අභිලේඛන විඥානය ප්‍රකට කළේ 1929 වසරේ සිට 1964 වසර දක්වා එම ග්‍රන්ථයේ ප්‍රධාන සංස්කාරක ලෙස කටයුතු කරමින්. එසේ ම 1924 වසරේ "Ceylon Antiquary and Literary Register" සඟරාවට The Cholas and Ceylon ලිපිය ද "Ceylon Journal of Seience" සඳහා Epigraphical Sumary යනුවෙන් පුරාවිද්‍යා ගවේෂණ මගින් සොයා ගත් අභිලේඛන පිළිබඳ නිතිපතා විවරණ වාර්තාවක් ද ඔහු විසින් සම්පාදනය කළා. මේ අතර එතුමාගේ වැදගත් ම ශාස්ත්‍රීය සේවාවක් ලෙස සැලකෙන්නේ 1956 වසරේදී සීගිරි කුරුටු ගී (Sigiri Graffitti) ග්‍රන්ථය ප්‍රකාශයට පත් වීම. ඒ, ලංකා රජය වෙනුවෙන් මහා බ්‍රිතාන්‍යයේ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලය මගින්. එලෙස මෙරට නොව අන්තර්ජාතික විශ්වවිද්‍යාල ප්‍රකාශන ආයතනයන් මගින් එය පළ කිරීම මහාචාර්ය කේ. එන්. ඕ. ධර්මදාස පෙන්වා දෙන්නේ අපේ ජාතික උරුමයෙහි මහිමය සංසන්දනාත්මක ව දැකීමට ජාත්‍යන්තර විද්වතුන් පොළඹවන සත්ක්‍රියාවක් ලෙස. අට වැනි, නව වැනි, හා දස වැනි සියවස්වල ලියැවුණු කුරුටු ගී පිටුපස දීර්ඝකාලීන ව ගොඩනැගුණු සාහිත්‍ය සම්ප්‍රදාය මේ පිළිබඳ කරුණු පිරික්සන්නකුට වටහා ගැනීමට හැකිවනු ඇති බවත් ඔහු පෙන්වා දුන් කරුණක්.


මෙලෙස ඇගැයුණු සෙනරත් පරණවිතාන උපහාර උළෙලේදී මහාභාරකාර දෙපාර්තමේන්තුවේ මහභාරකාර නිතිඥ තරංගනී දිසානායක අවධාරණය කළේ වැදගත් කරුණක්. එනම්, මහාචාර්ය සෙනරත් පරණවිතානයන් පරිහරණය කළ යතුරුලියනය, උපැස් යුවළ වැනි මහාභාරකාර දෙපාර්තමේන්තුවේ ආරක්ෂා වී ඇති භාණ්ඩ රටේ ජනතාවට දකින්නට, අගය කරන්නට අවස්ථාවක් සලසාදීම අතිශයින් ම වැදගත් බව. මේ නිසා මේ භාණ්ඩ යකඩ පෙට්ටිවල යතුරු දමා ආරක්ෂා කිරීම වෙනුවට මහාභාරකාරත්වයේ තිබියදීම කෞතුකාගාරයේ හෝ සෙනරත් පරණවිතාන පදනමේ හෝ එසේ නැතිනම් සෙනරත් පරණවිතාන නමින් කෞතුකාගාරයක ඉදිරියේ ජනතාවට ප්‍රදර්ශනය කිරීමට අපේක්ෂා කරන බවයි ඇයගේ සඳහන.

එසේ ම 1971 වසරේ සෙනරත් පරණවිතානයන් ලියා ඇති අන්තිම කැමති පත්‍රයේ සඳහන් පරිදි ලංකාවේ පුරාවිද්‍යා අධ්‍යාපනයට දිරිදීමක් ලෙස සෑම වසරක ම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉතිහාසය හෝ පුරාවිද්‍යාව හෝ හදාරන ශිෂ්‍යයකුට සෙනරත් පරණවිතාන ත්‍යාගයක් පිරිනැමීමටත් මහාභාරකාර දෙපාර්තමේන්තුව කටයුතු කරනවා. එහෙත් මේ පිළිබඳ ව රටේ ජනතාව දැනුවත් ව නැති බවයි මහාභාරකාරවරිය සඳහන් කරන්නේ.

කෙසේ වෙතත් සෙනරත් පරණවිතාන 120 වැනි ජන්ම සංවත්සර උපහාර උළෙලට අනුව පෙනී ගියේ මෙරට පුරාවිද්‍යා ක්ෂේත්‍රයට අද්විතීය මෙහෙවරක් කළ මහාචාර්ය සෙනරත් පරණවිතාන සූරීන් පිළිබඳ ජනතාව අවදි කිරීමේ ඇති අවශ්‍යතාව මෙන් ම අනාගත පරපුරට එම උරුමය පවරාදීමේ ජාතික වැදගත්කම.

පී. ජ්. මාලා මල්කාන්ති

(මහාචාර්ය සෙනරත් පරණවිතාන සූරීන්ගේ 120 වැනි ජන්ම සංවත්සර උපහාර උළෙල ඇසුරින්)




# ගීතාංජලියේ

## අටවැනි පරිවර්තනය

**රවින්ද්‍රනාත්** තාගෝර් (1861 - 1941) පසුගිය සියවසෙහි ලොව පහළ වූ ශ්‍රේෂ්ඨතම කලාකරුවා ලෙස හඳුන්වා දෙන්නට පුළුවන්. ඔහු කවියෙක්, සංගීතඥයෙක්, චිත්‍ර ශිල්පියෙක්, ප්‍රබන්ධ කතාකරුවෙක්, (නවකතා - කෙටිකතා) නාට්‍ය රචකයෙක්. මේ සෑම කලා මාධ්‍යයකින් ම ඔහු විදහා පෑවේ ප්‍රතිභාවක්.

එපමණක්ද නොවේ. තාගෝර් දාර්ශනිකයකු, අධ්‍යාපනඥයකු, සෞන්දර්යවේදියකු ලෙසත් පිළිගැනෙනවා. 1913 දී තාගෝර්ට නොබෙල් ත්‍යාගය ලැබුණා. මේ ත්‍යාගය ආසියාතිකයකුට ලැබුණු ප්‍රථම අවස්ථාව මෙය වීම විශේෂ යි. මොහුට නොබෙල් තෑග්ග ලැබුණේ විශේෂයෙන් 'ගීතාංජලී' කෘතිය වෙනුවෙන්. නොබෙල් ත්‍යාගය ලැබීමට පවා ඉවහල් වූ 'ගීතාංජලී' ඔහුගේ ශ්‍රේෂ්ඨතම නිර්මාණය ලෙස විද්වතුන් සලකනවා. 1908 - 1910 අතර කාලයේ වංග බසින් ලියැවුණු මෙය තාගෝර් ම ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම විශේෂත්වයක්. නොබෙල් ත්‍යාග කමිටුව ගීතාංජලී අගය කළේ අතිගයින් සංවේදී, අපූර්ව හා සුන්දර යන වදන්වලින්.

තාගෝර් තෙවතාවක් ලංකාවට පැමිණ තිබෙනවා. ඒ, 1922, 1928 හා 1934 දී. මෙයින් 1934 ගමන අතිශය වැදගත්. අපේ බොහෝ කලාකරුවන්ට ශාන්ති නිකේතනයට ගොස් සංගීතය ඉගෙනීමට අනුබලයක් වුණේ ඒ ගමන.

සංගීතය කෙරෙහි ඇති කළ බලපෑමට සාපේක්ෂ ව තාගෝර් ප්‍රබන්ධ හා විශේෂයෙන් 'ගීතාංජලී' වැනි කාව්‍යයක් කෙරෙහි අපේ කලාකරුවන්ගේ අවධානය යොමු වූයේ අල්ප වශයෙන් යැයි පෙනෙනවා. තාගෝර් සාහිත්‍ය කෙරෙහි අප අවධානය යොමු කරන්නට පටන් ගන්නේ පනහ - හැට දෙදශකයේදී පමණ. විශේෂයෙන් ඌරාපොළ හේමාලෝක හිමි හා ධර්මදාස ගුණවර්ධන පරිවර්තනය කළ 'ගෝරා' නවකතාව වැනි කෘතිවලින්. එකල ම ඇඩ්වින් රණවක, ශ්‍රී චාල්ස් ද සිල්වා, විලියම් අල්විස්, සුදාස් මාස්තෝරාල, ජිනසෝම වීරසූරිය වැනි ලේඛකයන් ද තාගෝර්ගේ සාහිත්‍ය නිර්මාණ සිංහල බසට නැගුවා.

තාගෝර්ගේ 'ගීතාංජලී' විවිධ අර්ථ විග්‍රහයන්ට ලක් කළ හැකි කෘතියක්. එය දර්ශනය හා සෞන්දර්යය එක් වූ මොහොතක් වෙන්නත් පුළුවන්. කෙසේ වෙතත් වැඩි මතය එය මනුෂ්‍යත්වය හා සාමය පිළිබඳ විරචිත උත්කෘෂ්ට කාව්‍යයක් වන බව යි.

'ගීතාංජලී' මුල්වරට සිංහලට නැඟුණේ 1959 දී. ඒ, එච්. ඩී. ආනන්ද ගුණසේකරගේ 'ගීතාංජලී' සිංහල පරිවර්තනය. එදා මෙදාතුර 'ගීතාංජලී' හත්වතාවක් සිංහලට නැගී තිබෙනවා.

හෙට්ටිගේ බැස්තියන්ගේ 'ගීතාංජලී' පරිවර්තනය 1970 දී එළි දුටුවා. මේ පොතට පූජ්‍ය බඹරැන්දේ සිරි සීවලී හිමියන් අගනා ප්‍රස්තාවනාවක් ද ලියා තිබෙනවා. ප්‍රකට ගත්කරුවකු වූ කේ. බී. සුගතදාස 1984 දී 'ගීතාංජලී' සිංහලට නැගුවා. මෙය පරිවර්තනයකටත් වඩා සිංහලානුවාදයක් ලෙසට යි හඳුන්වා ඇත්තේ. 1984 දී පළ වුවත් මෙය ලියන ලදදේ 1946 දී බව පොතේ පෙරවදනේ කියැවෙනවා. ඒ, 'ගීතාංජලී' තුන්වැනි පරිවර්තනය.

මාධව වෛද්‍යරත්නගේ 'ගීතාංජලී' හතරවැනි සිංහල පරිවර්තනය ලෙස (1989) හඳුන්වා දෙන්නට පුළුවන්. එහෙත් මේ කෘතියට ඇතුළත් වන්නේ කවි 34ක් පමණක් බැවින් එය සම්පූර්ණ පරිවර්තනයක් ලෙස හඳුන්වා දෙන්න අපහසු යි. මේ කෘතිය සඳහා තාගෝර් කවියා හා 'ගීතාංජලී' යන මැයෙන් රත්න ශ්‍රී විජේසිංහ ලියූ ලිපියක මෙසේ සඳහන් වෙනවා.

"මාධව 'ගීතාංජලිය' සිංහලට නගන්නේ පදානුපදික ව නොවේ. සමස්ත කාව්‍යෝක්තිය සැලකිල්ලට ගනිමිනි. කවියාගේ ආධ්‍යාත්මික හා සෞන්දර්ය රීතියට ඇතුළුවන්නට මාධවට බොහෝ විට හැකි වන බව පෙනේ."

ඉහත පරිවර්තන හතර ම 'ගීතාංජලිය' සිංහලට නඟා ඇත්තේ ගද්‍ය ස්වරූපයෙන්. එය ප්‍රථම වතාවට පද්‍ය ස්වරූපයට නැඟූ අවස්ථා ලෙස කුසුම් දිසානායකගේ 'ගීතාංජලී' පරිවර්තනය (1992) සලකන්නට පුළුවන්.

මහාචාර්ය විනී විතාරණ ද 'ගීතාංජලී' සිංහලට පරිවර්තනය කළ අය අතර සිටිනවා. ඒ, 2004 දී. ඔහු මෙය පරිවර්තනය කර ඇත්තේ විරිත් සහිත ගී සැහැලි හා එළිසම පද්‍ය වශයෙන්.

දැනට ඇති අවසාන (හත්වැනි) 'ගීතාංජලී' පරිවර්තනය එඩ්මන් ජයසූරියගේ 'ගීතාංජලී'ය. වසර ගණනාවකට ඉහත පරිවර්තනය කර තිබුණා යැයි කියැවුණත් මෙය ප්‍රකාශනයට පත්වුණේ 2010 දී. මෙයට ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ 1960 දී මා හැඟි ප්‍රස්තාවනාවක් ලියා තිබෙනවා.

'ගීතාංජලී' අටවැනි සිංහල පරිවර්තනය මේ දිනවල සිදුකරමින් පවතින බව වාර්තා වෙනවා. ඒ, කැලණිය විශ්වවිද්‍යාලයේ හින්දි අධ්‍යයන අංශයේ මහාචාර්ය උපුල් රංජිත් හේවා විතාන ගමගේ අතින්. එය සෘජුව ම වංග බසින් කෙරෙන පරිවර්තනයක් වීම විශේෂ යි.

**සුනිල් මිහිඳුකුල**

# අතීත කතාවක සත්‍ය සටහන

# ආලෝකෝ උදපාදි

## ALOKO UDAPADI

### LIGHT AROSE



සිනමාව නොයෙක් ආකාරයෙන් භාවිත කරලීමේ අරමුණු හා බැඳුණු නාටක සිනමාකරුවන් පිරිසකගේ සම්ප්‍රාප්තියක් සිදුවෙමින් පවතී. කෙසේ වෙතත් සිනමාපට නිෂ්පාදනය මෙන්ම සිනමාපට ප්‍රදර්ශනය තරමක ව්‍යාකූල ස්වරූපයක් ගන්නා නිසා ඔවුන් විසින් සිදු කරනු ලබන මැදිහත්වීම් ප්‍රකට වන්නේ ප්‍රතිලාභකාරයෙන් ම නොවේ. ඉඳහිට ය. වරින්වර ය. විටෙක නිෂ්පාදක තීන්දු හා සිනමා ශාලා ඉඩකඩ ලැබෙන ප්‍රමාණයට ය.

"ආලෝකෝ උදපාදි" මඟින් සිනමා අධ්‍යක්ෂණයට අලුතින් ම එක්වන චත්‍ර වීරමන් හඳුනාගත හැක්කේ එබඳු සිනමාකරුවකු වශයෙනි. පළමු කොට ම ඔහු සමීර නාමවුන්නා හා විසාකේස චන්ද්‍රසේකරම් යන සිනමාකරුවන් සමඟ එක් වීමේ අධ්‍යාගයක් පෙන්නුම් කරයි. බැලූ බැල්මට නම් එය යම් ප්‍රතිවිරෝධතාවක් ජනිත කරන අදහසක් සේ පෙනේ. විශේෂයෙන් ම ඒ 'අලෝකෝ උදපාදි' හි මුහුණුවරට අදාළව ය. එහෙත් දෘශ්‍යමානය හා යථාර්ථය අතර පරතරයක් ද, නො පෑහීමක් ද තිබෙන්නට ඉඩ ඇති බව අමතක කළ යුතු නොවේ.

යථෝක්ත නව සිනමා පරපුරට සමකාලීන නාගරික පීඩිත තාරුණ්‍ය, සමකාමී සබඳතා, මැද පංතියේ කුටුම්භ ජීවිතය, මනෝ සංකීර්ණතා ආදිය විෂය වන අන්දම පෙනේ. චත්‍ර වීරමන් පෙනී සිටින්නේ අතීත රජ සමය නිරූපණය කිරීමේ අභිප්‍රාය සමඟිනි. රජ සමය, බුදු සමය හා ඊටත් පෙර සමය විෂය වූ සිනමාපට මාදිලිය ලාංකේය සිනමාව විෂයෙහි රජ කළ සමය ගෙවී යමින් ඇතැයි සිතේ. කිසියු සිනමාපට මාදිලියක් දිගු කලක් නොරැඳෙන බව සත්‍යයකි. එසේ හෙයින් චත්‍ර, අතීත රජ සමය විෂය වූ සිනමාපටයක් සේ 'ආලෝකෝ උදපාදි' සිනමා ප්‍රේක්ෂකාගාරය වෙත යොමු කිරීම කෙරෙහි සැලකිලිමත් විය යුතු ය. එසේ කළ යුතු වන්නේ අධ්‍යක්ෂවරයා පෙර කී සිනමාපට මාදිලිය වෙතින් ආ අරමුණු මතම රැඳී සිටින්නේ ද යන්න විමසා බැලීමට යි.

රජ සමය නිරූපණයේදී උපකල්පන සඳහා ඇති අවකාශය සුළු පටු නොවේ. ලිඛිත හෝ අලිඛිත ඉතිහාසය හා සත්‍ය අතර නිරතුරුව ම ගැටුම් ය. නිර්මාණකරුවකුට ස්වකීය පරිකල්පන ශක්තිය මෙහෙයවන්නට ද අවස්ථාව ලැබේ. එය පාරම්පරික විශ්වාස කිරීම් හා ගලපා ගැනීම කළ හැක්කේ දුර දිග බලන නිර්මාණකරුවකුට පමණි. එසේ ම ස්වකීය හැදෑරීම් ආශ්‍රිත ව සමීප වන කාරණා ද ඉස්මතු වන්නේ නිරායාසයෙනි.

'ආලෝකෝ උදපාදි' රැගෙන යන්නේ වර්ෂ දෙදහස් එකසියයකට පමණ පෙර පැතිර ගිය දේශපාලනික නොසන්සුන්තා උද්ගත වූ ඉසව්වකට ය. වලගම්බා රජු අනුරාධපුර පදනම් කොට ගෙන රාජ්‍යය විචාරයි. දකුණෙන් උපදින කැරලිකාරිත්වයකි. ඉන්දියාවේ සිට එන සොළී පාර්ශ්වය රාජ්‍ය බලය අල්ලා ගැනීමේ යුදමය හා සටකපට වැඩපිළිවෙළක ය. ඒ අතර මහා නියඟයකි. වලගම්බා රජු බලය අතහැර වනගත වෙයි. භික්ෂූන් වහන්සේලා ජීවිතය අතහැර යන්නේ එතෙක් මුඛ පරම්පරාගතව රැක ගත් බෞද්ධාගමික ඉගැන්වීම් අනතුරේ හෙළ මිනි. අවසන සියලු යුදමය හා සටකපට අභියෝග පරදවන වලගම්බා රජු සිය බලය තහවුරු කර ගනී. නොපමාව ම ඔහු තින්දු කරන්නේ බෞද්ධාගමික ඉගැන්වීම් ග්‍රන්ථාරූඪ කරන්නට ය.

මේ පුවත නිරූපණයේදී අධ්‍යක්ෂවරයා අනුගමනය කළ පිළිවෙත විමසීම අවශ්‍ය වේ. සිනමාපටයේ හැඩරුව තීරණය වන්නේ ඒ සමඟිනි. ඔහු තුළ අරමුණු ද්විත්වයක් වූ වග මූලිකව ම දක්නට ලැබේ. පළමු වැන්න වලගම්බා රජුගේ ද හිතකාමී රණශූර ප්‍රතිෂ්ඨාව ඔප් නැංවීම ය. දෙවැනි ව අසීරු අවධියක බෞද්ධාගමික ඉගැන්වීම් සුරකින්නට භික්ෂූන් වහන්සේලා ගත් බැරෑරුම් ප්‍රයත්නය ඔප් නැංවීම ය.

වලගම්බා රජු රාජ්‍ය බලය අත්හැර වනගත වන්නේ සොළී පාර්ශ්වය හා යුද වැදීමෙන් සිදු විය හැකි අති මහත් ජීවිත හානි ගැන ද සිතමිනි. එහෙත් පසු කලෙක ඔහු වඩා සංවිධානාත්මක ව සොළී පාර්ශ්වය හා යුද වදින්නේ ඇඩි ආත්ම විශ්වාසයකිනි. එහිදී ද ජීවිත හානි සිදු නොවනවා නොවේ. රජ සමය අතිශයෝක්තියෙන් ගෙන හැර පාන්නට සිදුවීමේ තත්ත්වයට අධ්‍යක්ෂවරයා මුහුණ දෙයි. මන්ද ඔහු දෙපා රඳවාගෙන සිටින්නේ වලගම්බා පාර්ශ්වයේ වන හෙයිනි. සොළී පාර්ශ්වය හා කැරලිකාර පාර්ශ්වය සමඟ ඔහු කිසිදු සම්මුතියකට නොයයි. නිර්මාණකරුවකු හැම විට ම විචාර හා තුලනාත්මක තලයක ජීවත් විය යුතු ම නොවේ. අධ්‍යක්ෂවරයාගේ තෝරා ගැනීමේ අයිතිය උල්ලංඝනය කිරීම අනුචිත ය. තිර නාටකය ඔහුට අවැසි මඟ පිළිබඳ ඉඟි පළ කරන්නේ කිසිදු හා හුවකින් තොරව ය.

අන්තිමේදී වලගම්බා රජු ඉස්මතු වන්නේ වීරයකු සේ ය. සොළී පාර්ශ්වයේ නායකයන් මෙන් නොව වලගම්බා රජු සිරුරෙන් කුඩා අයෙකි. එහෙත් රණ ශූරත්වය හා උපායශීලී බව මිනිය හැක්කේ ශරීර ශක්තියෙන් ම නොවේ. ඉවසීම ප්‍රගුණ කිරීම ද මෙහිලා වැදගත් ය. හැම ඓතිහාසික මූලාශ්‍රයක් ම වලගම්බා රජුගේ ජයග්‍රහණය වාර්තා කරන්නේ උද්දාමයෙනි. අධ්‍යක්ෂවරයාට ද ඉන් පරිබාහිර පියවරක් ගැන නොසිතෙන තරම් ය. වලගම්බා රජ සමයේ ජන ජීවිතය ඔහුට විෂය නොවෙයි. එසේ විෂය වූයේ නම් අන් දෘෂ්ටියකින් සිනමාපටයේ තේමාව තුළ ගන්වන තැනකට යා හැකිව තිබිණ.

ඉහත කී සමයේ පැතිර ගිය මහා නියඟයට ප්‍රතිපක්ෂ ව භික්ෂූන් වහන්සේලාගේ අධිෂ්ඨානශීලී කැපවීම සමීප රූප මස්සේ ම නිරූපණයට උත්සුක වූ සැටියක් පෙනේ. මෙහිලා භික්ෂූන් වහන්සේලාට ජීවිතය හා මරණය අතර බිහිසුණු අරගලයක නිරත වන්නට ද සිදු වූ බව කියැවේ. එක් පසෙකින් නියඟය යි. අනෙක් පසින් සොළී පාර්ශ්වයේ තර්ජනයි. සෘජු ව හා වක්‍ර ව වලගම්බා රජුගේ පුනරාගමනයට සවියක් වනු පිණිස ද භික්ෂූන් වහන්සේලා උත්සුක වෙති. උපැවිදි ව යුද පිටියට අවතීර්ණ වන තරුණ භික්ෂූන් වහන්සේලා ද ප්‍රේක්ෂකයාට මුණගැස්වයි. වලගම්බා රජුගේ දේශපාලන ජයග්‍රහණයට නො දෙවැනි ජයග්‍රහණයක් බෞද්ධාගමික ඉගැන්වීම් රැකගනිමින් භික්ෂූන් වහන්සේලා ලද බව සිනමාපටය පවසයි. වීරත්වය භික්ෂූන් වහන්සේලාට ද හිමි ය.



මේ අරමුණු ද්විත්වය ප්‍රකාශයට පත්කරන විලාසය මඟින් සිනමාපටයේ හැඩරුව විද්‍යමාන වේ. වලගම්බා රජුගේ හා භික්ෂූන් වහන්සේලාගේ වීරත්වයත්, සොළී පාර්ශ්වයේ හා කැරලිකාර පාර්ශ්වයේ ප්‍රචණ්ඩකාරී බවත් නිරූපණය කරන අධ්‍යක්ෂවරයා ඊට ඔබ්බෙන් සනිටුහන් කරන්නේ ඇවැන්ත පසුතල ය. දහස් සංඛ්‍යාත නළු නිළියන් ය. උණුසුම් යුද ගැටුම් ය.

මෙතැනදී නිශ්චිත ඓතිහාසික තත්ත්වයන් නිසි පරිදි නිරූපිත ව තිබේ දැයි යන ප්‍රශ්නය පැන නඟින්නට පුළුවන. රජ මාළිගා, වස්ත්‍රාභරණ, අවි ආයුධ, අසුන් පරිහරණය, නෞකා, යුද ගැටුම් මේ ප්‍රශ්නය තුළ පවතින සාධක ය. අධ්‍යක්ෂවරයා මෙතැනදී කිසියම් විචාර හැසිරීමක් ප්‍රකට කරන්නේ යැයි සිතේ. මහාවංශය හෝ වෙනත් මූලාශ්‍ර ද, පුරාවිද්‍යාත්මක සොයා ගැනීම් ද පසුපසම දිවයන්නට අධ්‍යක්ෂ අදහස් නොකරයි. ඔහුගේ අධ්‍යාශය සේ අවසනදී දැක්වෙන්නේ වලගම්බා රජුගේ හා භික්ෂූන් වහන්සේලාගේ වීරත්වයත්, සොළී පාර්ශ්වයේ හා කැරලිකාර පාර්ශ්වයේ බිහිසුණු බවත් පරයා ගිය උද්වේගකර සිනමාපටයක් නිර්මාණය කිරීම ය.

මහාවංශය බඳු මූලාශ්‍ර හා පුරා විද්‍යාත්මක සොයා ගැනීම් මත ම නොරැඳෙන නිසා අත්වන නිදහස උපරිම ව භාවිත කරන අයුරු පෙනේ. එහෙත් එය සීමාව ඉක්ම වූ නිදහසක් භුක්ති විඳින තැනකට ගමන් නො කරයි. බොහෝ සිනමාපට නැරඹූ ප්‍රේක්ෂකයකුට නම් 'ආලෝකෝ උදපාදි'හි ප්‍රකාශන විලාසය හුරු පුරුදු ය. යටත් ජවනිකා බටහිර වීර වික්‍රමාන්විත සිනමාපට ද මොහොතකට හෝ සිහිපත් කරයි. සංස්කරණයේදී හා කැමරාකරණයේදී ඒ බව ජනිත වන්නේ ය යන්න කිව යුතුය. තිරනාටකයේ මහා මැදිහත්වීමක් නොමැති තැන සංස්කරණය හා කැමරාකරණය කැපී පෙනීම අරුමයක් නොවේ.

සිනමාව වරින් වර අර්බුදකාරී අවස්ථා කරා ඇදී යන්නේ විවිධත්වය යන්න ප්‍රමාණවත් පරිදි සාක්ෂාත් නොවන පසුබිමක ය. සිනමාව කලාත්මක - සම්භාවනීය හා විවාදාත්මක ප්‍රකාශන කාර්යයක් සේ භාවිත කරලීමට නො පැකිලෙන චතුර ද අයත් පාර්ශ්වය එම විවිධත්වය යන අවශ්‍යතාව කෙරෙහි කෙතෙක්දුරට සැලකිලිමත් වූයේ ද යන්න දැන් ම කිව හැකි නොවේ. එහෙත් චතුරගේ මේ ප්‍රවිෂ්ටය ඒ කෙරෙහි ධනාත්මක බලපෑමක් කරන්නට හැකි කරන අයුරු නම් පැහැදිලි ය.

තුසිත ජයසුන්දර

# හැට පැන්නත් වටින වැඩක්

# වසර 60ට පසු මනමේ රේඛාව ඉදිරි පරපුරටත්





මෙරට සිනමාව සංරක්ෂණය කිරීමේ විධිමත් වැඩපිළිවෙළක අවශ්‍යතාව වසර ගණනාවක් මුළුල්ලේ ම යෝජනා වෙමින් තිබෙන්නක්. අප මහා සිනමාවේදී ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් පවා මේ බව බලධාරීන්ගෙන් ප්‍රසිද්ධියේ ඉල්ලා සිටියේ චිත්‍රපට සංරක්ෂණ වැඩ පිළිබඳ වැදගත්කම හා අවශ්‍යතාව එකතු කරමින්. එහෙත් එයට විධිමත් රාජ්‍ය වැඩපිළිවෙළක් ඇතිවූයේ නැහැ. එහෙත් ලෙස්ටර්ගේ ප්‍රථම වෘත්තාන්ත චිත්‍රපටය වන රේඛාව චිත්‍රපටයට හැට වසරක් පිරීම නිමිත්තෙන් අග්‍රාමාත්‍යවරයාගේ අදහසකට අනුව 'රේඛාව' චිත්‍රපටය **DCP (Digital Cinema Prosses)** තාක්ෂණයට පරිවර්තනය කර 2017 ජනවාරි 29 වැනි දින රීගල් සිනමා ශාලාවේ ප්‍රදර්ශනය කිරීම වැදගත් කර්තව්‍යයක් ලෙස සැලකීමට පුළුවන්. මෙය රේඛාව චිත්‍රපටය සංරක්ෂණය කිරීමක් ද වෙනවා.

ලෙස්ටර්ගේ රේඛාව චිත්‍රපටය මෙන්ම, මහාචාර්ය සරත්චන්ද්‍රගේ මනමේ නාට්‍යය ද වේදිකාගත වී 60 වසරක් ගතවූයේ පසුගිය වසරේ නොවැම්බර් 3 වැනි දා. මනමේ ප්‍රථම දර්ශනය 1956 නොවැම්බර් 03 වැනි දින කොළඹ ලයනල් වෙන්ඩ්ට් රඟහලේදී වේදිකාගත වූ අතර 60 සපිරෙන දා ද ලයනල් වෙන්ඩ්ට් රඟහලේදී ප්‍රදර්ශනය කෙරුණා. ජී. ටවර් රඟහල පදනම අනුග්‍රහයෙන්. මනමේ සහ රේඛාවට වසර 60ක් සපිරීම පිළිබඳව වූ පසුබිම පිළිබඳ වාර්තාමය වැඩසටහනක් නිෂ්පාදනය කිරීමේ කටයුත්ත සිදු කළේ ජාතික රූපවාහිනිය විසින්. එය ඔවුන් ජාතික කටයුත්තක් සේ සලකා ඉටු කිරීම ප්‍රශංසනීය යි.

මනමේ වේදිකා නාට්‍යයත්, රේඛාව සිනමාපටයත් සංරක්ෂණය කොට ප්‍රේක්ෂකයාට මනමේ නාට්‍යය සහ රේඛාව චිත්‍රපටය ලඟන යා යුතු ය යන අදහස ඉදිරිපත් කරන්නේ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ විසින්. රේඛාව චිත්‍රපටය මුල් වරට පෙන්වා තිබෙන්නේ 1956 වසරේ දෙසැම්බර් 28 වැනි දින රීගල් සිනමා ශාලාවේදී. ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතාගේ කැමැත්ත වුණේ 2016 එම දින ම 'රේඛාව' රීගල් සිනමාහලේදී ප්‍රදර්ශනය වීම. එහෙත් වසර අවසානය හා නත්තල් සමය වීම නිසා වැඩි ප්‍රේක්ෂක පිරිසකට නැරඹීමේ අවස්ථාව අහිමි වන නිසයි 2017 ජනවාරි 29 වැනි දින එය ප්‍රදර්ශනය කිරීමට තීරණය කළේ. මේ පිළිබඳ අදහස් දක්වන ටවර්හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජනරාල් ලයනල් ප්‍රනාන්දු : "මනමේ සහ රේඛාව යන නිර්මාණ ද්විත්වය ම එළි දක්වා වසර 60ක් ගත වුවත් එම නිර්මාණ ඉදිරි පරපුරට ජාතික දායාද වශයෙන් සංරක්ෂණය කිරීමේ වැදගත්කම අවබෝධ වුණේ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාට පමණ යි. මෙහිදී එක් කාරණයක් පිළිබඳ මා තුළත් යම් කුතුහලයක් පවතිනවා. එනම්, ටවර්හෝල් රඟහල පදනම නාට්‍යය සඳහා ම වෙන්වූවක් නිසා 'මනමේ' මේ පදනම මඟින් කළ හැකි වුවත් 'රේඛාව' වැනි චිත්‍රපටයක් ටවර්හෝල් රඟහල පදනමට ලබා දුන්නේ කුමක් නිසා ද යන්න. කෙසේ වුවත් මේ නිර්මාණ සර්වකාලීන කිරීම යි අපගේ ප්‍රයත්නය."

**Digital** තාක්ෂණය යටතේ රේඛාව **සංරක්ෂණය කිරීමේ කටයුතු සිදු කෙරුණේ ඉන්දියාවේදී. ජාතික චිත්‍රපට සංස්ථාව මේ සඳහා ඩිජිටල් තාක්ෂණය ඔස්සේ දොරට වැඩීම සඳහා ලෙස්ටර්ගේ චිත්‍රපට අතුරින් "රේඛාව" තෝරා ගැනීම මේ සිනමාවේදියාට කරන ගෞරවයක්. රේඛාව චිත්‍රපටයට සම්බන්ධ වූ ශිල්පීන්ගෙන් සැලකිය යුතු නිර්මාණ ශිල්පීන් පිරිසක් ජීවත්ව සිටියදී ම 'රේඛාව' පෙන්වීමට ලැබීම අප ලද භාග්‍යයක්. ලෙස්ටර් ජේම්ස් පීරිස්, ආනන්ද වීරකෝන්, මල්ලිකා පිලපිටිය, ඉන්ද්‍රානි සේනාරත්න, ලතා වල්පොළ, අයිරාංගනී සේරසිංහ යන අය ඒ අතරින් ප්‍රධාන යි.**

සිලෝන් තියටර්ස් ආයතනයෙන් ලංකාවේ සිනමාවට සැලකිය යුතු දායකත්වයක් ලැබුණා. කේ. ජේ. ඩබ්. ජයමාන්නට අමතර ව මෙරට සිනමා ක්ෂේත්‍රයේ සිටියේ නායගම්, ගුණරත්නම් වැනි ද්‍රවිඩ ජාතිකයන්. නැවතත් දෙසතිය අමතන ලයනල් ප්‍රනාන්දු "මේ වසරේ දී (2017) අපගේ ප්‍රමුඛ අදහසක් වන්නේ ලේක්හවුස්, සංචාරක හෝටල්, සිලෝන් තියටර්ස් මූලස්ථානය යන ආයතන ආවරණය වන පරිදි සිනමා කලාපයක් බිහිකිරීම.

ඒ සමඟ ම අගමැතිතුමාගේ තවත් සංකල්පයක් බවට පත්ව තිබෙන්නේ ලුම්බිණි රඟහල, ජෝන් ද සිල්වා සමරු රඟහල, නෙළුම් පොකුණ රඟහල, නව රඟහල, නවනගර ශාලාව, එල්ෆින්ස්ටන් රඟහල, ටවර් රඟහල යන සියල්ල ම එකතු කොට සංස්කෘතික මධ්‍යස්ථානයක් ඇති කිරීම. මේ වන විටත් ඒ සඳහා **Colombo Cultural Hub** නමින් නම යෝජනා වී තිබෙනවා. ඒ සඳහා පත් කර තිබෙන කමිටුවේ සාමාජිකයකු වශයෙන් මා ද ක්‍රියා කරනවා. මේ වන විට එයට අවශ්‍ය නීතිමය පදනම සකසා ක්‍රියාත්මක වෙමින් පවතිනවා."

ටවර්හෝල් රඟහල පදනම පනතේ එක් වැදගත් පරමාර්ථයක් ලෙස සඳහන් වන්නේ ජනතාවගේ රසඥතාව ඇති කිරීම සහ දියුණු කිරීම. වසර 60කට පසු ව මේ නිර්මාණ නැවතත් ජනතාවට නැරඹීමට සැලැස්වීම හා නූතන පරම්පරාවට ඒවා නැරඹීමට අවස්ථාව ලබා දීම ඉතා වැදගත් කර්තව්‍යයක් ලෙස සැලකීමට පුළුවන්.

නිලුපුල් ප්‍රියංකර පෙරේරා

# නැතුව බැරි මිනිහෙක්

## *A man much needed*





"ආණ්ඩුවකට නැතුව බැරි මිනිහෙක් වෙනවා කියන එක හිතන තරම් ලේසි නෑ පුතා. උන්ට මාව ඕන නැති දවසට මට යන්න වෙනවා හිරේ'' රාජිත දිසානායකගේ අලුත්ම වේදිකා නාට්‍ය නිර්මාණයක් වන ''නැතුව බැරි මිනිහෙක්''හි ප්‍රධාන චරිතය යයි කිවහැකි ජයන්ත (ධර්මප්‍රිය ඩයස්) කියයි. බැලූ බැල්මට කෙතරම් සරල වැකියක් යයි කිවහැකි වුව ද මේ මොහොතේ දේශපාලනයේ අව්‍යාජ ප්‍රකාශනය පමණක් නොව එය සරල වන තරමට ම ලාංකික සමාජ සත්තාව තුළ සංකීර්ණ ක්‍රියාදාමයක ඛේදවාචකය ප්‍රේක්ෂකයාට අභිමුඛ කරවයි. රාජිතගේ මෑත කාලීන නාට්‍ය නිර්මාණවල විශේෂයෙන් ම "ආපසු හැරෙන්න බෑ", "ඛකමුණා වීදිබසියි" වැනි නාට්‍යයන්හි ප්‍රස්තුතය වූයේ තත්කාලීන දේශපාලනය යි. නවතම නාට්‍ය නිර්මාණය ද මේ ක්‍රියාදාමයේම දිගුවක් බැව් කිවහැකි ය.

2015 ජනවාරි 08 වනදායින් පසු ව ලාංකික භූ දේශපාලනය තුළ බොහෝ වෙනස්කම් වේ යයි බොහෝ දෙනා කල්පනා කළහ. සාපේක්ෂ වශයෙන් යම් යම් සුබවාදී වෙනසක් සඳහා ප්‍රවේශයන් අත්දැකිය හැකි වුව ද ජනයා බලාපොරොත්තු වූ තරමේ කාර්යක්ෂමභාවයක් දකින්නට නොලැබිණි. ජනතාව විසින් ප්‍රතික්ෂේප කළ දේශපාලන චරිත ජාතික ලැයිස්තුවෙන් යළි පාර්ලිමේන්තුවට තේරී පත්වූවා පමණක් නොව ඔවුන්ට අමාත්‍ය ධුර පවා හිමිවිය. වෙනත් අයුරකින් දක්වතොත් වෙනස් මුහුණු වෙනුවට පැරණි මුහුණු ම යළි ප්‍රාදුර්භූත විය. මේ නාට්‍යයේ ප්‍රධාන චරිතය රංගය හෙවත් ව්‍යාපාරික ජයන්තගේ සහාය දිනාගන්නා දේශපාලනඥයා ද (වේදිකාව තුළ දක්නට නොලැබෙයි.) මීට පෙරාතුව ආණ්ඩුවේ ප්‍රබල අමාත්‍යවරයකු ලෙස කටයුතු කොට පසු ව මැතිවරණයෙන් පරාජය වුව ද පවත්නා ආණ්ඩුවට ගේත්තු වී යළිදු අමාත්‍ය ධුරයක් ලබාගනියි. මූලාරම්භයේදී ජයන්තට ද තම නායකයා කෙරෙහි පවත්නේ අප්‍රසාදයකි.

"යකෝ පැරදිලත් මූන් දිනුම්. හොඳ වෙලාවට මූන් ක්‍රිකට් කවුන්සිලයේ නැත්තේ. එහෙම වුණානම් අවුට් වෙච්චි උන් ආයෙම බැට් කරන්න කැඳවනවා." ජයන්තගේ ඉහත ප්‍රකාශය තුළ ඇති සරදම් සුළු කොට තැකිය නොහැකි ය. ඉකුත් පාලන තන්ත්‍රය සමඟ සමීපව කටයුතු කළ බොහෝ දෙනකුට පසු කාලීනව පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසය වෙත නිතර කැඳවීම් ලැබෙයි. මේ කැඳවීම්වලින් රජයේ ප්‍රකාශකයන් විසින් තමන්ගේ පාර්ශ්වීය ප්‍රකාශය ද, කැඳවීමට ලක්වූ තැනැත්තා තමා කැඳවූ සැබෑ හේතුව හෝ නොකියා එය දේශපාලන පළිගැනීමක් වන්නේ කෙසේදැයි තහවුරු කිරීමට කරනු ලබන ප්‍රකාශය ද, ප්‍රසිද්ධ මාධ්‍යයට වැදගත් ය. අවසානයේ ඉතිරිවන්නේ මාධ්‍ය සංදර්ශන මිස කිසිවක් නොවේ. එහෙත් ඒ සියල්ල අතරේ පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසය වෙත කැඳවනු ලබන්නන් තමන් එසේ කැඳවීම තුළින් තමන් විසින් කාලයක් තිස්සේ උපයා ගනු ලැබූ සංකේතීය බලය **(Symbolic Value)** විනාශ වී යා නොදීමට කුමක් හෝ ගනුදෙනුවකින් ප්‍රශ්නය ගොඩින් බේරාගැනීමේ ක්‍රියාදාමයකට තල්ලුවෙයි. එහෙත් ජනතාවට කොළේ වසා ගසන මේ සූදුවට හෙට්ටු කිරීමේ බලය හිමිවන්නේ ජනතාවගෙන් ම ය. ලංසුවට තබන්නේ ජනතාව ය. විකිණෙන්නේ ජනතාව ය. දහස් ගණන් කැටුව පාදයාත්‍රා සංවිධානය කොට ප්‍රසිද්ධ මාධ්‍යයට ප්‍රකාශ ලබාදෙමින් ''පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසය විසුරුවන ලෙස'' ආණ්ඩුවට බලකරන බව කීමට ලජ්ජා නොවන්නේ ද, ඒ නිසාම ය. රට නොව තමා ය. තම පවුල ය. රටක් යනු සීමා සහිත සමාගමක් නොවන බව මොවුන් නොදන්නේ තමන් එය සමාගමක් ලෙස සිතා කටයුතු කළා විනා රටක් ලෙස සිතා කටයුතු නොකළ නිසා ම ය. මේ අයුරින් ජාතික මට්ටමේ ඊනියා නායකයන් පාදයාත්‍රා සෙනඟ පෙන්වා තමාට හෝ තම පවුලට එරෙහි ව සිදු කෙරෙන පරීක්ෂණ නවත්වන ලෙස සෘජුව ම වගකිවයුත්තන්ට බලකරන විට ප්‍රාදේශීය මට්ටමේ හෙංචයියන්ට අවශ්‍ය වන්නේ සමූපකාර ඡන්දයක, වෙළෙඳ බලමණ්ඩලයක හෝ සභාපති ලෙස වැඩි ඡන්දයෙන් පත්වෙන්නටය. මේ නාට්‍යයේ ජයන්ත ද, "ලොක්කට තිබෙන්නේ පක්ෂෙන් අයින්වෙන්න නෙවෙයි පවුලෙන් අයින් වෙන්න'' කියා ප්‍රසිද්ධියේ ම කියන්නේ හිටපු පාලකයකුට බැව් පැහැදිලිය. එලෙස කියන ජයන්ත ද උත්සාහ කරනු ලබන්නේ "සිංහල වෙළෙඳ බලමණ්ඩලයේ" සභාපති වෙන්නටය. සභාපතිවීද, නොවීද යන ගැටළුව නොවිසඳී තිබියදී වුව හෙතෙම තමන්ගේ දේශපාලනඥයා කටයුතු කළා සේ ම සාර්ථක ඩීල් එකකින් පවත්නා පාලන තන්ත්‍රයට ම ගේත්තු වෙයි. එවිට මූලාරම්භයේ පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසය හමුවේ පෙනී සිටින ලෙස නියෝග කරන ලද ලිපිය රැගෙන පැමිණි පොලිස් නිලධාරියා ජයන්තගේ සුවච කීකරු ගෝලයෙක් බවට රූපාන්තරණය වෙයි. රාජිත දිසානායකගේ බොහෝ නාට්‍ය නිර්මාණ සේ ම මේ නාට්‍ය නිර්මාණයේ ද කූඨ ප්‍රාප්ති අවසානය "පොල්ලකින් හිසට තඩි බෑවා සේ'' ප්‍රේක්ෂකයා තිගැස්මකට ලක්කරයි. එසේ ම එය තවත් එක් අවසානයක් බවට සනිටුහන් නොකොට ජයන්තලා සේ ම කටයුතු කරන බොහෝ නායකකාරකාදී දැවැන්තයන්ට වැරදිය හැකි තැන් පිළිබඳව ද ඉඟි පළ කරනු ලබයි.

තමාට අභියෝගයක් විය හැකි, තමාව අභියෝගයට ලක්විය හැකි අවස්ථාව කිසිසේත්ම උදාවිය යුතු නැතැයි තරයේ විශ්වාස කරන ජයන්ත අවසන් වරට

මත්පැන් වඩියකින් සැහැල්ලුවීමට උත්සාහ දරන අවස්ථාවේදී ඔහු තම හෙංචයියා වන ඥාති කරුට කියන්නේ මෙවැන්නකි. "කාට මොනාව වෙනාවද කියන එක මට අදාළ නෑ. ඒත් අපේ එවුන්ට මොකුත් නොවන බව මට විශ්වාසයි'' හෙතෙම අවධාරණය කරයි. එහෙත් සිදුවන්නේ එය නොවේ. නගරයේ ප්‍රසිද්ධ උපවාසය ළග වේදිකාවේ ප්‍රකාශය සිදුකරන්නේ කවුරුන් වුවද එය සිදුනොවිය යුතු තැනට කටයුතු කරන ලෙස උපදෙස් දී (දුර සිට වෙඩි තබා ඝාතනය කරන ලෙස යයි ඇඟවෙයි) බලා සිටින ජයන්තට නිවසේ රූපවාහිනී යන්ත්‍රයෙන් දැකබලා ගැනීමට හැකිවන්නේ එම ප්‍රකාශය සිදුකරන්නේ තමාගේම දියණිය බවයි. තනි තනි පුද්ගලයා තම පවුල, තම ගුරු කුලය, තම දේශපාලන කණ්ඩායම ආදී වශයෙන් 'පෞද්ගලිකත්වය' කෙතරම් දුරට ප්‍රසාරණය වුවද, ඉන් පරිබාහිරත්වය සතුරා බවට පත්කොට තමාගේ ආරක්ෂාව සලසා ගැනීමට නිරන්තරයෙන් අවධානය යොමු කරයි. සමාජයට, රටට හෙණ ගැහුවද, තමාට ගැටලුවක් නොවන්නේ යයි තරයේ විශ්වාස කරයි. එහෙත් පුද්ගලයන් යනු ඕපපාතිකයන් විශේෂයක් නොව සමාජ සබඳතා ජාල සමූහක කොටස්කාරයන් පමණක් බවත්, එම ජාලයන්හි තමන්ගේ චලනයන්සේම තවත් අයගේ චලනයන්ද, තීරණාත්මක බවත්, කොටින්ම විෂය බාහිර තමාගෙන් ස්වායත්ත වූ අමුතු සමාජයක් දක්නට නොමැති බවත් මෙම 'නැතුව බැරි මිනිහෙක්'නාට්‍ය නිර්මාණය තුළ මනාව සාකච්ඡාවට ලක්කෙරෙයි.

රාජිතගේ මීට පෙර නාට්‍ය නිර්මාණ වන 'වීරයා මැරිලා', 'හංසයින්වත් මං ආසයි', 'ආපසු හැරෙන්න බෑ', බකමූණා විදි බසියි' වැනි නිර්මාණ සමග සසඳා බලන විට එම නිර්මාණවල දෘෂ්ටිවාදී කරුණු, ශෛලාත්මක හරය ගැඹුරු දාර්ශනික ප්‍රවේශය කරා ප්‍රේක්ෂකයා පොළඹවන අවස්ථා බහුල ය. එහෙත් නවතම නාට්‍ය නිර්මාණය තුළ කළු චරිත කළු ලෙස, සුදු චරිත සුදු ලෙස, එදිනෙදා අප ජනමාධ්‍යයන්ගෙන් අසන, දකින, කියවන ප්‍රවෘත්ති හා සංසිද්ධි කෙරෙහි වැඩි නැඹුරුවකින් යුතුව නාට්‍ය විකාශනය වීමත් මිස එහි ව්‍යුහාත්මක ගැඹුරක් ස්පර්ශය වන බවක් නොපෙනේ. එහෙත් ඇගේ හැපුණිද, ලාංකිකයාට සමාජ යථාර්ථය අභිමුඛවීම් දුර්ලභ බැවින් මෙම නාට්‍යය එවැන්නකට ආදර්ශයක් වීම අප විසින් අගය කළ යුතුය.

**ප්‍රියාන් ආර්. විජේබණ්ඩාර**

**ක්‍රීඩා**

# JAPAN EXPO premier SRI LANKA ජපානයේ සුමෝ සංදර්ශනය

සුමෝ ක්‍රීඩාව ජපානයේ ජාතික ක්‍රීඩාව යි. වසර දහසක පමණ ඈත ඉතිහාසයක් සුමෝ ක්‍රීඩාවට හිමි වී තිබෙනවා. අස්වැන්න හා ආහාර වෙනුවෙන් කරන ස්තුති පූජාවලට ද මේ ක්‍රීඩාව සම්බන්ධ යි. එ බැවින් ක්‍රීඩාවේදී පැරණි සිරිත් විරිත් අනුගමනය කරනවා. පුරාණ වීරයන්ගේ ස්වරූපයට විශේෂ කොණ්ඩා සැරසිල්ලකින් සැරසෙන සුමෝ ක්‍රීඩකයන්ගේ ඇඳුම, සේද ඉනපටියක් පමණ යි.

ඔවුන් සටන් වදින්නේ දෑඅත්වලින් පමණ යි. එක් ක්‍රීඩකයකුගේ බර කිලෝ ග්‍රෑම් 100 - 200ක් පමණ වෙනවා. සුමෝ ක්‍රීඩාවට ජපානයේ පමණක් නොව විදේශ රටවල ද අවධානය යොමු වී තිබෙනවා. 2017 පෙබරවාරි 03 වැනි දින සිට 05 වැනි දින දක්වා පැවැත්වෙන ජපන් ශ්‍රී ලංකා එක්ස්පෝ - 2017 (Japan Sri Lanka expo - 2017) ප්‍රදර්ශනයට සමගාමී ව ජපානයෙන් පැමිණි සුමෝ ක්‍රීඩකයන් සහභාගී වන සංදර්ශනයක් බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණශාලාවේදී පැවැත්වෙනවා. ඊට අමතර ව ජපන් සාම්ප්‍රදායික සමුරායි නැටුම් ද පැවැත්වෙනවා (TAKARA BUNE - ජපන් තයිකෝ හා නැටුම්).

මේ ප්‍රදර්ශනයේ සමාරම්භක උත්සවයට ඔෂින් ටෙලි නාට්‍යයේ තරුණ ඔෂින්ගේ චරිතයට පණ පෙවූ Ayako Kobayashi පැමිණීම ද විශේෂත්වයක් බව ජපන් තානාපති කාර්යාලය මාධ්‍ය හමුවකදී පවසා සිටියා.

**සුමිත් මායාදුන්නේ**









# ජගත් පුවත් රටා

ඡෝමා පාඨ - **ධර්මදාස ගමගේ**




ගිරි දුර්ග, වන දුර්ග, ගංගා ඇළ දොළ තරණය කරමින් චීනයේ සිට එංගලන්තයට ඉතිහාසයේ ප්‍රථම වරට 2017 ජනවාරි 18 වැනි දා දුම්රියක් පැමිණියේ පැරණි "සේද මාවත" සිහි ගන්වමින්. චීනයේ සෙයිජියංග් ප්‍රාන්තයේ තොග වෙළෙඳ නාගරයක් වන යීවූ හි සිට වෙළෙඳ බඩු පුරවා ගෙන, කසකස්ථානය, රුසියාව, බෙලරුස්, පෝලන්තය, බෙල්ජියම් මස්සේ ප්‍රංශයට පැමිණ ඉංග්‍රීසි ඕඩය හරහා වැටී ඇති මුහුදු උමං මග තුළින් ලන්ඩනයේ බාර්කිං නගරය වෙත සැතපුම් 7500ක් දුර ගෙවා ළඟා වීමට එයට ගත වූ කාලය දින 18ක්. මේ දුම්රියෙන් ප්‍රවාහනය කැරුණු බඩු තොගය මුහුදු මඟින් ප්‍රවාහනය කැරුණේ නම් ගත වන කාලය දුම්රියෙන් මෙන් දෙ ගුණයක්.

2013 දී චීන ජනාධිපති ෂි ජින්පින් විසින් හඳුන්වා දුන් "වන් බෙල්ට්, වන් රෝඩ්" සංකල්පය යටතේ ඍජු දුම්රිය සම්බන්ධතා ඇති කර ගත් යුරෝපයේ 15 වැනි නගරය බවට යි ලන්ඩනය පත් වුණේ.



කාලගුණික වෙනස්කම් මේ වන විට මුළු ලෝකය විසින් ම දරුණු ලෙස අත්දකින්නක්. මෙවර සීත සෘතුව විසින් යුරෝපයට දඬුවම් කරන ලද්දේ දැඩි හිම පතන සහ හිම කුණාටු මඟින්.

මධ්‍යම ඉතාලියේ "රිගෝපියානෝ" නම් වන සුඛෝපභෝගී තෙමහල් හෝටලය මොහොතකින් බිමට ඇද ගෙන වැටුණේ ඒ මත පතිත වූ හිම පතනයේ බරට. එය වසා ගත් හිම තට්ටුවේ බර ටොන් එක් ලක්ෂ විසි දහසක්.



බ්‍රිතාන්‍යයේ ඔටුන්න හිමි චාල්ස් කුමරුන් සහ කැමිලා පාකර් අතර විවාහය ද දරා ඇති බවට යි මාධ්‍ය වාර්තා පළ වන්නේ.

නිතර නිතර ම චාල්ස්ගෙන් බැහැර වී ගොස් තම කලින් විවාහයේ දරුවන් සමග සති ගණන් කල් ගත කිරීම ගැන චාල්ස් නොසතුටට පත් ව සිටීම ද දෙදනා අතර මතභේදවලට එක් ප්‍රධාන හේතුවක්ලු.

මේ ද දෙදනාගේ විරසකය පිළිබඳ ව 90 හැවිරිදි දෙ වැනි එළිසබෙත් මහ රැජින මහත් කනස්සල්ලට පත් ව ඇති බව යි මාධ්‍ය පවසන්නේ.



අමෙරිකාව සැලැකෙන්නේ සමාජ නිදහස පිළිබඳ මුදුන් මල්කඩ ලෙස. නිදහසේ ගිනි අවි භාවිතයට ද ඒ නිසා ලැබී තිබෙන්නේ නිදහස. එහෙත් එහි ප්‍රතිඵලය නම් ජීවිත අනාරක්ෂිත බව. සී.එන්.එන්. සමීක්ෂණයකින් හෙළි වී ඇත්තේ 2001 සිට 2013 දක්වා ගිනි අවි නිසා 406496ක් දෙනාට අකාලයේ සිය ජීවිත අහිමි වී ඇති බව.

ජනවාරි 05 වැනි දා සී.එන්.එන්. රූපවාහිනියේ පැවැති "ගන්ස් ඔෆ් අමෙරිකා" නම් වැඩසටහනට සහභාගි වී අදහස් ප්‍රකාශ කරද්දී ජනාධිපති බැරක් ඔබාමාගේ දෙනෙත්වලින් රූරා වැටුණේ උණු කඳුළු කැට. එය තුවක්කුකරුවන්ගේ නිදහස නිසා මිය ගිය අය වෙනුවෙන් ද වන්නට පුළුවන්. නැතහොත් තුවක්කු සංස්කෘතියට තිත තැබීමට තමා අසමත් වූ බව ඒ මොහොතේ සිහියට නැංවුණු නිසා වන්නටත් පුළුවන්.



කාලගුණික හා ස්වාභාවික වෙනත් විපත්වලට අමතර ව උස් මහල් ගොඩනැගිලි හදිසියේ ගිනි ගැනීම ද ජනතාව අත්විඳින ඛේදවාචකයක්. ඉරානයේ පැරැණි ම ගොඩනැගිල්ලක් වන මහල් 17කින් යුත් ප්ලාස්කෝ ටවර් 2017 ජනවාරි 19 වැනි දා මුහුණ දුන්නේ ඒ ශෝචනීය ඉරණමට. ඉහළ ම මහලේ ඇති වූ ගින්න වේගයෙන් පැතිර ගියේ ඒ ගොඩනැගිල්ලේ පවත්වා ගෙන ගිය ඇඟලුම් කර්මාන්තයට අයත් රෙදි තොගවලට ගිනි ඇවිලීමෙන්.

පැය කිහිපයක් ඇතුළත මුළු ගොඩනැගිල්ල ම පත් වුණේ එක ම ගිනි ජාලාවක් බවට. ක්ෂණයකින් මුළු ගොඩනැගිල්ල ම බිමට සමතලා වුණේ සැප්තැම්බර් 11 වැනි දා නිව්යෝර්ක් වෙළෙඳ ගොඩනැගිල්ල ගින්නෙන් කඩා වැටුණු අයුරු සිහි ගන්වමින්.

දෙසතිය
පුවත් සඟරාව
50/-
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක්